# HARTI



# වාර්ෂික වාර්තාව

## 2015

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
අංක 114, විජේරාම මාවත
කොළඹ 07.

2017 ජනවාරි 20 දින

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා
කෘෂිකර්ම අමාත්‍යාංශය
ගොවිජන මන්දිරය
80/5, රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

**වාර්ෂික පාලන වාර්තාව හා විගණනය කරනලද ගිණුම්**

1972 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පාලක මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් ලේඛන මේ සමඟ ඉදිරිපත් කරමි.

1. වාර්ෂික පාලන වාර්තාව
2. ආදායම් සහ වියදම් විගණන වාර්තාව
3. විගණනය කරන ලද ශේෂ පත්‍රය
4. ගිණුම් සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නිරීක්ෂණ
5. විගණකාධිපතිගේ නිරීක්ෂණ සඳහා පිළිතුරු වාර්තාව

**සභාපති**
**පාලක මණ්ඩල**

## පටුන

| | පිටු අංක |
|---|---|
| සංස්ථාපනය | 1-2 |
| පාලක මණ්ඩලය | 3-6 |
| සංක්ෂිප්තය | 7-8 |
| කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය | 9-16 |
| කෘෂි සම්පත් කළමනාකරණ අංශය | 17-18 |
| පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශය | 19-22 |
| අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය | 23-32 |
| මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය | 33-40 |
| වෙනත් ක්‍රියාකාරකම් | 41-42 |
| සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය | 43-45 |
| පුස්තකාලය | 46-47 |
| ප්‍රකාශන ඒකකය | 48 |
| 2015 දෙසැම්බර් 31 වෙනි දිනට කාර්ය මණ්ඩලයේ තත්ත්වය/ස්වභාවය | 49-52 |
| ගිණුම් | 53-64 |
| විගණකාධිපතිගේ වාර්තාව 14 ( 2C ) | 65-74 |
| විගණකාධිපතිගේ වාර්තාව 14(2C)- පිළිතුරු | 75-84 |

## සංස්ථාපනය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 1972 අංක 05 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ 1972 වසරේ ස්ථාපිත කර ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාවස්ථාපිත ආයතනයක් ලෙස එය ක්‍රියාත්මක වේ. ප්‍රතිපත්ති කේන්ද්‍රීමය පර්යේෂණ දිරි ගැන්වීම සහ කෘෂිකාර්මික හා ග්‍රාමීය ක්ෂේත්‍රයන්හි පුහුණු අවශ්‍යතා සැපිරීම මෙම ආයතනය පිහිටුවීමේ මූලික අරමුණු වේ. මෙරට කෘෂිකාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු ලෙස 1972 සිට මේ දක්වා වසර 43 කට අධික කාලයක් තිස්සේ සමාජ ආර්ථික පර්යේෂණ හා පුහුණු කිරීම් සිදු කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රෙය් සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම පිණිස තොරතුරු සැපයීමෙන් ලද අත්දැකීම්වලින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පොහොසත්ය.

කාර්යභාරය

01. ගොවි කටයුතු පර්යේෂණ පෝෂණය කිරීම හා උනන්දු කරවීම, ඒවාට සහායවීම සහ සහයෝගය දීම.

02. රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, මහජන සංස්ථා සහ සෙසු ආයතන මඟින් කෙරෙන ගොවි කටයුතු පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.

03. කෘෂිකර්මය සංවර්ධනයට බලපාන ආයතනික සාධක හා සම්බන්ධ කරුණු සමීක්ෂණය කිරීම හා ඒවා ගැන පර්යේෂණ පැවැත්වීම.

04. කෘෂිකර්මය සඳහා අවශ්‍ය ඉඩම් ආර්ථිකශීලීව පරිහරණය කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණ පැවැත්වීම සහ පර්යේෂණයෙහි යෙදීම.

05. කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධනයට අදාළ සමාජ-ආර්ථික පර්යේෂණ පැවැත්වීම.

06. ශ්‍රී ලාංකික හෝ විදේශීය ආයතන සම්බන්ධ කර ගෙන හෝ තනිවම හෝ ගොවිකටයුතු පර්යේෂණවලට අදාළ පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හෝ ඒවාට පහසුකම් සකසා දීම. ඊට අදාළ ඩිප්ලෝමා උපාධි සහතික ත්‍යාග සහ සම්මාන සහතික පිරිනැමීම.

07. ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමට අදාළ සාකච්ඡා සහ සම්මන්ත්‍රණ පැවැත්වීමත්, ඊට අදාළ වාර ප්‍රකාශන සහ සඟරා ප්‍රකාශනය කිරීම.

08. කෘෂිකර්මාන්තයට අදාළ කලාපීය ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා ආසියානු කලාපයේ රටවල් සමඟ සහයෝගයෙන් ගොවිජන ව්‍යුහයට සම්බන්ධ ගැටලුවලට අදාළ පර්යේෂණ සිදු කිරීම සහ කෘෂිකාර්මික ගැටලුවලට අදාළ තොරතුරු රැස් කිරීම සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## දැක්ම

**ගොවිජන හා ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදා හැරීමේ ප්‍රමුඛයා බවට පත් වීම**

## මෙහෙවර

පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් තුළින් ගොවිජන හා ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම

## ඉලක්ක

1. සමාජ ආර්ථික පර්යේෂණ හා කෘෂිකාර්මික ගැටලු පිළිබඳ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත් වීම

2. රජයේ සැලසුම් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ව්‍යාපාරික සහ පර්යේෂණ ප්‍රජාව අතර සමීප සම්බන්ධීකරණය සිදු කිරීම

3. දැනුම ජනනය හා කාලීනව බෙදා හැරීම තුළින් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම.

4. ජාතික ප්‍රතිපත්ති ගැටලු සම්බන්ධයෙන් ස්වාධීනව තක්සේරු ඇගයීම් වාර්තා සම්පාදනය කරමින් ජනතාව දැනුවත් කිරීම

5. කාර්ය මණ්ඩලයේ හැකියාවන් සහ ආයතනයේ දැනුම පදනම පුළුල් කිරීම සඳහා ආයෝජන කිරීම තුළින් සමාජ ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීමේ හැකියාවන් පුළුල් කිරීම

6. පුහුණු කිරීම් තුළින් ග්‍රාමීය සංවර්ධනයට සම්බන්ධ පාර්ශවකරුවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම

## පාලක මණ්ඩලය

| | | |
|---|---|---|
| බී.විජේරත්න මහතා | සභාපති | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ පාලක මණ්ඩලයේ සභාපති |
| ඊ.එම් අභයරත්න මහතා | අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ පුහුණු කිරීමේ ආයතනය (මාර්තු දක්වා) |
| හපුතන්ත්‍රි ධර්මසේන | අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ පුහුණු කිරීමේ ආයතනය (අප්‍රියෙල් සිට) |
| එන්.පී.වී.වී පියතිලක | එම | පාලක මණ්ඩල සාමාජික අතිරේක ලේකම් (පාලන) කෘෂිකර්ම අමාත්‍යාංශය |
| එල්.බී.එස්.බී දයාරත්න | එම | අතිරේක ලේකම් (ඉඩම්) ඉඩම් අමාත්‍යාංශය |
| එම්.ආර්.වී.ආර් මීපුර මහතා | එම | අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය |
| කේ. පියරත්න මිය | එම | අතිරේක ලේකම් (ප්‍රතිසංවිධාන) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| කේ.එන්.කේ සෝමරත්න මිය | එම | අතිරේක ලේකම් (පාලන) වැවිලි කටයුතු අමාත්‍යාංශය |
| එම්.සී ගමගේ මහතා | එම | අධ්‍යක්ෂ<br>සම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය |
| අනෝජා පී.ගුරුගේ මිය | එම | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ජී.එල්.ඩී දහනායක මිය | එම | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන)<br>ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය (මාර්තු සිට) |
| ආචාර්ය වයි.එම් ඉන්ද්‍රරත්න මිය | එම | අතිරේක ලේකම්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව |
| මහාචාර්ය කේ. සමරසිංහ | එම | පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ආර්.ආර්.ඒ.විජේකෝන් මහතා | එම | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල් |

| | | |
|---|---|---|
| **ආර්.පී.ආර් රාජපක්ෂ මහතා** | **එම** | **ඉඩම් කොමසාරිස් ජෙනරාල්** |
| **එම්.ජේ.එස් වීරසිංහ මහතා** | **එම** | **ගොවිජන සංවර්ධන අධ්‍යක්ෂ ජෙනරාල්** |
| **ඉංජිනේරු වයි.අබ්දුල් මජීඩ් මහතා** | **එම** | **වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල්** |
| **උපුල් ශාන්ත ද අල්විස් මහතා** | **එම** | **සමූපකාර සංවර්ධන අධ්‍යක්ෂ ජෙනරාල් සහ සමූපකාර සමිති ලේඛකාධිකාරී (නොවැම්බර් සිට)** |
| ඩී.එන් හෙට්ටිආරච්චි මිය | එම | වැඩ බලන ලේකම් , පාලක මණ්ඩලය (මැයි 11 දක්වා) |
| **ඩී.සී සිරිබද්දන මහතා** | **එම** | **වැඩ බලන ලේකම් , පාලක මණ්ඩලය (මැයි 12 සිට)** |

## පාලක මණ්ඩල රැස්වීම්

| රැස්වීම පැවැත් වූ දින | සහභාගී වූ සාමාජික සංඛ්‍යාව |
|---|---|
| 1. 2015 මාර්තු 31 | 09 |
| 2. 2015 ජුනි 05 | 10 |
| 3. 2015 ජූලි 29 | 10 |
| 4. 2015 දෙසැම්බර් 22 | 10 |

## විගණන සහ කළමනාකරණ කමිටුව

| | | | |
|---|---|---|---|
| 1. | එම්.ආර්.වී.ආර් මීපුර මහතා | සභාපති | අධ්‍යක්ෂ,<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව,මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය |
| 2. | ඒ.එල්.ඒ අසෝක සිරිවර්ධන මහතා | සාමාජික | අතිරේක ලේකම් (පාලන)<br>කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 3. | එම්.සී ගමගේ මහතා | සාමාජික | අධ්‍යක්ෂ,<br>සම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය |
| 4. | එම්.අයි පුෂ්පා හේමමාලි මිය | (නිරීක්ෂක) | විගණන අධිකාරී<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| 5. | එන්.පී.වී.සී පියතිලක | (නිරීක්ෂක) | අතිරේක ලේකම් (පාලන) |
| 6. | කේ.එන්.කේ සෝමරත්න මිය | සාමාජිකා | අතිරේක ලේකම් (පාලන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| 7. | ජී.එච්.අයි වින්දායා මිය (නිරීක්ෂක) | | විගණන අධිකාරී<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| 8. | පී.එල් නාමසේන මහතා | | ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී කෘෂිකර්ම අමාත්‍යාංශය |

## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

| රැස්වීම පැවැත් වූ දින | සහභාගී වූ සාමාජික සංඛ්‍යාව |
| --- | --- |
| 2015.02.01 | 04 |
| 2015.07.13 | 05 |
| 2015.10.21 | 04 |
| 2015.12.28 | 04 |

## සංක්ෂිප්තය

**දළ ජාතික නිෂ්පාදිතයෙන් 10%කටත් ශ්‍රම බලකායෙන් 30%ක ප්‍රමාණයකටත් දායකත්වය ලබා දෙන කෘෂිකර්මාන්තය, තවමත් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස පවතියි. ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අතින් සහ ආනයනික ආහාර වෙනුවෙන් වැය කරන අති විශාල ධනස්කන්ධය අඩු කර ගැනීම සම්බන්ධයෙන් සැලකිලිමත් වීමේ දී කෘෂිකර්මාන්තයේ සංවර්ධනය රජයේ අවධානය නිතැතින් යොමු වන ක්ෂේත්‍රයකි.**

කෘෂිකර්මාන්තය සහ ග්‍රාමීය සංවර්ධනයට අදාළව නව අභියෝගයන් රැසක් මතු වී තිබේ. ඵලදායීතාවය අඩු වීම හෝ ඇණ හිටීම, ලාභය සහ ආදායම අඩු වීම, ඉහළ නිෂ්පාදන පිරිවැය, ශ්‍රම හිඟය, අස්ථාවර වෙළඳපොළ මිල, අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් සිදු වන හදිසි බෝග හානිය සහ විධිමත් ව්‍යාප්ති උපදෙස් ලබා ගැනීමේ ඇති දුෂ්කරතාවය එවැනි ගැටලු අතරින් කිහිපයකි.

**කෘෂිකර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිමත් ප්‍රතිපත්තියක් සකස් කිරීම පිණිස ශක්තිමත් ලෙස ක්‍රියාත්මක වෙමින් ආදායම සහ සේවා නියුක්තියට අදාළ කෘෂිකර්මාන්තය වැඩි දියුණු කිරීමේ අරමුණ ද ඇතිව නව රජය ඉහත කී අභියෝගවලට මුහුණ දීම සඳහා නව උපක්‍රම අනුගමනය කිරීමට අපේක්ෂා කරයි.**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ගොවි කටයුතු සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ වන පෙර සඳහන් කළ ආකාරයේ ගැඹුරින් විශ්ලේෂණය කළ යුතු අභියෝග පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ප්‍රතිපත්ති කේන්ද්‍රීය පර්යේෂණ සිදු කරන ආයතනයකි. ඊට අමතරව, කෘෂිකර්ම අමාත්‍යාංශ විසින් දියත් කරන සංවර්ධන ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ඇගයීම පිණිස අධ්‍යයන රැසක් සිදු කරමින් සිටින අතර ඒ හරහා එම වැඩසටහන් වැඩි දියුණු කිරීම පිණිස වන මාර්ගෝපදේශ ලබා දීම සිදුවේ.**

අමාත්‍යාංශයේ ප්‍රමුඛතා ඉල්ලීම් සැලකිල්ලට ගෙන සලකා බලන වර්ෂය තුළ පර්යේෂණ අධ්‍යයන 16ක් සහ පුහුණු වැඩසටහන් 84ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි.මෙම ඇගයුම් අධ්‍යයනවලින් දෙකක් අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන්වලට අදාළ ඒවා වන අතර ඉන් එකක් රජය විසින් දියත් කළ *'අවාරය අභවරයි'* ගෙවතු වගා වැඩසටහන සම්බන්ධයෙන් වූ අතර වාණිජ ගොවිපොළ වැඩසටහන ඇගයීම සහ තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන ඇගයීම ද මේ අතර විය.

අනෙක් අධ්‍යයනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවාරයේ ලොකු ලූනු නිෂ්පාදන වැඩසටහන සම්බන්ධයෙන්ය. වී වගා ක්ෂේත්‍රයෙහි ශ්‍රම උපයෝජනය කෙරෙහි යාන්ත්‍රීකරණයේ බලපෑම පිළිබඳ අධ්‍යයනය, වර්ෂාපෝෂිත ගොවීන්ට නියං තත්ත්වයන්හි බලපෑම සහ වී නිෂ්පාදනයේ දී කෘමිනාශක ද්‍රව්‍ය භාවිතය වැනි අධ්‍යයනයන් මතු වෙමින් පවතින කාලීන ගැටලු සම්බන්ධයෙන් වූ ඒවාය. වෙනත් අමාත්‍යාංශ සහ ආයතන විසින් කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵල වශයෙන් සිදු කරන ලද අධ්‍යයනයන් ද ඇත.

සමෘද්ධි වැඩසටහනෙහි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන පිළිබඳව වූ අධ්‍යයනය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් සිදු කළ එකක් වන අතර අනෙක් අධ්‍යයන දෙක (මල් වගාකරුවන් සම්බන්ධයෙන් සහ කුටුම්භ ආදායම වැඩි කිරීමේ මාර්ග සම්බන්ධ අධ්‍යයනය) නුවරඑළිය සහ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙනුවෙන් සිදු කරන ලද ඒවාය. මතභේදයට තුඩු දී ඇති දුම්කොළ වගා කිරීම පිළිබඳ ව වූ එක් අධ්‍යයනයක් ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි සිදු කරන ලද්දකි.

සැලසුම් කළ පුහුණු වැඩසටහන් 84න් 59ක් සාර්ථක ලෙස පවත්වන ලදී. නිධන්ගත වකුගඩු රෝගය පවතින ප්‍රදේශවල ගොවීන්ට සෞඛ්‍ය තත්ත්වය නිසි පරිදි පවත්වා ගැනීම සහ පාරිසරික සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳව දැනුවත් කිරීම වෙනුවෙන් විශේෂයෙන් සැලසුම් කළ 'නිරෝගී පරපුරක් සඳහා කෘෂිකර්මාන්තය' නම් නව වැඩසටහනක් ආරම්භ කරනු ලැබිණි. මෙම යටතේ පුහුණු වැඩසටහන් 39ක් පවත්වන ලදී. වැඩසටහන පිළිබඳව ප්‍රජාවගේ දැනුවත්භාවය ඇති කිරීම පිණිස පුහුණු වැඩසටහන අළලා වීඩියෝ පටයක් ද නිර්මාණය කරන ලදී.

හපුතන්ත්‍රි ධර්මසේන

අධ්‍යක්ෂ

## කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය

අවසන් කළ අධ්‍යයන

1. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් අවාරයේ දී එළවළු නිෂ්පාදනය කිරීම සඳහා දියත් කළ 'අවාරය අභවරයි' වැඩසටහන ඇගයීම

පර්යේෂණ කණ්ඩායම : ආචාර්ය ඩබ්.ඒ.ආර් වික්‍රමසිංහ සම්බන්ධීකරණ නිලධාරී

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු :

'අවාරය අභවරයි' යනු කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එළවළු හිඟ අවාරයේ මැයි, ජූනි සහ ජූලි මාසවල එළවළු නිෂ්පාදනය දිරිගැන්වීමේ අරමුණින් ආරම්භ කළ නියමු ව්‍යාපෘතියකි. ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා වැඩසටහන ක්‍රියාත්මක වූ අතර කෘෂිකාර්මික පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් බිම් මට්ටමේ නිලධාරීන් ලෙස ඒ සඳහා දායක වූහ. එළවළු පැළ සැපයීමට කෘෂිකර්ම උපදේශකයින්ගේ දායකත්වය ලබා ගැනුණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස දායක වූ ප්‍රධාන ආයතනයන්ය. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී සෑම කෘෂිකාර්මික පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයෙක් විසින් ම ප්‍රතිලාභීන් 50 දෙනෙකු සඳහා එළවළු පැළ 50ක් සැපයීම අපේක්ෂා විය. සෑම ප්‍රතිලාභියෙකුටම වර්ග හතකින් යුතු එළවළු පැළ 30ක් සැපයිණි. ප්‍රතිලාභීන්ට සැපයූ බඳුන් ගත එළවළු පැළ 30 අතරට අමු මිරිස් පැළ 06ක්, මාළු මිරිස් පැළ 06ක්, වම්බටු පැළ 06ක්, තක්කාලි පැළ 06ක්, කරවිල පැළ 02ක් , දඹල පැළ 02ක් සහ පිපිඤ්ඤා පැළ 02ක් ඇතුළත් විය. පැළ 30ක් රුපියල් 150ක මිලකට ප්‍රතිලාභීන් ට අලෙවි කෙරුණු අතර ප්‍රතිලාභීන් විසින් මුදල් ගෙවා පැළ මිල දී ගනු ලැබිණි.

වර්තමාන වැඩසටහන වැඩි දියුණු කිරීම සඳහා සහ අනාගත වැඩසටහන ක්‍රමවත් කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ සාර්ථකත්වය, අසාර්ථකත්වය සහ අඩුපාඩු හඳුනා ගත යුතුය. එහි දී සුවිශේෂී අරමුණු තුනක් හඳුනා ගැනිණි. ඒවා නම්,

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, මෙම වැඩසටහනෙන් ප්‍රතිලාභීන්ට ඇති බලපෑම තක්සේරු කිරීම සහ වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රතිලාභීන්ගේ එකඟතාවය අවබෝධ කර ගැනීම එම අරමුණු වෙයි.

සොයා ගැනීම්

පැළ කිරීම සඳහා භාවිතා කළ බීජ වර්ග තත්ත්වයෙන් බාල ඒවා වූ බැවින් පැළ හොඳ තත්ත්වයේ නොපැවති බව ප්‍රාදේශීය නිලධාරීහු 75%කට වඩා පැවසූහ. කරවිල, දඹල සහ පිපිඤ්ඤා වැනි වැල් යන බෝග බඳුන් ගත පැළ ලෙස තිබූ බැවින් වැඩියෙන් වැවී තිබූ පැළ ප්‍රතිලාභීන්ගේ නිවාස වෙත ප්‍රවාහනය කිරීමේ දී හානි වී තිබුණි. ඉබ්බාගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් පැවසූ ආකාරයට පැළ සිටුවීම සඳහා භාවිතා කළ බඳුන් ගත මාධ්‍යය අත්‍යාවශ්‍ය පෝෂකවලින් යුක්ත වී නොතිබුණි. එබැවින් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ප්‍රවාහනය කළ සැණින් පැළ දුර්වල වී මිය ගොස් තිබුණි.

කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් තමන්ගේ වසම්වලින් ප්‍රතිලාභීන් තෝරා ගෙන ඔවුන්ට පැළ විකුණා තිබුණි. පැළ සඳහා ගෙවීමක් කළ යුතු වන බැවින් ඒවා මිල දී ගැනීමට ජනතාව මැළිකමක් දක්වති. එබැවින්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් විසින් තමන්ට හිතවත් ගොවීන්

ප්‍රතිලාභීන් ලෙස තෝරාගෙන තිබුණි. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් බොහොමයකට පැළ කට්ටලයේ වටිනාකමින් කොටසක් හෝ සම්පූර්ණ වටිනාකම ගෙවීමට සිදු වී තිබුණි. වැඩසටහන සියලුම දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද සමහර ගොවිජන සේවා මධ්‍යස්ථානවලට පැළ සපයා නොතිබුණි. සමහර ප්‍රදේශවල විශේෂයෙන්ම උතුරු පළාතේ , වාණිජ මට්ටමමින් එළවළු වගා කරන ගොවීන්ට එළවළු පැළ ලබා දී තිබුණි.

මෙම ගෙවතු වගා වැඩසටහන සැලසුම් කර තිබුණේ බිම් මට්ටමින් කටයුතු කරන නිලධාරීන්ගේ අදහස් සැලකිල්ලට නොගෙනය. මීට පෙර ක්‍රියාත්මක කරන ලද ගෙවතු වගා වැඩසටහන් සමඟ සැලකීමේ දී ඒවායේ රෝපණ ද්‍රව්‍ය නොමිලයේ ලබා දී තිබුණි. එබැවින් බලධාරීන් විසින් ලබා දී තිබූ ඕනෑම දෙයක් ජනතාව භාර ගත්හ. මීට පෙර දියත් කළ ගෙවතු වගා වැඩසටහන් ඇගයීමේ අධ්‍යයනයන්ට අනුව ඒවායින් සැලකිය යුතු සාර්ථකත්වයක් වාර්තා වී නැත. මෙම වැඩසටහන සාර්ථක නොවීමට හේතු වූයේ මේ තුළින් ප්‍රතිලාභීන්ගේ කුටුම්භයන්ට සිදු වූ බලපෑම නොගිණිය හැකි තරම් වීමයි. එබැවින් බහුතරයක් ප්‍රතිලාභීන් මෙම වැඩසටහන එතරම් වැදගත් යැයි නොසිතන අතර ස්වකීය කුටුම්භයන්හි ආර්ථිකයට එය සැලකිය යුතු බලපෑමක් කර ඇතැයි ද නොසිතති. මෙම වැඩසටහනේ සමස්ත ප්‍රගතිය සලකා බැලුවහොත් එය සාර්ථක නැත. මෙම වැඩසටහනෙන් ප්‍රතිලාභයක් ලැබූ සමහර ප්‍රතිලාභීන් බොහොමයක් වාණිජ මට්ටමෙන් එළවළු වගා කළ ගොවීන් සහ ගෙවතු වගාව කෙරෙහි උනන්දුවක් දැක් වූ අය වූහ. අවාරය අහවරයි වැඩසටහන තමන්ට වැදගත් නැති බව ගොවීහු නොසිතති. කෙසේ නමුත්, තමන්ගේ පරිභෝජනය සඳහා බෝග වගා කිරීමට උනන්දුවක් දක්වන ජනතාව කිසිදු වැඩසටහනකින් සපයන අනුබලයකින් තොරවම බෝග වගා කරති. ගෙවතු වගා වැඩසටහනක් සැලසුම් කිරීමේ දී එළවළු වගා කිරීම සඳහා ස්වයං අභිප්‍රේරණයක් සහිත පුද්ගලයින් තෝරා ගෙන ඔවුන්ට සහයෝගය ලබා දිය යුතුය.

නිර්දේශ :

එළවළු වගා කිරීම පිණිස අභිප්‍රේරණයක් සහිත අයගේ ගෙවතු වගාවන් අසල්වැසියන්ට සහ අනෙකුත් පුද්ගලයින්ට ආදර්ශ ගෙවතු වගා ලෙස භාවිතා කළ යුතුය. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ට අනුව සෑම ගමකම එවැනි ස්වයං අභිප්‍රේරණයක් සහිත මිනිසුන් සිටියි.

2. මහවැලි ප්‍රදේශයන්හි ගොවිපළ නොවන රැකියාවන්හි වර්තමාන තත්ත්වය සහ අනාගත විභවතා

පර්යේෂණ කණ්ඩායම : ආචාර්ය. ඩබ්. ඒ. වික්‍රමසිංහ සම්බන්ධීකරණ නිලධාරී

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු :

දෙවන සහ තුන්වන පරම්පරාවලින් පසුව මහවැලි ජනාවාස කලාපයන්හි යම් යම් සමාජ ආර්ථික ගැටලු මතුවෙමින් පවතින බව දක්නට ලැබේ. මහවැලි වැඩසටහන යටතේ ලබා ගත් ඉඩම් ඒවායෙහි පදිංචිකරුවන්ට සිය මතු පරපුරට කුඩා කොටස් ලෙස කඩා නීත්‍යානුකූලව බෙදිය නොහැකි වුවත්, ඔවුන් විසින් මුල් ඉඩම් කොටස් ඔවුන්ගෙන් පැවතෙන්නන්ට වගා කළ හැකි වන ලෙසට අවිධිමත් ලෙස කුඩා කොටස්වලට බෙදා තිබේ. එබැවින්, මහවැලි ප්‍රදේශයන්හි ඉඩම් කැබලිකරණය රහසේ සිදු වෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම මට්ටම පහළ යන අතර එය ජීවත්වීම සඳහා ප්‍රමාණවත් නොවේ.

නමුත් මහවැලි ප්‍රදේශයන්හි ජීවත්වන ජනතාව ඔවුන් විසින් මුහුණ දෙන ජීවනෝපාය ගැටලු කෙසේ හෝ කළමනාකරණය කර ගැනීමට තව දුරටත් සමත් වෙති. කෙසේ නමුත්, මෙම ප්‍රවණතාව තවදුරටත් පැවතියහොත් මහවැලි කලාපය රටේ සංවර්ධනයට දායක වනු වෙනුවට රටේ දිළිඳුකම ඇති කරන්නට හේතු වනු ඇත. මේ අනුව, යම් දිනෙක මහවැලි ව්‍යාපාරයට ස්වකීය පදිංචිකරුවන්ට ජීවත්වීම සඳහා අවස්ථාවන් සැපයීමට නොහැකි වුවහොත් මහවැලි පදිංචිකරුවන් වඩා හොඳ රැකියා අවස්ථා සොයා ප්‍රධාන නගරවලට ඇදෙනු ඇත. මීට අමතරව, මහවැලි ජනපද ව්‍යාපාරයන්හි වැඩිවන ජනගහනයට ජීවනෝපාය මාර්ග සැපයීමේ හැකියාව සීමිත වීම හේතු කොට ගෙන අනාගත පරම්පරාවට එහි සංවර්ධන

ක්‍රියාවලියට දායක වීමෙන් ඇත් වී සිටීමට සිදු වනු ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාවගේ සංවර්ධන විභවතා ඉහළ දැමීමට ඇති හැකියා ශක්තිමත් කිරීමේ අවස්ථා සීමා කරනු ඇත (සෙන්, 1999).

මහවැලි පදිංචිකරුවන්ට ස්වකීය ජීවනෝපාය සකස් කර ගැනීම සඳහා මහවැලි සංවර්ධන ව්‍යාපාරයට කෙතරම් දුරකට සහය විය හැකි ද යන ගැටලුව පැන නඟී. මහවැලි ගොවීන් සතුව වර්තමානයේ පවතින ජීවනෝපාය මාර්ග, මෙම ජීවනෝපාය මාර්ගයන්හි තිරසාරභාවය සහ අනාගතයේ දී රැකියා අවස්ථා සැපයීම සඳහා මහවැලි ව්‍යාපාරයට ඇති හැකියාව වැනි තොරතුරු සංවර්ධන සැලසුම් සහ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී වැදගත් වේ.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වන්නේ මහවැලි ජනපද ව්‍යාපාරයන්හි වර්තමාන රැකියා අවස්ථා, ඒවායෙහි තිරසාරභාවය සහ මහවැලි ප්‍රදේශයන්හි ගොවිපළ නොවන රැකියා අවස්ථා පුළුල් කිරීම සඳහා ඇති විභවතාවය ආදිය විමර්ශනය කිරීමයි.

(i) මහවැලි ප්‍රදේශයන්හි වර්තමානයේ පවතින රැකියා ප්‍රමාණය සහ රැකියා වර්ග හඳුනා ගැනීම.
(ii) මහවැලි ප්‍රදේශයන්හි ආදායම් මාර්ග උත්පාදනයට සහ කුටුම්භ ආදායමට ගොවිපොළ නොවන ක්ෂේත්‍රයේ දායකත්වය තක්සේරු කිරීම
(iii) මහවැලි ප්‍රදේශයන්හි ගොවිපළ නොවන රැකියා අවස්ථා සඳහා ජනපදිකයින්ගේ කුටුම්භවල දායකත්වය කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම.
(iv) මහවැලි ප්‍රදේශයන්හි ගොවිපළ නොවන රැකියා අවස්ථා පුළුල් කිරීම සඳහා පවතින විභවතා සහ බාධක විමර්ශනය කිරීම

සොයා ගැනීම්

ඉඩම් හිමිකම උරුමකරුවන්ට පැවරීමේ නීතිමය විධිවිධානය හැරුණු විට මහවැලි ප්‍රදේශ ද රටේ අනෙකුත් ප්‍රදේශ හා සමානය. මෙම ප්‍රතිපත්තිය හේතුවෙන් සමහර ප්‍රතිලාභී කුටුම්භයන්හි විවිධ සමාජයීය ගැටලු මතු වී ඇති හෙයින් වඩාත් යහපත් විසඳුමක් කරා මෙම ප්‍රතිපත්තිය වෙනස් විය යුතුය.

කුටුම්භයන්ට පවතින ගොවිපළ නොවන රැකියා අවස්ථා අනෙකුත් ප්‍රදේශයන්ට මෙන්ම මහවැලි ප්‍රදේශයන්ට ද සමානය. අනාගත පරම්පරාවලින් මහවැලි ජනපදය ජනාකීර්ණ වීමත් සමඟ ඔවුන්ගේ ජීවිකාවන් සඳහා අවශ්‍ය වන සම්පත් හිඟ වීම අනෙක් ගැටලුවයි. මෙය මහවැලි අධිකාරිය යටතේ නැති ප්‍රදේශවලට ද පොදුය. ආසියාව, අප්‍රිකාව සහ ලතින් ඇමරිකාව වැනි ඌන සංවර්ධිත රටවල කාර්මික අංශයේ සංවර්ධනයක් දැකිය නොහැකිය (හුසේයින්, 2012). මහවැලි ජනපදයන් සම්බන්ධයෙන් ද සලකා බැලීමේ දී කෘෂිකාර්මික සංවර්ධනය සිදු වී ඇත්තේ මහවැලි ප්‍රදේශවල වැඩි වෙමින් පවතින ශ්‍රම සැපයුම අවශෝෂණය කර ගැනීමට හැකි වන කාර්මික හෝ ගොවිපළ නොවන ක්ෂේත්‍රයේ පුළුල් වීමකින් තොරව බව පෙනී යයි.

ගොවිපළ නොවන ක්ෂේත්‍රයන්හි වර්ධනය විශේෂයෙන් මහවැලි ප්‍රෙද්ශයන්ට පමණක් අදාළ නොවන අතර එය රටේ සමස්ත ආර්ථිකය හා බැඳී පවතී. මහවැලි ප්‍රදේශයන්හි සමහර පවුල්වල අයට තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට හැකි වී තිබෙන අතර එම දරුවෝ වෙනත් ප්‍රදේශවල ගොවිපළ නොවන රැකියාවන්හි නිරතව සිටිති. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ආරම්භ කර දැනට වසර 30ක් පමණ ගත වී ඇති අතර මහවැලි අධිකාරියේ සේවය කරන නිලධාරීන් මහවැලි ප්‍රදේශවල ප්‍රතිලාභී පවුල්වලට අයත් අය නොවේ. බොහොමයක් මහවැලි කලාප ශ්‍රී ලංකාවේ ඓතිහාසික නගරවලට මායිම්ව පිහිටා තිබේ. උදාහරණ ලෙස මහවැලි බී, සී සහ ජී කලාප පොළොන්නරුව, සීගිරිය සහ මහියංගනය නගරවලට ආසන්නව ද මහවැලි එච් කලාපය අනුරාධපුරයට ද වලව කලාපය කතරගමට ආසන්නව ද පිහිටා තිබේ. සියලු කලාපයන්ට මහා මාර්ග, ජල සැපයුම සහ විදුලිය ඇතුළු පහසුකම් හොඳින් ඇත.

නිර්දේශ

මහවැලි කලාපයන්හි ගොවිපළ නොවන රැකියා අවස්ථා නිර්මාණය කිරීමට පමණක් නොව ප්‍රතිලාභී පවුල්වල දරුවන්ට වෙනත් ප්‍රදේශයන්හි රැකියා අවස්ථා සොයා ගැනීමට හැකි වන පරිදි ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ දැමීමට අවශ්‍ය පහසුකම් සැපයීමට ද අවධානය යොමු විය යුතුය. තවද මෙම ප්‍රදේශ සංචාරක කර්මාන්තය සඳහා ද විභවතාවයක් පවතී. ස්වකීය සංචාරක පැකේජයන්ට කෘෂි සංචාරක ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට හෝටල් ක්ෂේත්‍රය උනන්දු කිරීමට ද හැකිය.

3. ශ්‍රී ලංකාවේ කුළු බඩු ක්ෂේත්‍රයේ ගැටලු සහ විභවතා

පර්යේෂණ කණ්ඩායම : ආර්.එල්.එන් ජයතිස්ස - සම්බන්ධීකරණ නිලධාරී

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය හා අරමුණු

ශ්‍රී ලංකාව විශාල පරාසයක කුළු බඩු බෝග නිෂ්පාදනය කරයි. ගම්මිරිස්, කුරුඳු, එනසාල්,කරාබු නැටි, සාදික්කා සහ වසාවාසි ඒ අතර ප්‍රධාන වෙයි. මෙම නිෂ්පාදනවලින් 90%ක්ම ප්‍රධාන අවසන් පාරිභෝගිකයින්ට එනම් ආහාර රස ගැන්වීමට, සුගන්ධය සහ ඖෂධ වර්ග නිෂ්පාදනයට යොදා ගැනීම පිණිස අපනයනය කෙරේ.

කෙසේ නමුත්, ගම්මිරිස් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව ලෝකයේ ගම්මිරිස් නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් අතුරින් එකකි. වර්තමානයේ මෙරට ගම්මිරිස් වගා කරන භූමි ප්‍රමාණය හෙක්ටයාර 30,000කට වඩා වැඩිය. වෙනත් කුළු බඩු බෝග හා සැසඳීමේ දී කර්මාන්තයක් ලෙස ශ්‍රී ලංකාව තුළ ගම්මිරිස් වගාව වැඩි දියුණු කිරීමේ විශාල විභවතාවයක් තිබේ. ගම්මිරිස් කර්මාන්තය විසින් ග්‍රාමීය ගොවි ක්ෂේත්‍රයට මෙන් ම නාගරික ආර්ථිකයට ද අති මහත් සමාජ ආර්ථික ප්‍රතිලාභ රැසක් උදා කර දී තිබේ. කෙසේ නමුත්, මෙම ක්ෂේත්‍රය ආශ්‍රිතව ගැටලු සහ බාධක රැසක් ද පවතී. ගම්මිරිස් උපක්ෂේත්‍රය ආශ්‍රිතව පවතින එකී යථාර්ථය අවබෝධ කර ගැනීම පිණිස මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ගම්මිරිස් ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය, බෝග වගාව පිළිබඳ කොරතුරු වන භූමි ප්‍රමාණය, වගා ක්‍රම යනාදිය විමර්ශනය කිරීමට සිදු වන බැවින් ගොවීන් මෙම අධ්‍යයනයේ විෂයපථය පුළුල්ය. ගොවීන් විසින් මුහුණ දෙන බෝග නඩත්තුව, අලෙවිය සහ අලෙවි නාලිකා ගැටලු ආදිය මෙන්ම එම ගැටලු විසඳීම සඳහා ගොවීන්ගේ විසින් යෝජනා කරන පිළියම් ආදිය ද මෙම අධ්‍යයනය මඟින් විමරශනය කෙරේ.

අධ්‍යයනයේ ප්‍රධාන සොයා ගැනීම්

- අක්‍රමවත් බෝග කළමනාකරණයක් පැවතීම අධ්‍යනයේ දී නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් අඩු ඵලදායීත්වය සහ අඩු ආදායමක් දැකිය හැකි විය.
- ගම්මිරිස් නිෂ්පාදනය උච්චාවචනය වීමට ප්‍රධාන හේතුවක් වන්නේ පාරිසරික බලපෑමය. බොහොමටක් ගොවීන්ට ගැටලුවලට සාර්ථක ලෙස මුහුණ දෙන්නේ කෙසේද යන්න පිළිබඳව හොඳ අවබෝධයක් නැත.
- දේශගුණික විපර්යාසයන් පිළිබඳව ගොවීන්ට හොඳ අවබෝධයක් නොමැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස බෝග නිෂ්පාදනය අඩු වී ගොවීහු දුෂ්කරතාවයන්ට මුහුණු දෙති.
- මෙම ක්ෂේත්‍රයේ ගොවීන් බහුතරයක් වයස අවුරුදු 50ට වැඩි කාණ්ඩයට අයත් වන අතර එබැවින් අනාගතයේ දී බරපතළ ශ්‍රම හිඟයකට මුහුණ දෙනු ඇත.
- අස්වනු නෙළන සමයේ මහා පරිමාණයෙන් නිෂ්පාදන සිදු වුවද අපනයනය කිරීමට පෙර අගය එකතු කිරීම් කිසිවක් සිදු නොකෙරේ.

- ග්‍රාමීය මට්ටමේ නිෂ්පාදනය සංවිධිත වෙළඳපොළට ප්‍රමාණවත් තරම් නොවන අතර මේ වන විට කතිපයාධිකාරී වෙළඳපොළ තත්ත්වයක් මේ වන විට දැකිය හැකිය.
- ගම්මිරිස් ආශ්‍රිත කර්මාන්තයන්හි අගය එකතු කළ නිෂ්පාදන සම්බන්ධ ප්‍රධාන ගැටලුව වන්නේ පෞද්ගලික ආයෝජන අඩුකමයි.
- කාබනික ක්‍රමයට (Bio product) නිෂ්පාදනය කර ඉහළ මිලක් සහ අනෙකුත් ප්‍රතිලාභ ලබා ගත හැකි වුවත් ගොවීන් ජෛව ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි සාමාජිකයෝ නොවෙති.
- ගම්මිරිස් පදනම් කර ගත් ගොවි සංවිධාන නිෂ්පාදන ප්‍රදේශ ආශ්‍රිතව ස්ථාපිත වී නොමැති බැවින් බෝග කළමනාකරණය, පසු අස්වනු හා අලෙවිය සම්බන්ධ කිසිදු සාමූහික ක්‍රියාමාර්ගයක් දැකිය නොහැකිය.

නිර්දේශ

- නව තාක්ෂණය සහ වගා භාවිතයන් පිළිබඳව ගොවි සමාජයක් පවත්වා ගෙන යාම
- පාංශු සංරක්ෂණ ක්‍රම, පොහොර යෙදීම සහ යහපත් වගා භාවිතාවන් දිරිමත් කිරීම පිණිස අරමුදලක් පිහිටුවීම අවශ්‍යය.
- සහනාධාර වැඩසටහනක් ස්ථාපිත කිරීම මඟින් පෞද්ගලික ක්ෂේත්‍රය කුළුබඩු පදනම් කර ගත් නිෂ්පාදන සිදු කිරීම සඳහා දිරි ගැන්විය යුතුය.
- ජෛව නිෂ්පාදන වගා ක්ෂේත්‍රයට ගොවීන් ආකර්ෂණය කර ගැනීම සඳහා ඔවුන්ව දැනුවත් කිරීම සහ පහසුකම් සැපයීම.

4. යාපනය කලපුවෙන් සපයන පරිසර පද්ධති සේවාවන්හි වටිනාකම සහ අවට ගම්වාසීන්ගේ ජීවනෝපායන්ට කලපුවෙන් සපයන දායකත්වය

පර්යේෂණ කණ්ඩායම : ආචාර්ය ඩබ්.ඒ.ආර් වික්‍රමසිංහ - සම්බන්ධීකරණ නිලධාරී

මූල්‍ය ප්‍රභවය : පරිසර සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (IUCN)

විෂයපථය සහ අරමුණු

පරිසර පද්ධති සේවාවන්හි තිරසාරභාවය තහවුරු කිරීමට සහ ජනතාවගේ ජීවනෝපාය තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා යාපනය කලපුවේ පරිසර පද්ධති කළමනාකරණය අත්‍යවශ්‍ය වේ. මානව කළමනාකරණය (කලපුවෙන් යැපෙන මිනිසුන්) සඳහා වූ සංරචක කලපු කළමනාකරණ සැලැස්මක අඩංගු විය යුතු වේ. එබැවින් කලපුවේ පරිසර පද්ධති කළමනාකරණය කිරීමේ දී ඒකාබද්ධ සහ සාකල්‍ය ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ.

සම්පත් කළමනාකරණ සැලසුමක් නිර්මාණය කිරීමේ පූර්ව අවශ්‍යතාවය වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු සහ දත්ත මත පදනම් වේ. එහිදී දැනට පවතින සම්පත් වර්ග සහ ප්‍රමාණය, සම්පත්වල වටිනාකම, සම්පත් භාවිතා කිරීමේ ශීඝ්‍රතාවය, කලපුව ආශ්‍රිතව ක්‍රියාත්මක වන විවිධ ක්‍රියාකාරකම් (කලපුවේ ප්‍රයෝජන), භාවිතයන්හි තිරසරභාවය, වර්තමාන ක්‍රියාකාරකම්වලින් පරිසර පද්ධතියේ තිරසරභාවයට ඇති බලපෑම සහ සම්පත් පාලන ක්‍රමය යනාදිය ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, දැනට පවතින ලිඛිත තොරතුරුවලට අනුව (අරුද්ප්‍රගාසම්, 1974; හොෆ්මාන්, 1982 සහ 1985; අර්පොවිච්, 1985; පවෙල්, 1984; සචිතානන්දන්, 1969; සචිතානන්දන් සහ පෙරේරා, 1970; සෙල්වරාජා සහ කොස්තා, 1978) කලපු කළමනාකරණ සැලසුමක් සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඉතා සීමිතය

අධ්‍යයනයේ අරමුණ වූයේ කලපු පද්ධතියේ පරිසරි පද්ධති වටිනාකම් ලේඛනගත කිරීම සහ වර්ධනය කිරීම මෙන්ම කලපුවෙන් යැපෙන ප්‍රජාවගේ සමාජ ආර්ථික පැතිකඩ සොයා බැලීමයි.

සොයා ගැනීම් :

යාපනය කලපුවේ පරිසර පද්ධති සේවාවන් ඇස්තමේන්තුගත කරනු ලැබුයේ එම සේවාවන්හි වෙළඳපොළ සහ වෙළඳපොළ නොවන වටිනාකම් යන දෙකම පදනම් කර ගනිමිනි. යාපනය කලපුව විසින් සපයනු ලබන බවට හඳුනාගත් ප්‍රධාන සේවාවන් නම් මත්ස්‍ය නිෂ්පාදනය, ගැඹුරු මුහුදේ මසුන් අල්ලන බෝට්ටු නැංගුරම්ලා තැබීම පිණිස වරාය පහසුකම් සැපයීම සහ කොහු කර්මාන්තය සඳහා කලපුව භාවිතා කිරීමයි. මෙම වටිනාකම් වෙළඳපොළ වටිනාකම් පදනම් කරගෙන ගණනය කිරීමට හැකි විය. මත්ස්‍ය නිෂ්පාදනයේ දී ඇස්තමේන්තුගත වටිනාකමට ඇතුළත් වූයේ නිෂ්පාදන අතිරික්තය පමණි. දෙන ලද කාල පරාසය තුළ කලපුවේ මත්ස්‍ය නිෂ්පාදනයේ පාරිභෝගික අතිරික්තය ඇස්තමේන්තුගත කිරීමේ අපහසුව නිසා, නිෂ්පාදන අතිරික්තය ගණනය කරනු ලැබිණ. එබැවින්, මත්ස්‍ය නිෂ්පාදනයේ වටිනාකම අඩුවෙන් තක්සේරු වී ඇති අතර ඒ හේතුවෙන් මෙම අධ්‍යයනයෙන් ඇස්තමේන්තුගත කරන ලද යාපනය කලපුවේ සමස්ත ආර්ථික වටිනාකම ද අඩුවෙන් තක්සේරු වී ඇත. තවද, කඩොලාන මගින් කාබන් වෙන් කිරීම, කඩොලාන හා මඩ තලා සහ මත්ස්‍ය නිෂ්පාදනය අතර ඇති ජීව විද්‍යාත්මක සම්බන්ධය සහ ජෛව විවිධත්ව කාර්යභාරය පිළිබඳව විද්‍යාත්මක තොරතුර් හිඟ වීම ද යාපනය කලපුවේ පරිසර පද්ධති සේවාවන්හි වටිනාකම අඩුවෙන් තක්සේරු වීමට හේතු වී තිබේ.

බහුතරයක් කලපු ධීවරයින්ගේ ප්‍රධාන ජීවනෝපාය ක්‍රියාකාරකම වනුයේ කලපුවේ මසුන් ඇල්ලීමයි. එබැවින් යාපනය කලපුවේ පරිසර පද්ධති යනු ඒ අවට ගම්වාසීන්ට ඉතාමත් වැදගත් පාරිසරික ස්වභාවික

වත්කම් වේ. බොහොමයක් කලපු ධීවරයෝ කුටුම්භයෙහි සමස්ත ආදායම වැඩි කර ගැනීම සඳහා අතිරේක ආදායම් මාර්ගවල නිරත වෙති. එහි අදහස වන්නේ කලපුවේ මසුන් ඇල්ලීම පමණක් ජීවත් වීම සඳහා ප්‍රමාණවත් නොවන බවයි.

සිදු කෙරෙමින් පවතින අධ්‍යයන

1. වියළි කලාපයේ ප්‍රධාන වාරියෝජනා ක්‍රමයන්හි වී වගා ක්ෂේත්‍රය යාන්ත්‍රීකරණය කිරීම සහ ජීවනෝපාය කෙරෙහි එහි බලපෑම, නිමැවුම සහ නිෂ්පාදන වියදම

පර්යේෂණ කණ්ඩායම : බී.ඒ.ඩී.එස් බමුණුආරච්චි

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු** :

වී යනු වෙනත් කිසිදු බෝගයකට වඩා වැඩියෙන් ඍජුවම රජයේ මැදිහත්වීම ලබා ගන්නා දේශපාලනික වශයෙන් ඉතා සංවේදී බෝගයක් වන අතර සහ සමස්ත නිෂ්පාදන වියදමෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් ශ්‍රමය සඳහා වැයවෙන ශ්‍රම සූක්ෂම බෝගයක් ලෙස ද ප්‍රචලිතය. සමස්ත ශ්‍රම බලකායෙන් දෙවෙනියට විශාලතම ශ්‍රම බලකායට කෘෂිකර්ම ක්ෂේත්‍රය හිමි කම් කීවද (30% ආසන්න) ශ්‍රම ඵලදායීතාවයේ අඩු මට්ටමක් පෙන්නුම් කරමින් එය සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට කරනු ලබන දායකත්වය 10.8%කි.

තවද, දළ දේශීය නිෂ්පාදිතයට සහල් ක්ෂේත්‍රයේ සාපේක්ෂ දායකත්වය (මහ බැංකුව, 2013) 1.6%ක් පමණක් වන අතර සමස්ත කෘෂිකාර්මික රැකියා නියුක්තික ජනගහනයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් ඍජුවම හෝ වක්‍රව ස්වකීය ජීවනෝපාය සකස් කර ගන්නේ සහල් ක්ෂේත්‍රයෙනි.

සම්පත් උපයෝජනයේ මෙම ආකෘතික ඌනතාවයට විසඳුම් යාන්ත්‍රීකරණය ඉහළ නැංවීමෙන් සහ අමතර ශ්‍රම බලකාය විධිමත් අධ්‍යාපනයකින් සහ පුහුණුවක් හරහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිට වඩාත් ඵලදායී ක්ෂේත්‍රයන් වෙත යොමු කිරීමෙන් (මහ බැංකුව, 2013) සෙවිය යුතුය.

ශ්‍රී ලංකාවේ සහල් ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් පර්යේෂණ සිදු කෙරුණ ද යාන්ත්‍රීකරණයට අදාළ ව වියළි කලාපයේ ගොවි ප්‍රජාවගේ වත්මන් ජීවනෝපාය රටාවන් පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නැත.

ඒ හා සමානව ම ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඉහළ නැංවීම පිණිස දිළිඳුකම අවම කිරීමට වී වගා ශ්‍රමය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස උපයෝජනය කිරීම, සහල් ඵලදායීත්වය ඉහළ නැංවීම සහ නිෂ්පාදන වියදම අවම කිරීම සිදු කළ යුතුය.

ඉහළ සඳහන් කළ තත්ත්වය යටතේ , ශ්‍රම උපයෝජනයට සහ ජීවනෝපාය රටාවන් කෙරෙහි යාන්ත්‍රීකරණයෙහි බලපෑම පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ වාණිජ වී වගා ක්ෂේත්‍රයේ නිෂ්පාදන වියදම සහ නිමැවුම පිළිබඳ ව ගැඹුරු තක්සේරුවක් මෙම අධ්‍යයනය මඟින් සැපයේ.

මෙම අධ්‍යනයේ සුවිශේෂී අරමුණු වන්නේ ;

a) වාණිජ වී වගා ක්ෂේත්‍රය යාන්ත්‍රීකරණය කිරීම නිසා කාන්තාවන් සහ කරුණ පිරිස්වල ජීවනෝපාය රටාවන් කෙරෙහි ඇති වූ බලපෑම
b) නිෂ්පාදනය සහ ඵලදායීතාවය කෙරෙහි යාන්ත්‍රීකරණයේ ඇති බලපෑම් සොයා බැලීම

c) වී නිෂ්පාදන වියදම කෙරෙහි යාන්ත්‍රීකරණයේ ඇති බලපෑම සොයා බැලීම
d) ප්‍රතිපත්ති නිර්දේශ යෝජනා කිරීම සඳහා

දත්ත එක්රැස් කිරීම (නියැදි සමීක්ෂණය, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සහ ප්‍රධාන තොරතුරු සම්පාදකයින් සමඟ කළ සම්මුඛ සාකච්ඡා) මේ වන විට අවසන් කර තිබේ. වාණිජ මට්ටමින් වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක වන පොළොන්නරුව, අනුරාධපුර සහ අම්පාර වැනි දිස්ත්‍රික්කයන්හි වී ගොවීන් 382ක් වෙත ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොමු කිරීමෙන් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සහ වාර්තා ලිවීම සිදු කරමින් පවතී.

02. නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ මල් වගාකරුවන්ගේ වර්තමාන තත්ත්වය සහ සංවර්ධන විභවතා

| | | |
|---|---|---|
| පර්යේෂණ කණ්ඩායම | එම්.ඩී සුසිලා ලූර්දු | සම්බන්ධීකරණ නිලධාරී |
| | ආර්.එන්.කේ රඹුක්වැල්ල | සම පර්යේෂිකා |
| | ආර්.එල්.එන් ජයතිස්ස | සම පර්යේෂක |

මූල්‍ය ප්‍රභවය ඒකාබද්ධ අරමුදල

අරමුණ සහ විෂයපථය

වර්තමානයේ මල් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්තයේ පවතින ආකර්ෂණීයභාවය නිසා රැකියා විරහිත තරුණ ප්‍රජාවත්, ග්‍රාමීය මට්ටමේ සුලභව පවතින කාන්තා ශ්‍රමයත් කර්මාන්තය වෙත උරා ගැනීමේ හැකියාව ඉහළ මට්ටමක පවතින බැවින් මල් වගාව සඳහා පාරිසරික වශයෙන් ඉහළ විභවයක් පවතින නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි සුළු හා මධ්‍ය පරිමාණ මල් වගාකරුවන් මුහුණ දෙන ගැටලු හා සීමාවන් අධ්‍යයනය කරමින් එම දිස්ත්‍රික්කයන්හි මල් කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අපේක්ෂාව වේ.

විශේෂිත අරමුණු

01. නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍ය පරිමාණ මල් වගා කරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය විමර්ශනය කිරීම
02. ප්‍රදේශයට අදාළව මල් වගාවේ ස්වභාවය, නිෂ්පාදනය හා අලෙවි රටාව අධ්‍යයනය කිරීම
03. වගාකරුවන් මුහුණ දෙන ගැටලු හා සීමාවන් හඳුනා ගැනීම
04. ප්‍රදේශය තුළ මල් කර්මාන්තය දියුණු කිරීම සඳහා මල් වගාකරුවන්ගේ අදහස් හා යෝජනා විමසා බැලීම

වර්තමාන ප්‍රගතිය : බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි මල් වගාකරුවන් පිළිබඳ නියැදි සමීක්ෂණය සිදු කර ඇත. දත්ත විශ්ලේෂණය සහ වාර්තාව ලිවීම සිදු කෙරෙමින් පවතී.

## කෘෂි සම්පත් කළමනාකරණ අංශය

## පහත රට තෙත් කලාපයේ කුඹුරු ඉඩම් දත්ත ප්‍රමාණ විෂමතා නිර්ණය කිරීම

**පර්යේෂණ කණ්ඩායම:** එස්. ඇපාසිංහ , රේණුකා වීරක්කොඩි, ශ්‍යාමිනී කුසුම් කුමාර

ඵලදායී සැලසුම්කරණය උදෙසා නිවැරදි දත්තවල අවශ්‍යතාව ඉමහත් ය. එමෙන්ම දත්ත විෂමතා පැවතීම හේතුවෙන් සැලසුම්කරණය හා සම්පත් වෙන් කිරීම අකාර්යක්ෂම වී ඇති අවස්ථා ද තිබේ. ශ්‍රී ලංකාවේ විවිධ මට්ටමේ භාවිතා කරන කුඹුරු ඉඩම් දත්ත ලේඛන කීපයක් පැවතීමත් ඒවා එකිනෙකට පරස්පරවීමත් මගින් නිවැරදි සැලසුම්කරණයට බාධා එල්ලවීම එවැනි එක් අවස්ථාවකි. ගොවි මහතාගේ උරුමය සඳහන් ලියවිල්ල (ඔප්පුව), ඉඩම්වල නිරවුල් අයිතිය සහතික කිරීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වූ බිම් සවිය වැඩසටහන මගින් නිකුත් කළ හිමිකම් සහතිකය, පොහොර නිකුත් කිරීම සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරී භාවිතා කරන පොහොර නාමලේඛනය, ගොවිජන සේවා කාර්යාලය භාවිතා කරන කුඹුරු නාමලේඛනය සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණ පිළිබඳ දත්ත සඳහන් කරන ($P_1$) ලේඛනය ඉහත භාවිත ලේඛන අතර වෙයි. එබැවින් කුඹුරු ඉඩම් ආශ්‍රිත දත්ත විෂමතාවල ප්‍රමාණය නිර්ණය කිරීමටත් එම විෂමතා සම්පත් භාවිත කාර්යක්ෂමතාවයට කෙතෙක් බලපා තිබේ ද යන්න අවබෝධ කර ගැනීම සඳහාත් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. බිම්සවිය වැඩසටහන මගින් ආවරණය කල පහත රට තෙත් කලාපයට අයත් ගාල්ල, මාතර, රත්නපුර, කෑගල්ල, කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක ඇසුරෙන් මෙම අධ්‍යයනය දියත් කරන ලදී.

**අරමුණු:**

ඉහත සඳහන් ලේඛන අතරින් බිම් සවිය වැඩසටහන මගින් නිකුත් කළ හිමිකම් සහතිකය වඩාත් නිරවද්‍ය බව උපකල්පනය කරමින් අනෙකුත් දත්ත මූලාශ්‍ර එය සමඟ සංසන්දනය කර අනෙකුත් ලේඛනවල සඳහන් දත්ත කෙතෙක් දුරට නිරවද්‍ය වේ ද යන්න නිර්ණය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.

### විශේෂිත අරමුණු:

1. කුඹුරු ඉඩම් පිළිබඳ විවිධ දත්ත මූලාශ්‍ර විමර්ශනය තුළින් පවතින විෂමතා හඳුනා හඳුනා ගැනීම.
2. කුඹුරු ඉඩම් මූලාශ්‍ර අතර පවතින දත්ත විෂමතා ගණනය කිරීම.
3. කුඹුරු ඉඩම් අතර පවතින විෂමතාවලට හේතු අධ්‍යයනය කිරීම.
4. කුඹුරු ඉඩම් ආශ්‍රිත වැඩසටහන් සඳහා සම්පත් වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය නිර්ණය කිරීම ( උදා: පොහොර සහනාධාර වැඩසටහන).
5. කුඹුරු ඉඩම් මගින් ආදායම් උත්පාදනයේ දී පවතින අකාර්යක්ෂමතා නිර්ණය කිරීම (උදා: අක්කර බදු).

### වර්තමාන තත්ත්වය:

මෙම අධ්‍යයනයේ දී රැස් කළ දත්ත විශ්ලේෂණය කිරීම සහ වාර්තාව සැකසෙමින්ම පවතී.

## ශ්‍රී ලංකාවේ දෙමුහුන් බීජ භාවිතය හා එළවළු නිෂ්පාදනයදේශීය බීජ වලට සාපේක්ෂව : විදේශීය බීජ

**පර්යේෂණ කණ්ඩායම**

ප්‍රසන්න විජේසිංහ -සම්බන්ධීකාරක

රසිකා විජේසිංහ සම පර්යේෂක -

### විෂය පථය හා අරමුණු

ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදකයන්ගෙන් බහුතරයක් දේශීය ප්‍රභේද වලට සාපේක්ෂව ආනයනික ප්‍රභේද වලින් ඉහල අස්වැන්නක් ලබා දීම හේතුවෙන් ආනයනික දෙමුහුන් බීජ වගා කිරීම සඳහා වැඩි යොමුවීමක් වර්තමානයේ දැකිය හැකනමුත් දෙමුහුන් බීජ භාවිතයේ ප්‍රතිඵලයන් ලෙස . රසයෙන් අඩු එළවළු නිෂ්පාදනයරෝග හා පලිබෝධ වලට ඔරොත්තු දීම අඩු ,බීජ සඳහා යන පිරිවැය ඉහල යෑම , එමෙන්ම දෙමුහුන් බීජ වගා කරන ගොවි .නිසා කෘෂි රසායන භාවිතය ඉහල යෑම දැක්විය හැකිය මහතුන් වගාවෙන් ලැබෙන දළ ආදායම ගැන පමණක් අවධානය යොමු කරන අතර ශුද්ධ ආදායම කෙරෙහි දක්වනඅවධානය අඩුයවියදම් ලේඛන නඩත්තු -එයට ප්‍රධාන හේතුව ඔවුන් ආදායම් . මීට අමතරව ඉහළ කෘෂි රසායන භාවිතය පාරිසරික හා සෞඛ්‍යමය ගැටළු ඇති වීමට ද .නොකිරීමයි ඒ අනුව ආනයනික දෙමුහුන් එළවළු බීජ භාවිතයේ කෙටි කාලීන හිතකර භාවයට වඩා දිගු .හේතු වේ කාලීන අහිතකර භාවය ඉහල විය හැකියඑම නිසා මෙම අධ්‍යනය මගින් දේශීය එළවළු ප්‍රභේදයන්ට . වඩා ආනයනික එළවළු ප්‍රභේද වගා කිරීම කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දැක්වීමට බලපාන සාධක හදුනාගැනීම හා එළවළු බීජ සැපයුම් අංශය ශක්තිමත් කිරීම සඳහා ගතහැකි උපායමාර්ග යෝජනා .කිරීම ප්‍රධාන අරමුණ වේ

### විශේෂිත අරමුණු

1. ආනයනික එළවළු ප්‍රභේද වගා කිරීම සඳහා ගොවින් වැඩි රුචිකත්වයක් දැක්වීමට බලපාන සාධක හදුනා ගැනීම.
2. දේශීය එළවළු ප්‍රභේද වලට සාපේක්ෂව ආනයනික එළවළු ප්‍රභේද වල පිරිවැය ප්‍රතිලාභ සංසන්දනය කිරීම.
3. එළවළු බීජ සැපයුම් අංශය ශක්තිමත් කිරීම සඳහා උපායමාර්ග යෝජනා කිරීම

අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත අනුරාධපුරයමොණරාගල හා ,නුවරඑළිය ,බදුල්ල ,කුරුණෑගල , හම්බන්තොට දිස්ත්‍රික්ක වලින් රැස් කරන ලද අතර නියදියට එළවළු වගා කරන ගොවි මහතුන් විශේෂයෙන්ම .තුන්සිය විස්සකින් පුද්ගල සම්මුඛ සාකච්ජා මගින් තොරතුරු ලබාගන්නා ලදි තෝරාගත් බෝග හතරක් වන කරවිලවට්ටක්කා හා තක්කාලි වගාකරන ගොවින් ,වැටකොළු , .නියෝජනය වන පරිදි නියදිය තෝරා ගන්නා ලදි

### වර්තමාන ප්‍රගතිය

ප්‍රාථමික දත්ත රැස් කිරීම අවසන් වී ඇති අතර දත්ත විශ්ලේෂණය හා වාර්තාව සැකසීම කරනු ලබයි .

## පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය

අවසන් කළ අධ්‍යයන

**1.** **වාණිජ ගොවිපළ වැඩසටහන සහ තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන ඇගයීම**

| | | | |
|---|---|---|---|
| පර්යේෂණ කණ්ඩායම | : | ඩබ්.එච්.ජ් ශාන්ත | සම්බන්ධීකරණ නිලධාරී |
| | | ජී.ජී.ඩී.එල්.ඩබ්. සමරසිංහ | සම පර්යේෂක |
| මූල්‍ය ප්‍රභවය | : | ඒකාබද්ධ අරමුදල | |

විෂයපථය :

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සහ එහි උප ක්ෂේත්‍රයන් මෙහෙයවන සහ පෙර දැක්මෙන් කටයුතු කරන කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකර්මාන්තයේ උන්නතිය සඳහා කාලීන වශයෙන් වැදගත් වැඩසටහන් ද්විත්වයක් ආරම්භ කර තිබේ.

(i) වාණිජ ගොවිපොළ වැඩසටහන සහ
(ii) තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන එම වැඩසටහන් වේ.

වසර පහක අඛණ්ඩ වැඩසටහන් ලෙස 2013 දී මෙම වැඩසටහන් දෙක ආරම්භ කරනු ලැබූ අතර දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක විය. වාණිජ ගොවිපොළ වැඩසටහන ප්‍රධාන වශයෙන් වත්මන් ගොවීන්ගේ ගැටලුවලට ආමන්ත්‍රණය කරන අතර වැඩසටහන තුළින් එවැනි ගොවීන්ගේ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වාණිජ මට්ටම දක්වා දියුණු කිරීමට ඔවුනට සහය දෙයි. තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන මඟින් අභිප්‍රේරණය සහ ව්‍යාවසායකයින් ලෙස නැඟී සිටින්නට පහසුකම් සැපයීම තුළින් තරුණ පිරිස් කෘෂිකර්මාන්තයට වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරයි.

වැඩසටහන තෘප්තිමත් මට්ටමකින් සිදුවෙමින් පවතින අතරතුර වැඩසටහන මෙහෙයවන හස්තය විසින් එනම් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවර්ධන අංශය විසින් වැඩසටහනට නව අංග හඳුන්වා දීමෙන් මෙම වැඩසටහනෙහි කාර්යක්ෂමතාවය සහ සඵලතාව වැඩි කිරීමට අපේක්ෂා කළ අතර පවතින නියමයන් සහ කොන්දේසි ප්‍රතිශෝධනය කිරීමට ද පියවර ගන්නා ලදී.

2013 සහ 2014 මුදල් වර්ෂයන් තුළ වැඩසටහන්වල ප්‍රතිලාභීන් අධ්‍යයනයට ලක් කිරීම තුළින් උගත හැකි පාඩම් ඇසුරින් වැඩසටහන් ද්විත්වයට නව අංග හඳුන්වා දීමට කෘෂිකර්ම අමාත්‍යාංශය අපේක්ෂා කරන ලදී. වැඩසටහන් ද්විත්වය අධ්‍යයනය කිරීම සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වෙත බාර දෙන ලදී.

අධ්‍යයනයේ අරමුණු:

වැඩසටහන්වල මැදිහත් වීමෙන් ගොවි ඉඩම් සහ ගොවි පවුල්වලට සිදු වූ බලපෑම හඳුනා ගැනීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන් ද්විත්වය ඇගයීමට අපේක්ෂා කෙරිණි. මෙම ඇගයීමේ සුවිශේෂී අරමුණු වන්නේ,

- වැඩසටහන් මඟින් සැලකිල්ලට ගනු ලැබූ කෘෂිකර්මාන්තයේ උප ක්ෂේත්‍ර හඳුනා ගැනීම
- ප්‍රතිලාභී ගොවීන් සහ වැඩසටහන ක්‍රියාත්මක කරන නිලධාරීන් වැඩසටහනේ විවිධ අදියරයන්හි දී මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීම.

- ගොවීන්ගේ කුටුම්භයන්ට වැඩසටහනෙන් සිදු වූ බලපෑම හඳුනා ගැනීම
- උගත් පාඩම් තුළින් වැඩසටහන වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී කිරීම සඳහා අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සොයා ගැනීම් සහ නිර්දේශ :**

- වැඩසටහන් ද්විත්වය පිළිබඳ ගොවීන් තුළ පැවති අවබෝධය සහ වැඩසටහන් දියත් කිරීමේ ක්‍රියාවලිය ඉතා දුර්වල මට්ටමක පැවති නිසා කෘෂිකර්ම අමාත්‍යාංශයට සම්බන්ධ සංවර්ධන නිලධාරීන්ගේ දායකත්වයෙන් ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කෘෂිකර්ම උපදේශකයින් සහ ග්‍රාම නිලධාරී හරහා වැනි ඵලදායී සන්නිවේදන මාධ්‍ය හරහා අදාළ පණිවිඩය ගමට ගෙන යා යුතුය.

- මූල්‍යමය සහ ආයතනික ක්‍රියාපටිපාටීන්හි ප්‍රමාදයන් සමඟ වැඩසටහන අනුචිත කාලයක ආරම්භ වූ හෙයින් ගොවීන් මුල් වැඩසටහන් සැලසුමෙන් ඉවත් වීමේ ප්‍රවණතාවයක් ඇති විය. එබැවින්, ව්‍යාපෘති යෝජනාව සහ අයවැය අනුමැතිය පළමු කාර්තුව තුළ අවසන් කරන අතරතුර වැඩසටහනේ ප්‍රතිලාභ වසරේ දෙවන සහ තුන්වන කාර්තු තුළ සැපයීමට නිර්දේශ කෙරේ.

- ගොවීන්ගේ නිෂ්පාදනය, ඵලදායීත්වය සහ ගොවිපොළ ආදායම ඉහළ නැංවීමට වැඩසටහනෙන් මහත් රුකුලක් වී තිබේ. සමහර ගොවීන්ට තවදුරටත් ඔවුන්ගේ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් ව්‍යාප්ත කර ගැනීමට සහ ඉහළ නංවා ගැනීමට සහය අවශ්‍ය වේ. එබැවින්, එවැනි අවශ්‍යතා සහිත ගොවීන්ට ඔවුන්ගේ මූල්‍යමය ශක්තිය මත පදනම් වී පියවරෙන් පියවර සහය ලබා දිය යුතුය. වැඩසටහනෙන් ප්‍රතිලාභ ලබා ගත් පසුව නුසුදුස්සෙකු බවට පත් කරනු වෙනුවට රුපියල් 500,000 මුදල වැය වන තුරු ඔවුන්ට සහය ලබා දිය යුතුය.

- වැඩසටහනෙහි අසාර්ථක වීම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ එක් එක් බෝග සම්බන්ධයෙන් අදාළ ගොවියාගේ පසුබිම සහ මූල්‍ය ශක්තිය තක්සේරු කිරීමෙන් තොරව ප්‍රතිලාභ ලබා දී ඇති බවයි. එබැවින් , වැඩසටහනේ සාර්ථකත්වයට බලපාන සියලු පාර්ශවයන් පිළිබඳ සම්පූර්ණ විමර්ශනයක් කිරීමට ද නිර්දේශ කෙරේ.

- නිරන්තර ක්ෂේත්‍ර චාරිකා තුළින් කෘෂිකර්ම ව්‍යාප්ති සේවය, යෙදවුම් සැපයුම සහ අලෙවිය සඳහා සහය ලබා දෙන අතරතුර සංවර්ධන නිලධාරීන් විසින් ප්‍රතිලාභී ගොවීන්ව අඛණ්ඩව අධීක්ෂණය සහ ඇගයීම සිදු කළ යුතුය.

සිදු කෙරෙමින් පවතින අධ්‍යයන

**1.** වර්ෂා පෝෂිත ගොවීන්ට නියං තත්ත්වයන් මඟින් ඇති වන බලපෑම සහ එම අන්තරාදායකත්වය අවම කිරීම පිණිස වන විභව උපක්‍රම : වර්ෂාපෝෂිත සහ සෘතුමය ජලාශ යටතේ වගා කරන ගොවීන්ට අදාළව

| | | | |
|---|---|---|---|
| පර්යේෂණ කණ්ඩායම | : | එච්.ජේ.සී ජයසූරිය | - සම්බන්ධීකරණ නිලධාරී |
| | | ඩබ්.ඒ.ආර් වික්‍රමසිංහ | - සම පර්යේෂක |
| මූලය ප්‍රභවය | : | ඒකාබද්ධ අරමුදල | |

විෂයපථය සහ අරමුණු :

වර්ෂාපෝෂිත ගොවීන්ට නියං තත්ත්වයන්හි ඇති බලපෑම තවමත් ගැඹුරින් අවබෝධ කර ගෙන නොමැති හෙයින් ඒ සඳහා ඵලදායී ලෙස අනුගත වන ආකාරය පිළිබඳ නිර්දේශ සකස් කිරීමට අපොහොසත් වී තිබේ.

වර්ෂාපෝෂිත සහ ඔල වැව් (seasonal Tanks) යටතේ වගා කරන ගොවීන්ගේ ජීවනෝපායන්හි ස්ථායීත්වට නියං තත්ත්වයන්ගෙන් සිදු කරන බලපෑම අවබෝධ කර ගැනීම සහ අනාගත නියං තත්ත්වයන්ට ඔරොත්තු දීම සඳහා ඔවුන් සතු හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයන් හඳුනා ගැනීම පිණිස මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරනු ලබයි.

විශේෂිත අරමුණු වන්නේ ,

- නියං තත්ත්වයන්හිදී වර්ෂාපෝෂිත සහ ඔල වැව් (seasonal Tanks) යටතේ වගා කරන ගොවීන්ගේ කුටුම්භයන් පත්වන අන්තරාදායක මට්ටම නිරීක්ෂණය කිරීමට
- වර්ෂාපෝෂිත සහ ඔල වැව් (seasonal Tanks) යටතේ වගා කරන ගොවීන්ගේ ජීවනෝපායන්හි ස්ථායීත්වට නියං තත්ත්වයන්ගෙන් සිදු කරන බලපෑම අවබෝධ කර ගැනීම
- ගංවතුර ආශ්‍රිත කම්පන තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීමට අදාළ විශේෂිත ගොවි ප්‍රජාවන් විසින් භාවිතා කරන උපක්‍රම හඳුනා ගැනීම
- නියං තත්ත්වයන්හි ප්‍රතිවිපාකයන්ට හැඩ ගැසෙනු පිණිස වර්ෂාපෝෂිත සහ ඔල වැව් (seasonal Tanks) යටතේ වගා කරන ගොවීන්ගේ නම්‍යතා ධාරිතාව වැඩි කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග හඳුනා ගැනීම

අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කිරීම අවසන් කර ඇති අතර දත්ත විශ්ලේෂණය සහ වාර්තාව ලිවීම මේ වන විට සිදු කෙරෙමින් පවතී.

2. ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදන ක්‍රමයෙහි කෘෂි රසායන භාවිතය පිළිබඳ ගොවීන්ගේ අවබෝධය සහ ඉල්ලුම

| | | | |
|---|---|---|---|
| පර්යේෂණ කණ්ඩායම | : | තිළිණි පද්මජානි මුණවීරගේ | සම්බන්ධීකරණ නිලධාරී |
| | | ජේ.ඒ.යූ.පී ජයසිංහ | සම පර්යේෂක |

මූල්‍ය ප්‍රභව : ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු :

කෘෂිරසායන ද්‍රව්‍ය නූතන කෘෂිකර්මාන්තයේ ප්‍රධාන භූමිකාවක් රඟ දක්වයි. කෙසේ නමුත්, දිවයින පුරා කෘෂි රසායන අවභාවිතය පිළිබඳව පවත්නා සෘණාත්මක බාහිර සාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ ගොවිතැන් ක්‍රමය සම්බන්ධයෙන් බරපතළ අවධානයක් යොමු වී තිබේ. රසායන ද්‍රව්‍යවලින් තොර වගාවක් සඳහා වඩ වඩාත් යොමු වීමේ අවශ්‍යතාවය සමඟ ප්‍රතිපත්ති සංශෝධනයක් සඳහා අවදානම් සංජානනය, ගොවීන්ගේ හැසිරීම සහ කෘෂි රසායන සම්බන්ධයෙන් පවතින ආකල්ප පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගත යුතුය. කෘෂි රසායන ද්‍රව්‍යයන්හි හානිකර බලපෑම් පිළිබඳ ගොවීන්ගේ අවබෝධය නිර්ණය කිරීම සඳහා සහ එම අවබෝධය ඔවුන්ගේ භාවිතය සඳහා කෙලෙස පරිවර්තනය වී ඇත් ද යන්න මැනීම සහ ශ්‍රී

ලංකාවේ සහල් නිෂ්පාදන ක්‍රමයෙහි කෘමිනාශක භාවිතා කිරීමේ නිර්ණායක ඇස්තමේන්තුගත කිරීම පිළිබඳව මෙම අධ්‍යයනයෙන් සොයා බැලීමට අදහස් කෙරේ.

**පොදු අරමුණු**

- කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය හා ශ්‍රී ලංකාවේ සහල් ක්ෂේත්‍රය පිළිබඳ ගොවි ජනතාවගේ අවබෝධය

**විශේෂිත අරමුණු**

- සහල් නිෂ්පාදනයේ දී කෘෂි රසායන භාවිතයේ ප්‍රමාණය ඇගයීම
- කෘෂි රසායන භාවිතයේ බලපෑම පිළිබඳ ගොවීන්ගේ අවබෝධය නිර්ණය කිරීම
- කෘෂි රසායන භාවිතයේ ප්‍රමාණය නිර්ණායක සොයා බැලීම

සෑම කෘෂි පාරිසරික කලාපයක්ම නියෝජනය වන පරිදි තෝරා ගන්නා ලද අම්පාර, කුරුණෑගල, මාතර සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කන්හි ක්ෂේත්‍ර දත්ත එක්රැස් කිරීම අවසන් කර ඇත. දත්ත විශ්ලේෂණය සහ වාර්තාව ලිවීම සිදු කෙරෙමින් පවතී.

## අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂිව්‍යාපාර අංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය ලෙස වර්තමානයේ හඳුන්වන අලෙවි පර්යේෂණ ඒකකය 1979 එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතනයේ සහයෝගයෙන් ආරම්භ කර තිබේ. එහි ක්‍රියාකාරකම් දියුණු කිරීම උදෙසා 1993-1997 කාලය තුළ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන/ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් වැඩි දුරටත් සහය ලැබිණි. මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ගොවීන්ට, වෙළෙඳුන්ට, ශාස්ත්‍රඥයින්ට සහ වෙනත් පුද්ගලයින්ට අවශ්‍ය වන වෙළඳපොළ දත්ත එක්රැස් කිරීම, දත්ත සම්පාදනය, විශ්ලේෂණය සහ බෙදා හැරීමයි. වර්තමානයේ අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය විසින් ජීවන වියදම් සමාලෝචන කමිටුව සහ ජාතික ආහාර සුරක්ෂිතතා කමිටුව වෙත වෙළඳපොළ තොරතුරු සැපයීම සිදු කරනු ලබයි. මෙම අංශය විසින් කෘෂිකර්ම, වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු, සෞඛ්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන යන අමාත්‍යාංශවලට හා මහ බැංකුව වැනි ආයතනවලට වෙළඳපොළ මිල ස්ථාවරව පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය වන වෙළඳපොළ තොරතුරු සපයනු ලැබේ.

මීට අමතරව, රජයේ දෙපාර්තමේන්තු සහ ජාතික හා පළාත් මට්ටමේ සංවිධාන, රජයේ සහ පෞද්ගලික බැංකු, විදේශීය ආධාර ආයතන සහ අනෙකුත් ආයතන, තානාපති කාර්යාල, විශ්වවිද්‍යාල, පෞද්ගලික වෙළඳ සමාගම්, සමුපකාර සහ පෞද්ගලික වෙළෙඳුන්, රාජ්‍ය නොවන සංවිධාන, මාධ්‍ය ආයතන සහ වෙළෙඳුන් වෙත ද වෙළඳපොළ දත්ත සහ තොරතුරු සපයනු ලබයි.

අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය විසින් ක්‍රියාත්මක කරන අනෙකුත් ක්‍රියාකාරකම් අතර කෘෂිකාර්මික අලෙවිකරණ පර්යේෂණ අධ්‍යයනයන් ක්‍රියාත්මක කිරීම, ගොවීන්, වෙළෙඳුන් සහ ව්‍යාප්ති සේවා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය ද වේ.

### ආහාර තොරතුරු සහ අලෙවි ව්‍යාපෘතිය

සතිපතා සෑම සිකුරාදාවකම ආහාර ද්‍රව්‍ය විවරණිකාවක් නිකුත් කරනු ලබයි. ඒ අනුව, සලකා බලන වර්ෂය තුළ සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකා 52ක් සහ මාසික ආහාර තොරතුරු පිළිබඳ විවරණිකා 12ක් නිකුත් කර තිබේ. සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව (සිංහල සහ ඉංග්‍රීසි) සහ මාසික ආහාර තොරතුරු පිළිබඳ විවරණිකාව (සිංහල සහ ඉංග්‍රීසි) යන විවරණිකා මෙම අංශය විසින් සම්පාදනය කරයි. මෙමඟින් රජයට, ගොවීන්ට, වෙළෙඳුන්ට, පාරිභෝගිකයින්ට සහ වෙනත් පුද්ගලයින්ට මිල තොරතුරු සැපයීම සිදු කරනු ලබයි.

සම්පත් වෙන් කිරීම, ගනුදෙනු වියදම් අවම කිරීම, ගොවීන්ගේ කේවල් කිරීමේ හැකියාව දියුණු කිරීම, සමස්ත වෙළඳපොළ තත්ත්වයන් පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම, පාරිභෝගිකයින්ගේ කේවල් කිරීමේ හැකියාවට දිරි දීම සහ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම පිණිස ආහාර තොග පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය තීරණ ගැනීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයින්ට වටිනා සංඛ්‍යාලේඛන සැපයීම ආදිය සඳහා මෙම විවරණිකාවෙන් සැපයෙන තොරතුරු අතිශය වැදගත් වේ.

ආහාර ද්‍රව්‍ය පිළිබඳ මිල තොරතුරු සහ වෙළඳපොළ තොරතුරු පිටකොටුව, තොටළඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, කඩවත සහ කිරිබත්ගොඩ සහ පිටකොටුව තොග වෙළඳපළ ආදී ස්ථාන 9කින් රැස් කර ගනු ලැබේ. ඊට අමතරව, දිවයිනේ ප්‍රධාන ආහාර නිෂ්පාදනය කරන සහ ආහාර පරිභෝජනය සිදු කරන දිස්ත්‍රික්කයන්හි පිහිටි වෙළඳපොළ 30කින් ද තොරතුරු රැස් කර ගනු ලැබේ.

2015 වර්ෂය තුළ ආවරණය කළ පිටපළාත්හි වෙළඳපොළවල් වූයේ කුරුණෑගල, නිකවැරටිය, දඹුල්ල, අනුරාධපුර, තඹුත්තේගම, පොළොන්නරුව, නුවරඑළිය, මහනුවර, බදුල්ල, කැප්පෙටිපොළ, රත්නපුර, ඇඹිලිපිටිය, හම්බන්තොට, තිස්සමහාරාම, මුලතිවු,මාතර, ගාල්ල, කලුතර, මොණරාගල, දෙහිඅත්තකණ්ඩිය, පුත්තලම, මීගොඩ, මරදගහමුල, යාපනය, කිලිනොච්චි, වවුනියා, මඩකලපුව ආදී ප්‍රදේශයන් වේ.

ආහාර ද්‍රව්‍යවල සිල්ලර මිල ගණන් දිනපතා පිටකොටුව, මහනුවර,තඹුත්තේගම,කැප්පෙටිපොළ, දඹුල්ල, නොරොච්චෝලෙ, මරදගහමුල සහ මීගොඩ යන වෙළඳපොළවලින් රැස් කර ගන්නා ලදී. නිෂ්පාදකයින්ට සහ වෙළෙඳුන්ට තොග ප්‍රධාන තොග වෙළඳ මධ්‍යස්ථානයන්හි භාණ්ඩවල මිල ගණන් නිසි කලට දැන ගැනීමට හැකි වන පරිදි මෙම දත්ත දිනපතා විද්‍යුත් මාධ්‍ය හරහා බෙදා හරිනු ලබයි.

සෑම සිකුරාදාවකම නිකුත් කෙරෙන සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාවෙහි කොළඹ සහ පිට පළාත්වල තොග සහ සිල්ලර මිල ගණන් සහ ප්‍රධාන නිෂ්පාදන දිස්ත්‍රික්කයන්හි නිෂ්පාදන මිල ගණන් පිළිබඳ විශ්ලේෂණයක් ඇතුළත් වේ.

මිල තොරතුරු රැස් කරන ප්‍රධාන භාණ්ඩ වර්ග වනුයේ සහල්, මිරිස්, ලූනු, අල, එළවළු, පලතුරු,බිත්තර, මාළු සහ කරවල වේ. ඊට අමතරව, පසුගිය සතියේ සහ පසුගිය වසරේ මිල පරාසයන්, මධ්‍යයන මිල ගණන් සහ මිල සැසැඳීම් වැනි සංඛ්‍යා විද්‍යාත්මක විස්තර ද විවරණිකාවෙන් සපයයි.

මෙම අංශයෙන් නිකුත් කෙරෙන අනෙක් ප්‍රධාන ප්‍රකාශනයක් වන මාසික ආහාර තොරතුරු පිළිබඳ විවරණිකාව මඟින් පසුගිය මාසය තුළ මිල ගණන්, නිෂ්පාදනය, බෝග පිළිබඳ තත්ත්වය සහ ආහාර තොග වැනි ප්‍රධාන දර්ශකයන් පිළිබඳ කෙටි සාරාංශයක් සපයයි. තවද එමඟින් මහජනතාව වෙත මධ්‍යයන මිල හා සිල්ලර මිල, තොග මිල ගණන්, ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශයන්හි නිෂ්පාදන මිල , ආහාර ආනයන ප්‍රමාණයන් සහ ඒවායේ වටිනාකම, ආනයන මිල (පිරිවැය, රක්ෂණ,නැව්) සහ ශ්‍රී ලංකාව ආහාර ආනයනය කරන රටවල් ආදිය පිළිබඳ තොරතුරු සමඟ දිවයිනේ සමස්ත ආහාර අලෙවිකරණය පිළිබඳ තත්ත්වය සම්බන්ධයෙන් තොරතුරු අන්තර්ගතය.

තවද, ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල බෝග වගා තත්ත්වය, වගා භූමි ප්‍රමාණය සහ බෝග වගා කිරීම සඳහා ඉලක්ක කර ගත් භූමි ප්‍රමාණය , සත්‍ය බෝග වගා ප්‍රදේශය, ප්‍රධාන ජලාශයන්හි ජල මට්ටම, වර්ෂාපතනය, ස්වභාවික දේශගුණික තත්ත්වයන් සහ බෝග හානි සිදු කළ නියඟ, ගං වතුර ආදී ස්වභාවික සංසිද්ධි පිළිබඳ ව තොරතුරු ද මෙමඟින් ගෙන ඒ.

දත්ත එක්රැස් කර ගැනීමේ අඛණ්ඩ වැඩසටහනට සංඛ්‍යාන නිලධාරීන් තිදෙනෙකු, සංඛ්‍යාන සහකාරවරුන් 10 දෙනෙකු සහ අනියම් විමර්ශකයින් 19දෙනෙකුගේ සහය ලැබේ.

සංඛ්‍යාන නිලධාරියෙකු, සංඛ්‍යාන සහකාරවරුන් 07දෙනෙකු සහ අනියම් විමර්ශකයින් 22 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ක්ෂේත්‍රයේ දත්ත එක්රැස් කිරීම සඳහා යොදවා තිබේ.

2. මූලික අදියරේ පවතින හෙක්ටර් කොබ්බෑකඩුව පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ තොරතුරු කළමණාකරණ ක්‍රමය

- දිවයින පුරා ඇති ප්‍රධාන වෙළඳපොළවල සහ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි එළවළු සහ පලතුරුවල තොග , සිල්ලර සහ නිෂ්පාදන මිල ගණන්

- ප්‍රභේද, වෙළඳපොළ සහ ප්‍රභේද 50ක දෛනික දත්ත එක්රැස් කිරීම පිළිබඳ විස්තර- තොග වෙළඳපොළ 8ක සහ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි http://www.harti.gov.lk/images/download/market_information/2016/january/daily_16-02-2016.pdf

- ස්ථානය, වර්ගය සහ සතිපතා දත්ත එක්රැස් කිරීම පිළිබඳ විස්තර (ඇමුණුම අංක 01 බලන්න) http://www.harti.gov.lk/images/download/market_information/Weekly_Price_list/wee kly-042016.pdf

මීට අමතරව මොබිටෙල් දූරකථන ජාලය හරහා තොරතුරු බෙදා හැරීමේ සේවාව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

මීට අමතරව, දෛනිකව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් සහ 6666 මොබිටෙල් ඍජු දූරකථන මිල තොරතුරු සේවයෙන් බෙදා හැරීම පිණිස දිනපතා ආහාර ද්‍රව්‍ය තොග මිල ගණන් කරනු ලැබේ. ඊට අමතරව එම තොරතුරු http://www.harti.gov.lk/ ආයතනික වෙබ් අඩවියෙහි පළ කෙරේ.

මොබිටෙල් "6666" කෘෂි මිල තොරතුරු දර්ශකය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය විසින් පිටකොටුව, මහනුවර, දඹුල්ල, නොරොච්චෝලෙ, මීගොඩ තඹුත්තේගම, නුවරඑළිය සහ කැප්පෙටිපොළ යන ප්‍රධාන වෙළඳපොළවලින් එක්රැස් ගත් දිනපතා ආහාර ද්‍රව්‍ය මිල තොරතුරු බෙදා හැරේ. එම තොරතුරු අප ආයතනය විසින් තහවුරු කර වලංගුභාවයට පත් කර බෙදා නිෂ්පාදනය අනුව හා වෙළඳපොළ අනුව වශයෙන් තොරතුරු පද්ධතියට එකතු කරනු ලැබේ.

මෙහිදී පාරිභෝගිකයින්ට මොබිටෙල් ජංගම දූරකතනයකින් 6666 ඇමතීමෙන් සිංහල සහ දමිළ භාෂාවන්ගෙන් සමන්විත අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරයට (IVR) සම්බන්ධ විය හැකිය. නිෂ්පාදනය අනුව හෝ වෙළඳපොළ අනුව තොරතුරු සොයා ගැනීමේ හැකියාව මෙහි දී ග්‍රාහකයින්ට ලැබේ. නිෂ්පාදනය අනුව තොරතුරු සොයන්නේ නම් අදාළ නිෂ්පාදනයේ කාණ්ඩ අංකය ඇතුළත් කළ යුතුය. වැරදි කේත අංකයක් ඇතුළත් කළහොත් නිෂ්පාදන ලැයිස්තුව පාරිභෝගිකයා වෙත අසන්නට සලස්වනු ලැබේ. වෙළඳපොළ අනුව තොරතුරු සෙවීමට ග්‍රාහකයා අපේක්ෂා කරයි නම් පිටකොටුව, මහනුවර, දඹුල්ල, මීගොඩ, නොරොච්චෝලෙ, තඹුත්තේගම, නුවරඑළිය සහ කැප්පෙටිපොළ යන ප්‍රධාන වෙළඳපොළවල සියලු නිෂ්පාදන පිළිබඳ තොරතුරු ඔහුට ලබා ගත හැකිය.

2015 වර්ෂයේ ප්‍රගතිය

i. සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව -(සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන්) විවරණිකා ක් නිකුත් කර 52 .තිබේ

ii. මාසික ආහාර තොරතුරු පිළිබඳ විවරණිකා 12ක් නිකුත් කර තිබේ. (සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන්)

iii. දෛනික සහ සතිපතා ආහාර මිල තොරතුරු නිසි කලට ( දෙමළ භාෂාවෙන්) ට සහ ජනමාධ්‍ය වෙත නිකුත් කර තිබේ.

iv. සියලුම මිල තොරතුරු සහ අනෙකුත් වෙළඳපොළ තොරතුරු ඉල්ලීම් කළ රාජ්‍ය ආයතනවලට සහ පෞද්ගලික අංශයේ ආයතනවලට සපයා තිබේ.

v. ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පවතින ආහාර ප්‍රසම්පාදන සහ අධීක්ෂණ ඒකකය වෙත යාවත් කාලීන මිල තොරතුරු වර්ෂය පුරාම සැපයීම

සම්පූර්ණ කළ අධ්‍යයන

1. ශ්‍රී ලංකාවේ වී අලෙවිය සඳහා රජයේ මැදිහත්වීම : මිල දී ගැනීමේ සහ පශ්චාත් තොග කළමනාකරණයේ ගැටලු

| | | | |
|---|---|---|---|
| පර්යේෂණ කණ්ඩායම : | ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා | - | සම්බන්ධීකරණ නිලධාරී |
| | ආර්.පී විදානපතිරණ මිය | - | සම පර්යේෂිකා |
| | ඩබ්.එච්.ඩී ප්‍රියදර්ශන මහතා | - | සම පර්යේෂක |
| | පී.ඒ.ජේ චම්පිකා මෙනෙවිය | - | සම පර්යේෂිකා |

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු

වෙළඳපළ තුළ වී සහ සහල් අලෙවිකරණ ක්‍රියාවලිය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා රාජ්‍ය මැදිහත්වීම සහල් නිෂ්පාදනය කරන බොහොමයක් ආසියාතික රටවලට පොදු තත්ත්වයකි. ගොවීන්ට වී සඳහා සහතික මිලක් ලබා දීමට සහ පාරිභෝගිකයින්ට සහල් පහසු මිලට ලබා ගැනීමට හැකියාව ලබා දීම මෙම රජය මැදිහත් වීමේ ප්‍රධාන අරමුණ වන අතර මෙම ක්‍රියාවලිය විවිධ රටවල් විවිධ ආකාරයෙන් සිදු කරනු ලබයි. මෙම මැදහත්වීම ගොවීන් සඳහා මිල සහන ලබා දීම සහ පාරිභෝගිකයින්ට ධාන්‍ය ආහාර බෙදා හැරීමේ දී මිලක් නිකුත් කිරීම දක්වා පරාසයක පවතී.

වී අලෙවිකරණයේ දී ශ්‍රී ලංකා රජය ප්‍රධාන වශයෙන් මැදිහත් වන්නේ වී අලෙවි මණ්ඩලය හරහා වන අතර එය සහතික කළ මිලක් යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකින්, අලෙවියෙන් සහ ආරක්ෂක තොග පවත්වා ගෙන යාමෙනි.
වී අලෙවි මණ්ඩලය නැවත ප්‍රතිස්ථාපනය කර එහි මෙහෙයුම් ආරම්භ කළේ 2008 වසරේ දීය. මෙම අධ්‍යයනය මඟින් ද්විතීයික දත්ත භාවිතයෙන් ශ්‍රී ලංකාවේ වී අලෙවියෙහිලා වී අලෙවි මණ්ඩලයේ භූමිකාව සහ කාර්යසාධනය අධ්‍යයනයට ලක් කෙරේ. විශේෂයෙන්ම, අධ්‍යයනය මඟින් එහි පුළුල් අභිමතාර්ථ වන වී මිල දී ගැනීම සහ පශ්චාත් තොග කළමනාකරණය සහ එහි ප්‍රතිසංස්කරණ සඳහා අවස්ථාවන් සැපයීම යන අරමුණු කරා ළඟා වී ඇත් ද යන්න පරීක්ෂා කෙරේ. වී අලෙවි මණ්ඩලය විසින් සිදු කළ මුල පිරීම් හේතුවෙන් පාරිභෝගිකයින්ට තම ආහාර අවශ්‍යතා සාධාරණ මිලකට ලබා ගැනීමට හැකි වී ඇති අතර වී අලෙවි මණ්ඩලය මඟින් වී සඳහා රජයේ සහතික මිල ක්‍රමයක් හඳුන්වා දීමෙන් ගොවි ප්‍රජාවට තම ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගැනීම සඳහා අවස්ථාවක් උදා කර දී තිබේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ වී අලෙවිකරණයේ සමස්ත තත්ත්වය හඳුනා ගැනීම සහ වී අලෙවිය සඳහා රජයේ මැදිහත් වීමේ වත්මන් ගැටලු විමර්ශනය කිරීමයි.

i. ගොවිපොළ මිල ස්ථායීව පවත්වා ගෙන යාම සඳහා වී මිලදී ගැනීමේ වැඩසටහනෙහි බලපෑම විමර්ශනය කිරීම.

ii. වී අලෙවි මණ්ඩලයේ පශ්චාත් තොග කළමනාකරණ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම.

iii. වී අලෙවිය සඳහා රජයේ මැදිහත්වීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍යවන ප්‍රතිපත්තිමය මූල පිරිම් හඳුනා ගැනීම.

මෙම අධ්‍යයනය සම්පූර්ණයෙන් ම ද්විතීයික දත්ත සහ ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා පාදක කර ගෙන සිදු කළ එකකි.

සොයා ගැනීම්

වී අලෙවි මණ්ඩලය විසින් මිල දී ගන්නා වී ප්‍රමාණය ක්‍රමයෙන් 2008 වසරේ සමස්ත නිෂ්පාදනයෙන් 8% සිට 2013 දී 5%කට ආසන්න මට්ටමක් දක්වා ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. වී අලෙවි මණ්ඩලයට අයත් ගබඩා සංඛ්‍යාව 2008 වසරේ 51ක්ව පැවති අතර 2013 වසර වන විට මෙට්‍රික් ටොන් 228,000 ක් ගබඩා ධාරිතාව සහිතව 219 දක්වා ඉහළ ගොස් තිබේ. කෙසේ නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රධාන නිෂ්පාදන දිස්ත්‍රික්කයන්හි කළ ගොවිපොළ මිල විශ්ලේෂණයේ දී පෙනී ගියේ අස්වැන්න ඉහළම කාලයන්හි වී නිෂ්පාදන මිල ස්ථාවරව පවත්වා ගැනීමට වී මිල දී ගැනීමේ වැඩසටහන අපොහොසත් වී ඇති බවයි.

අස්වැන්න උපරිම මාසවල 50%කට වඩා වැඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයන්හි වී නිෂ්පාදන මිල සහතික මිලට වඩා පහළින් පැවතිණ. විශේෂයෙන්ම අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කයන්හි මෙ තත්ත්වය පැවති අතර මෙම තත්ත්වය වී නිෂ්පාදනය කරන ප්‍රධාන දිස්ත්‍රික්කයන්හි අඩු වැඩි වශයෙන් දක්නට ලැබිණි.

ගොවීන්ට දිරියක් වෙමින් ප්‍රසම්පාදන වැඩසටහනින් පසුව වී මිල ඉහළ ගිය අතර එමඟින් ගුණාත්මකබවින් යුතු වී නිෂ්පාදනය කිරීම සඳහා ඔවුන්ව දිරි ගැන්විණි. මීට අමතරව රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා බොහොමයක් කන්නයන්වල දී අවම ආරක්ෂක තොග මට්ටමක් පවත්වා ගැනීමට වී අලෙවි මණ්ඩලයට හැකි වී තිබේ.

2012 සහ 2013 කාලය අතරතුර වී/ සහල් අලෙවි කිරීමේ ප්‍රධාන ක්‍රියාවලිය සමුපකාර තොග අලෙවි සැල් හරහා සිදු කෙරුණු අතර වී අලෙවි මණ්ඩලයට මෙම ක්‍රියාවලියෙන් විශාල පාඩුවක් සිදු විය. අවම පිරිවැයට ඉහළින් වී අලෙවි කිරීමට නොහැකි වීමත් පෞද්ගලික වී මෝල් හිමියන්ගෙන් අය විය යුතු මුදල් අය කර ගැනීමට අපොහොසත් වීම නිසාත් වී අලෙවි මණ්ඩලයට තම වියදම් පියවා ගැනීමට නොහැකි විය.

නිර්දේශ

ඉහත සඳහන් කළ ගැටලු සැලකිල්ලට ගැනීමේ දී වී/සහල් අලෙවිකරණ ක්‍රියාවලියේ දී වී අලෙවි මණ්ඩලයේ භූමිකාව නැවත සලකා බැලීම අවශ්‍ය වන අතර මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කර ගැනීම උදෙසා වී අලෙවි මණ්ඩලයෙහි ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුය යන අදහස මතුවේ.

මෙම වැදගත් විෂය ක්ෂේත්‍රයෙහි ප්‍රධාන පාර්ශවකරුවන් වන ගොවීන්ගේ අදහස් මෙම අධ්‍යයනයේ සාහිත්‍ය විමර්ශනයෙහි අන්තර්ගත නොවේ.

එබැවින්, බිම් මට්ටමේ ගැටලු හඳුනා ගැනීම සඳහා සවිස්තරාත්මක පර්යේෂණයක් අවශ්‍ය වන අතර වී අලෙවි මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස ඉහළ මට්ටමේ කමිටුවක් පත් කිරීමට මෙම අධ්‍යයනය මඟින් රජයට යෝජනා කෙරේ.

සිදු කෙරෙමින් පවතින අධ්‍යයන

01. දියර කිරි සහ පිටි කළ කිරි සඳහා පවතින පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ චර්යාවන්, රුචිකත්වයන් සහ ඉල්ලුම

| | | |
|---|---|---|
| පර්යේෂණ කණ්ඩායම | රුවිනි විදානපතිරණ | සම්බන්ධීකරණ නිලධාරි |
| | රෝෂිණී රඹුක්වැල්ල | සම පර්යේෂක |
| | ටී.ඒ.සී ප්‍රියංකර | සම පර්යේෂක |

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය

ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය නිෂ්පාදනය අතින් සහ අපනයන මට්ටම අතින් වාර්ෂික ඉහළ යාමක් පෙන්නුම් කරමින් ඉතා හොඳ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයින්ගේ දෛනික කිරි පරිභෝජන රටාවන් සහ රටේ පවතින ප්‍රජා විද්‍යාත්මක හා සමාජ ආර්ථික සාධක කෙරෙහි පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ චර්යාවන් ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව සිදු කෙරුණු පුළුල් අධ්‍යයනයන් හෝ ඒ පිළිබඳ පවතින දත්ත සීමා සහිතය.

ආනයනික කිරිපිටිවල DCD නම් රසායනිකය අන්තර්ගත වීමෙන් කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය 2013 වසරේ ඉතා අසීරු අඩියකට වැටුණි. කිරි නිෂ්පාදන මිල දී ගැනීම සඳහා වූ පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ චර්යාව, ඔවුන්ගේ ආකල්ප, අවශ්‍යතා සහ ඉල්ලුම කෙරෙහි මෙය තීරණාත්මක ලෙස බලපෑවේය. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ දී සමස්ත කිරිපිටි ආනයනය 16.9ක ප්‍රතිශතයකින් පහත වැටුණි. ආනයනික කිරිපිටිවල DCD නම් රසායනිකය අන්තර්ගත වීමෙන් පසු පාරිභෝගිකයෝ වඩ වඩාත් තම පරිභෝජනය සඳහා ආනයනික කිරිපිටි තෝරා ගැනීමේ දී සැලකිලිමත් වන්නට වූහ.

පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ චර්යාව, ඔවුන්ගේ රුචිකත්වයන්, ආකල්ප, අවශ්‍යතා සහ කිරි නිෂ්පාදනය සඳහා වන ඉල්ලුම ආදිය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු පැවතීම කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය කෙරෙහි බලපාන තීරණාත්මක සාධකයන් ලෙස සැලකේ. කෙසේ නමුත්, ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධයෙන් සැලකීමේ දී පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ චර්යාවන්, ආනයනික පිටි කිරිවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ඇති වූ අර්බුදකාරී තත්ත්වයෙන් පසුව ඒ සඳහා පවතින ඉල්ලුම් මට්ටම ආදිය පිළිබඳ තොරතුරු ඉතා අවම මට්ටමක පවතී.

පරිභෝජන රටාවන් හි වෙනස්කම් සහ පරිභෝජන ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණ ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන් සඳහා ඉතා වැදගත් මෙන් ම අත්‍යාවශ්‍ය වේ. කිරි නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම පිළිබඳ නිවැරදි විශ්ලේෂණයන් සහ කිරි නිෂ්පාදන සඳහා පවතින ඉල්ලුම පිළිබඳව වන ප්‍රශස්ත ඇස්තමේන්තු මඟින් ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ අනාගත වර්ධනයන් පිළිබඳ අනාවැකි පළ කිරීමට ඉවහල් වනු ඇත.

මෙම ක්ෂේත්‍රයේ දියුණුව කෙරෙහි වෙළඳපොළ සහ ඉල්ලුම ප්‍රධාන භූමිකාවක් ඉටු කරන බව පෙනෙන්නට ඇති නමුත් විවිධ නිෂ්පාදන විශේෂ සඳහා ඇති ඉල්ලුමේ හා රුචිකත්වයේ ස්වභාවය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සොයා ගත නොහැකිය. වර්ධනය වෙමින් පවතින වෙළඳපොළෙන් ප්‍රතිලාභ

ලැබීම පිණිස වෙළඳපොළ කේන්ද්‍රීය නිෂ්පාදන තීරණ ගැනීමේ දී එවැනි තොරතුරු නිෂ්පාදකයින්ට සහ වෙළඳපොළ ක්‍රියාකාරීන්ට අවශ්‍ය වේ. මෙම දැනුම් හිදැස පිරවීම සඳහා, දියර කිරි හා කිරි පිටි සඳහා ඇති රුචිකත්වය පිළිබඳ අවබෝධ කර ගැනීමට, පරිභෝජනයේ නව ප්‍රවණතා හඳුනා ගැනීමට සහ කිරි නිෂ්පාදනයේ සහ අලෙවි අවස්ථාවන් නිර්ණය කිරීම සඳහා පාරිභෝගිකයින්ගේ බලපෑම අවබෝධ කර ගැනීමට මෙම අධ්‍යයනය සිදු කරනු ලැබිණි.

අරමුණු :

මෙම අධ්‍යයනයේ සමස්ත අරමුණ වන්නේ පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ චර්යාවන්, නව වෙළඳපොළ ප්‍රවණතාවයන් සමඟ දියර කිරි සහ පිටි කිරි සඳහා පවතින රුචිකත්වයන් සහ ඉල්ලුම හඳුනා ගැනීම

1. දියර කිරි සහ කිරි පිටි සඳහා දැනට පවතින පරිභෝජන රටාවන්, මිල දී ගැනීමේ චර්යාවන් සහ රුචිකත්වයන් හඳුනා ගැනීම
2. කිරි පිටිවල ප්‍රමිතිය සම්බන්ධයෙන් මතු වූ ගැටලුව පාරිභෝගිකයින් පිටි කිරි මිල දී ගැනීමේ චර්යාවන්, රුචිකත්වයන් කෙරෙහි කළ බලපෑම සහ නව වෙළඳපොළ ප්‍රවණතා හඳුනා ගැනීම
3. දියර කිරි සහ කිරි පිටි මිල දී ගැනීම කෙරෙහි විවිධ සාධකයන්හි බලපෑම ආකෘතිගත කිරීම

මෙම අධ්‍යයනය කොළඹ, මහනුවර සහ මාතර යන දිස්ත්‍රික්කයන්හි සිදු කරන ලදී. අධ්‍යයනය සඳහා අවශ්‍ය කරන දත්ත කුටුම්භ 400ක් ඇසුරින් පෞද්ගලික සම්මුඛ සාකච්ඡා ලෙස සිදු කරන ලද අතර ඒ සඳහා ව්‍යුහගත සහ පූර්ව පරීක්ෂිත ප්‍රශ්නාවලියක් යොදා ගැනුණි.

## 2. ශ්‍රී ලංකාවේ විවිධ සහල් විශේෂ සඳහා පවතින පාරිභෝගික රුචිකත්වය

| | | |
|---|---|---|
| පර්යේෂණ කණ්ඩායම | : රෝෂිණි රඹුක්වැල්ල සම්බන්ධීකරණ නිලධාරිනි | |
| | දුමින්ද ප්‍රියදර්ශන | සම පර්යේෂක |
| | නාලක විජේසූරිය | සම පර්යේෂක |

විෂයපථය සහ අරමුණු

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය බත් වේ. ශ්‍රී ලංකාවේ සහල් වෙළඳපොළ සහල් වර්ග සහ ශ්‍රේණි රැසකින් සමන්විතය. විවිධ සහල් ප්‍රභේද පරිභෝජනයට ගැනීම තනි තනි පාරිභෝගිකයාගේ රුචිකත්වය මත තීරණය වේ. කුමන භාණ්ඩය කුමන ප්‍රමාණයකින් මිල දී ගන්නේ ද යන්න තීරණය කරන මූලික ආර්ථික ඒකකය පාරිභෝගිකයාය. වෙළඳපොළ උපාය මාර්ග සඳහා පාරිභෝගික පර්යේෂණ ඉතා වැදගත් වෙයි. මක් නිසාද යත්, කිසියම් නිෂ්පාදනයක් කෙරෙහි පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ චර්යාවන් සහ පාරිභෝගිකයින්ගේ රුචිකත්වයන් කෙරෙහි බලපෑම් ඇති කරන සාධක පිළිබඳ දැනුම වෙළඳපොළ කොටස ඉහළ දමා ගැනීමට ඉවහල් වෙයි.

වෙළඳපොළ තුළ කිසියම් නිෂ්පාදනයක් වාසි දායක ලෙස ස්ථානගත කිරීමට සහ යෝග්‍ය භාණ්ඩ යොමු කිරීමට පාරිභෝගිකයින්ගේ රුචිකත්වය අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව සහල්වලින් ස්වයංපෝෂිතය. මෙවැනි පරිසරයක් තුළ, අනාගත සහල් වෙළඳපොළ තුළ පාරිභෝගික රුචිකත්වය වැදගත් සාධකයක් වනු ඇත. නිෂ්පාදන ක්‍රියාවලියේ දී බීජ සුලභතාවය සහ පළිබෝධ සහ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව, අස්වැන්න, අස්වැන්න නෙළීමේ පහසුව වැනි භෝග විශේෂතා පිළිබඳ සැලකිල්ලට ගනිමින් ගොවීන් විසින් බීජ තෝරා ගැනීමට ගොවීහු කැමැත්තක් දක්වති. නමුත් පාරිභෝගිකයින්ගේ රුචිකත්වය මීට වඩා වෙනස් විය හැකිය.

සහල් ප්‍රභේද විශාල සංඛ්‍යාවක් වෙළඳපොළ තුළ දැකිය හැකි අතර ඒවායෙහි විවිධ ලක්ෂණ ඇති අතර විවිධ සහල් වර්ගයන්ට ඇති රුචිකත්වයන් ද විවිධ වේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් විවිධ දිස්ත්‍රික්කයන්හි විවිධ සහල් ප්‍රභේදයන්ගේ ඒක පුද්ගල පරිභෝජනය පිළිබඳ තොරතුරු රැස් කරනු ලබයි. නමුත් පාරිභෝගික රුචිකත්වයන් කෙරෙහි බලපාන සැබෑ හේතු එතුළින් හඳුනා ගත නොහැකිය. මෙම පර්යේෂණ අධ්‍යයනයෙන් එම හිදැස පිරවීම අපේ අපේක්ෂාවයි. තවද, විවිධ සහල් ප්‍රභේදයන් කෙරෙහි ඇති ඉල්ලුම පිළිබඳ හොඳ ඇස්තමේන්තුවක් සහ සහල් සඳහා පවතින රුචිකත්වය පිළිබඳ නිවැරදි විශ්ලේෂණයක් පැවතීම ශ්‍රී ලංකාවේ සහල් වෙළඳපොළෙහි අනාගත සංවර්ධනය පුරෝකථනය කිරීම සඳහා ඉවහල් වනු ඇත. එමෙන්ම අනාගතයේ බීජ වී නිෂ්පාදන වැඩසටහන නිවැරදි දිශානතිය කරා යොමු කිරීමට ද එය ඉවහල් වනු ඇත.

අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ විවිධ සහල් ප්‍රභේදයන් මිල දී ගැනීම සඳහා වන පාරිභෝගික චර්යාව සහ රුචිකත්වයන් අවබෝධ කර ගැනීමයි.

සුවිශේෂී අරමුණු වන්නේ

- විවිධ සහල් ප්‍රභේද සඳහා වන මිල දී ගැනීමේ චර්යාවන් සහ පරිභෝජන රටා හඳුනා ගැනීම
- පාරිභෝගික රුචිකත්වය තීරණය කරන නිර්ණායක දිස්ත්‍රික්ක අනුව ආකෘතියක් සැකසීම

3. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය : උපාය මාර්ග, ප්‍රතිඵල, බලපෑම් සහ අභියෝග

පර්යේෂණ කණ්ඩායම : ඉන්දිකා එදිරිසිංහ සම්බන්ධීකරණ නිලධාරී

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු

ශ්‍රී ලංකාවේ දරිද්‍රතා ගැටලුව ග්‍රාමීය, නාගරික සහ වතු යන ක්ෂේත්‍ර තුන ආශ්‍රිතවම දක්නට ලැබෙන්නකි. කෙසේ නමුත්, එහි බලපෑම වැඩියෙන්ම එල්ල වන්නේ ග්‍රාමීය සහ වතු ජනගහනය ආශ්‍රිතවයි. ජාතික දෘෂ්ටි කෝණයෙන් නාගරික දරිද්‍රතාවය දෙස බැලීමේ දී වඩාත් සතුටුදායක රූපරාමුවක් දැකිය හැකිය. ශ්‍රී ලංකාවේ අවම දරිද්‍රතා අනුපාතයක් දැකිය හැක්කේ නාගරික ක්ෂේත්‍රය ආශ්‍රිතවයි. සංඛ්‍යාත්මක වශයෙන් අඩු ප්‍රතිශතයක් වුව ද නාගරික දරිද්‍රතාවය යනු ශ්‍රී ලංකාවේ නගර ආශ්‍රිත සුවිශේෂී ගැටලුවකි. එබැවින්, දිළිඳුකම යනු ඉහත ක්ෂේත්‍ර තුනෙහිම දැකිය හැකි ගැටලුවකි. දරිද්‍රතා ගැටලුවට විසඳුම් සෙවීම පිණිස දිළිඳුකම පිටු දැකීමේ ජාතික වැඩසටහනක් වූ සමෘද්ධි වැඩසටහන 1995 වර්ෂයේ දී ආරම්භ කරනු ලැබිණි. එහි අරමුණ වූයේ තරුණයින්, කාන්තාවන් සහ වරප්‍රසාද නොලත් කණ්ඩායම්වල සමාජ ස්ථායීතාව ඉහළ දැමීම සඳහා ආර්ථික සහ සමාජීය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම තුළින් දිළිඳුකම පිටු දැකීමයි. 2015 වර්ෂය වන විට සමෘද්ධි වැඩසටහන සිය මෙහෙයුම් ආරම්භ කර 20 වසරක් සපුරයි. සමෘද්ධි වැඩසටහන ප්‍රවේශ තුනකින් ක්‍රියාත්මක වේ. ඒවා නම් සුරක්ෂිතතා ජාලය, ග්‍රාමීය සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය සහ බැංකුකරණය වේ. සහනාධාර සහ රක්ෂණ යෝජනා ක්‍රමය/ සමාජ සුභ සාධන සංරචකය අයත් වනුයේ සුරක්ෂිතතා ජාල ප්‍රවේශයටයි. ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශය යටිතල පහසුකම්, සමාජ සහ ජීවනෝපාය සංවර්ධන සංරචකයන්ගෙන් සමන්විත වන අතර තැන්පත් එකතු කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය සහ සමාජ සවිබල ගැන්වීමේ සංරචකයන් ක්ෂුද්‍ර මූල්‍ය සහ බැංකුකරණය යන ප්‍රවේශයට ඇතුළත් වේ.

මෙම අධ්‍යයනයෙන් ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයෙහි ඇති ජීවනෝපාය සංවර්ධන සංරචකය පිළිබඳව අවධානය යොමු කරයි. රජය විසින් මේ සඳහා සැලකිය යුතු මුදලක් වෙන් කරන බැවින් අනාගතයේ දී මෙම වැඩසටහන වැඩි දියුණු කිරීම පිණිස දිළිඳු ජනතාවගේ ජීවන මට්ටම ඉහළ දැමීම කෙරෙහි එහි දායකත්වය හඳුනා ගැනීම සහ මෙම ව්‍යවසායකයින්ගේ වර්ධනය හා සංවර්ධනය ගැටලු, බාධක හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. තවද, සමෘද්ධි වැඩසටහනෙහි මෙම සංරචකය පිළිබඳව ස්වාධීන ඇගයීමක් මෑත ඉතිහාසයේ සිදු කෙරී නැත. එසේම, අධ්‍යයනය සිදු කිරීම සඳහා ඉල්ලීම යොමුවන්නේ ද ඒ සඳහා මුලපිරුවන්ගෙන්මය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ සාර්ථකත්වයට හේතු වූ සාධක හඳුනා ගැනීමේ අරමුණින් සමෘද්ධි ව්‍යවසායකයින්ගේ වර්තමාන තත්ත්වය ඇගයීම සහ ග්‍රාමීය, නාගරික සහ වතු යන අංශවලට අදාළව දිළිඳුකම තුරන් කිරීම සඳහා මෙහි දායකත්වය හඳුනා ගැනීමයි.

4. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවාරයේ ලොකු ලූනු නිෂ්පාදන වැඩසටහනෙහි අනාගත විභවතා සහ ගැටලු

පර්යේෂණ කණ්ඩායම : පී.ජේ ජයමිණි චම්පිකා සම්බන්ධීකරණ නිලධාරිනි

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය හා අරමුණු

ලොකු ලූනු (*Allium cepa*), ශ්‍රී ලංකාවේ දිනපතා ආහාර වේල රසවත් කිරීමට ගන්නා කුළු බඩුවක් මෙන් ම එළවළුවක් ද වෙයි. වර්තමානය පිළිබඳ සැලකීමේ දී අවාරයේ (ජනවාරි සිට මාර්තු දක්වා වන මහ කන්නය) ලොකු ලූනු වගාව බොහෝවිට බීජ නිෂ්පාදනය අරමුණු කර ගෙන සිදුවන අතර එබැවින් ජාතික අවශ්‍යතාවය මුළුමනින්ම සපුරනුයේ යල (මැයි සිට අගෝස්තු දක්වා) කන්නයේ නිෂ්පාදනයෙනි. කෙසේ නමුත්, යල කන්නයේ නෙළනු ලබන අස්වැන්න ප්‍රමාණවත් වනුයේ ජාතික අවශ්‍යතාවයෙන් 35%ක් සැපිරීමට පමණි. කෙසේ නමුත්, මෙම ප්‍රමාණය 2016 දී 50%කින් ඉහළ දැමීමට රජය අපේක්ෂා කරන ලදී. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා රට තුළ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 55,000කින් පමණ එනම් හෙක්ටයාර 3500කට සමාන වගා වපසරියකින් (මහ කන්නයේ ඵලදායීතාවය යල කන්නයට සමාන බව උපකල්පනය කරමින්) නිෂ්පාදනය ඉහළ දැමිය යුතුය. ක්ෂේත්‍ර චාරිකා කිහිපයක් පැවැත්වීමෙන් පසු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන ඇති පරිදි පරිභෝජනය පිණිස අවාරයේ (මහ කන්නය- ජනවාරි සිට මාර්තු දක්වා) ලොකු ලූනු වගා කිරීමට ඉතාමත් යෝග්‍ය ප්‍රදේශයන් හඳුනා ගෙන ඇත්තේ හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කයන්ය. 2014 වර්ෂය තුළ හෙක්ටයාර 2000ක භූමි ප්‍රමාණයක් වගා කිරීම ඉලක්කය වුවත් 2014 මහ කන්නය අවසන් වන විටත් වගා කර තිබුණේ හෙක්ටයාර 350ක පමණි. එය ඉලක්කගත ප්‍රමාණයට වඩා ඉතා පහළ මට්ටමකි. සැලසුම් කරන ලද කාල රාමුව තුළ ජාතික ඉලක්කය සපුරා ගැනීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි ඉලක්කය ළඟා කර ගැනීම ඉතාමත් තීරණාත්මකය. එබැවින් වැඩසටහනේ ස්ථායිතාවය ළඟා කර ගැනීම සඳහා කෘෂි ආර්ථික යෝග්‍යතාවය පමණක් නොව සමාජ ආර්ථික ප්‍රතිග්‍රාහීතාව (පිළිගත හැකි බව) සහ මූල්‍යමය ස්වශක්තතාවය ද එකසේ වැදගත් වෙයි. එබැවින්, මෙම පර්යේෂණ අධ්‍යයනය මඟින් ලොකු ලූනු වගාව තවදුරටත් දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත කිරීම සඳහා ඇති සමාජ ආර්ථික බාධා හඳුනා ගැනීමට අපේක්ෂා කරයි.

ප්‍රධාන අරමුණ: හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවාරයේ ලොකු ලූනු නිෂ්පාදන වැඩසටහනෙහි අනාගත විභවතා සහ ගැටලු ඇගයීම

සුවිශේෂී අරමුණු:

1. රටේ ලොකු ලූනු නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවාරයේ ලොකු ලූනු නිෂ්පාදන වැඩසටහන කෙතරම් දුරට සාර්ථක වී ඇත්දැයි තක්සේරු කිරීම අවාරයේ ලොකු ලූනු නිෂ්පාදනයේ මූල්‍යමය ස්වශක්තතාව ඇගයීම
2. ලොකු ලූනු නිෂ්පාදන වැඩසටහන නිසා දිස්ත්‍රික්කයේ ඉඩම් භාවිත රටාවේ සිදු වී ඇති වෙනස්කම් සහ බෝග වගා රටාවන් පිළිබඳ පුරෝකථනය කිරීමට

3. ලොකු ලූනු අස්වනු කාලයේ අස්වනු තව දුරටත් ව්‍යාප්ත කිරීමට පවතින බාධක අධ්‍යයනය කිරීමට
4. වැඩසටහන දීර්ඝ කාලීන වශයෙන් ස්ථායීව පවත්වා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

වර්තමාන ප්‍රගතිය

බෙරලිහෙල, වීරවිල, අම්බලන්තොට, බඳගිරිය, ලූනාම, යෝධ කන්ඩිය, මීගහජඳුර බටහිර, මීගහජඳුර නැගෙනහිර සහ වීරකැටිය යන තෝරා ගත් ගොවිජන සේවා බල ප්‍රදේශ තුළ 2013 මහ කන්නයේ හෝ 2014 මහ කන්නයේ යන දෙකින් එකක ලොකු ලූනු වගාවෙහි නිරත වූ සහ ලොකු ලූනු වගා නොකළ ලොකු ලූනු ගොවීන් කාණ්ඩ දෙක ඇසුරින් සිදු කළ නියැදි සමීක්ෂණයක් තුළින් ප්‍රාථමික දත්ත එක්රැස් කර ගන්නා ලදී. සමස්ත නියැදිය ගොවීන් 280කගෙන් සමන්විත විය. දත්ත විශ්ලේෂණය ද අවසන් කර ඇති අතර වාර්තාව ලිවීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

## මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන්වල අරමුණ වන්නේ ගොවිජන සේවා සහ ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම්හි නිරත වී සිටින පුද්ගලයින්ගේ ආකල්ප, කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සහ එමඟින් ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය වර්ධනය කිරීමයි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුහුණු වැඩසටහන්හි සේවාලාභී පිරිස ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම්වල නිරත වී සිටින රජයේ සහ රජයේ නොවන ආයතනවල ක්ෂේත්‍ර නිලධාරීන්, ඉහළ නිලධාරීන්ගේ සිට උසස් නිලධාරීන් දක්වා වූ පුළුල් පරාසයක පිරිස සහ ගොවි ප්‍රජාව දක්වා ව්‍යාප්ත වී සිටිති.

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් පහත සඳහන් ආකාරයට ව්‍යුහගත වී ඇත.

i. ගොවි ජනතාවගේ අවශ්‍යතාවන්ට යෝග්‍ය පරිදි පුහුණු වැඩසටහන් සකස් කිරීම, සංවිධානය කිරීම, සම්බන්ධීකරණය සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ii. ගොවිජන ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ ආයතනවල ඉල්ලීම පරිදි පුහුණු වැඩසටහන් සකස් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම, මෙන්ම ඒ ආශ්‍රිත ක්‍රියාබද්ධ පර්යේෂණ පැවැත්වීම.

iii. අනෙකුත් ආයතනවල ඉල්ලීම මත පුහුණු විශේෂඥයින් ලබා දීම.

iv. ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාබද්ධ පර්යේෂණ නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ජාතික සහ අන්තර්ජාතික පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම සහ අනෙකුත් ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම ද ප්‍රමුඛ වේ. මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් 2015 වර්ෂයේ දිවයින පුරා ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් පහත දැක්වේ.

### 01. ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන

පර්යේෂණ කණ්ඩායම :

ආර්.එල්.එන්. ජයතිස්ස මහතා සහය අධි පර්යේෂක (සම්බන්ධීකරණ නිලධාරී)
එස්.එම්.ඒ. සමරකෝන් මහතා අංශ ප්‍රධානී/ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය(සම්බන්ධීකරණ නිලධාරී)
පී.සී.ජේ. ද සිල්වා මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එච්.එම්.ජේ.කේ. හේරත් මහතා -ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එස්. ඇපාසිංහ මහතා - පර්යේෂණ නිලධාරී

කඩිනම් ගැමි විමසුම් ප්‍රවේශය සහ සහභාගීත්ව ගැමි විමසුම් ප්‍රවේශය (PRA) යනු
ග්‍රාමීය තත්ත්වයන් පිළිබඳව ඉතාමත් ඉක්මනින් සහ අඩු වියදමකින් වඩාත් නිවැරදි සහ යාවත්කාලීන දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම සඳහා භාවිතා කළ හැකි සාපේක්ෂව ඉතාමත් නව ශිල්ප ක්‍රමයන් වේ.

මෙම ක්‍රමයන් දත්ත එක්රැස් කිරීමට පමණක් නොව සංවර්ධන ව්‍යාපෘතීන්හි ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා ඇගයීම් ආදී විවිධ අදියර සාර්ථක ලෙස අවසන් කිරීම සඳහා ද සාර්ථක ලෙස භාවිතා කෙරේ.

සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ජනතාවගේ සහභාගීත්වය ලබා ගැනීමේ ජනප්‍රිය විධික්‍රමයක් බවට සහභාගීත්ව ගැමි විමසුම පත් වී තිබේ. එම අර්ථයෙන් මූලිකවම එය ජනතාවගේ අදහස්, ආකල්ප සහ අභිලාශයන් දැන ගැනීම සඳහා මූලිකවම ද , දෙවනුව බලගැන්වීම සඳහා ද වශයෙන් ක්‍රියාත්මක වේ. එබැවින් කඩිනම් ගැමි විමසුම් ප්‍රවේශය සහ සහභාගීත්ව ගැමි විමසුම් ප්‍රවේශයයන් භාවිතා කිරීම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා දීම ග්‍රාමීය සංවර්ධනයෙහි නිරතව සිටින සියලුම දෙනාට ඉතාමත් ප්‍රතිඵලදායක වනු ඇත.

මෙම පුහුණු වැඩසටහනේ මූලික අරමුණ සහභාගිවන්නන්ට ජනතා සහභාගීත්වයේ වටිනාකම අවබෝධ කර දීමයි. දේශීය මට්ටමේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී මෙන්ම කඩිනම් ගැමි විමසුම් ප්‍රවේශය සහ සහභාගීත්ව ගැමි විමසුම් ප්‍රවේශ විධි ක්‍රම පවත්වා ගෙන යාමට ඇති හැකියාව හා දැනුම හා කුසලතා තුළින් අපේක්ෂිත ඉලක්ක ළඟ කර ගැනීමට මෙමඟින් පුහුණුවක් ලැබේ.

2015 වර්ෂය තුළ සංවිධානය කරන ලද සමස්ත වැඩසටහන් සංඛ්‍යාව එකක් වන අතර ප්‍රතිලාභී ගොවීන් 30දෙනෙකුට පුහුණුව ලබා දුනි. මෙම වැඩසටහනේ මූලික අරමුණ වූයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තෝරා ගත් ප්‍රතිලාභීන් පිරිසකට ස්වභාවික සම්පත් කළමනාකරණ ආදර්ශ ගම්මානය පිළිබඳ අවබෝධයක් ලබා දීම හා ස්වභාවික සම්පත් කළමනාකරණ ආදර්ශ ගම්මානයකට ප්‍රජා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමයි. එය ප්‍රදේශය තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.

02 සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන

පුහුණු කණ්ඩායම :

එස්.එම්.ඒ සමරකෝන් මහතා - අංශ ප්‍රධානී / මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය (සම්බන්ධීකරණ නිලධාරී)
පී.සී.ජේ ද සිල්වා මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී / මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය (සහකාර සම්බන්ධීකරණ නිලධාරී)
එච්.එම්.ජේ.කේ හේරත් මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එච්.ජේ.සී ජයසූරිය මහතා - පර්යේෂණ නිලධාරී /EWRM

ඕනෑම ග්‍රාමීය සංවර්ධන වැඩසටහනකට ජනතාවගේ උපරිම දායකත්වය ලබා ගැනීම සඳහා එහි ප්‍රතිලාභීන්ට ක්‍රියාකාරී ලෙස සංවර්ධන ක්‍රියාවලියට සහභාගී වීම සඳහා අවස්ථාව ලබා දිය යුතුය. මෙම ග්‍රාම සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන අරමුණ තවදුරටත් සංවර්ධනය සඳහා බලපාන සාධක පිළිබඳව ප්‍රජාවට අවබෝධයක් ලබා දීමයි.

මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන්ම නිර්මාණය කළේ සමාජ සජීවීකාරකයින් ලෙස ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්වලට දායක වී සිටින නිලධාරීන් හා කෘෂිකර්ම නිලධාරීන් සඳහාය. මෙම වැඩසටහනේ අරමුණ සහභාගිවන්නන්ගේ සහභාගීත්ව සංවර්ධනය සහ සමාජ සජීවීකරණය පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ඉහළ දැමීම සහ ශක්තිමත් කිරීමයි.

2015 වර්ෂය තුළ එක් වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුබද්ධ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආර්ථික සංවර්ධන නිලධාරීන් 40 දෙනෙකු මේ යටතේ පුහුණුව කෙරිණ.

03.“නිරෝගී පරපුරක් උදෙසා කෘෂිකර්මාන්තය” එක් දින පුහුණු වැඩසටහන

පුහුණු කණ්ඩායම : එස්.එම්.ජී සමරකෝන් මහතා - අංශ ප්‍රධානී / මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය (සම්බන්ධීකරණ නිලධාරී)
පී.සී.ජේ ද සිල්වා මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී / මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය (සහකාර සම්බන්ධීකරණ නිලධාරී)
එච්.එම්.ජේ.කේ හේරත් මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී/ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

වර්තමානයේ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට මුහුණ දීමට සිදු වී ඇති ප්‍රධාන අභියෝගයක් වන්නේ අධික කෘෂි රසායන භාවිතා කිරීම හේතුවෙන් උද්ගත වී ඇති සෞඛ්‍ය සහ පාරිසරික ගැටලුය. දිවයිනේ ප්‍රදේශ රැසක නිධන්ගත වකුගඩු රෝගය සහ හඳුනා නොගත් තවත් රෝග පැතිර යමින් පවතී. එබැවින් ප්‍රජාවන් අතර සමාජයීය සහ ආර්ථික ගැටලු ඇති වීමේ ඉහළ ප්‍රවණතාවයක් තිබේ.

අනුරාධපුර, පොලොන්නරුව,හම්බන්තොට,කුරුණෑගල සහ රටේ බොහොමයක් ප්‍රදේශවල පැතිරී ඇති නිධන්ගත වකුගඩු රෝගය සෞඛ්‍ය,ආර්ථික සහ සමාජයීය ගැටලු රැසක් කෘෂිකාර්මික ප්‍රජාවන් තුළ ඇති කර තිබේ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් හඳුනා නොගත් වකුගඩු රෝගයට ගොදුරු වූ පවුල්වල සමාජ ආර්ථික බලපෑම පිළිබඳ පර්යේෂණයක් සිදු කළ අතර එහි බලපෑම අවම කර ගැනීම පිණිස යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබේ. කෘෂි රසායන භාවිතය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම, මිනිස් සෞඛ්‍යයට කෘෂි රසායනයන්හි බලපෑම, වකුගඩු රෝගයේ පූර්ව රෝග ලක්ෂණ සහ මුල්ම අදියරේ දී රෝගය හඳුනා ගැනීමේ වැදගත්කම යනාදිය මෙම අධ්‍යයනයේ සොයා ගැනීම්වලට ඇතුළත්ය.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ විශේෂ අවධානය ද වකුගඩු රෝගය සම්බන්ධයෙන් යොමු වී තිබේ. එබැවින්, නිරෝගී පරපුරක් බිහි කිරීම හා කෘෂිකර්මාන්තයේන උපරිම ප්‍රයෝජන ලැබීම පිණිස ගොවීන් සහ ගොවි සංවිධාන දැනුවත් කිරීම කාලීන අවශ්‍යතාවයකි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් එම අරමුණ සපුරා ගැනීම සඳහා සංවිධානය කරන ලද්දකි.

මෙම එක් දින දැනුවත් කිරීමේ වැඩසටහනෙහි අරමුණ වූයේ ගොවි සංවිධාන නායකයින් සවිබල ගැන්වීම සහ කෘෂිකර්මානත්යේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම පිණිස නිරෝගී ගොවි පරම්පරාවක් බිහි කිරීම සඳහා ගොවි සංවිධාන ශක්තිමත් කිරීමයි.

2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 39කි. මෙම වැඩසටහන අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි පමණක් ක්‍රියාත්මක කරනු ලැබිණි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ වැඩසටහන් පිළිබඳ විස්තර

| ගොවිජන සේවා මධ්‍යස්ථානය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූවන් ගණන |
|---|---|---|
| පදවිය<br>කැබිලිගොල්ලෑව<br>ඇතාකඩ<br>පූනාව | 04 | 122<br>88<br>72<br>82 |
| මැදවච්චිය<br>රඹෑවැව<br>පරංගියා වාඩිය<br>හොරොව්පතාන<br>කපුගොල්ලෑව | 05 | 122<br>58<br>74<br>60<br>104 |
| කහටගස්දිගිලිය<br>රත්මල්ගහවැව<br>තන්ත්‍රිමලේ<br>විලච්චිය | 04 | 59<br>89<br>63<br>50 |
| ගම්මිරිගස්වැව<br>රනෝරාව<br>නොච්චියාගම<br>ඇලයාපත්තුව | 04 | 115<br>40<br>35<br>58 |
| රාජාංගණය | 01 | 90 |
| මඩාටුගම<br>මුරියා කඩවත<br>පලුගස්වැව<br>කැකිරාව | 04 | 75<br>110<br>88<br>85 |
| කෝන්වැව<br>ගලෙන් බිඳුනු වැව<br>තිරප්පනේ<br>මරදන්කඩවල | 04 | 75<br>140<br>63<br>112 |
| එකතුව | 26 | 2149 |

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ වැඩසටහන් පිළිබඳ විස්තර

| ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය | වැඩසටහන් ගණන | සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|---|
| බකමූණ<br>හිඟුරක්ගොඩ<br>සේවාගම<br>සිරිපුර :<br>මනම්පිටිය | 05 | 80<br>56<br>103<br>65<br>40 |
| වැලිකන්ද<br>නව නගරය<br>ගිරිතලේ<br>පුලස්තිගම | 04 | 67<br>35<br>94<br>108 |
| අඹගස්වැව<br>ගල් අමුණ<br>මැදිරිගිරිය<br>මැදිරිගිරිය/අඹගස්වැව | 04 | 95<br>105<br>97<br>90 |
| එකතුව | 13 | 935 |

වැඩසටහනේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සඳහා අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ගොවිජන කාර්යාලවල පූර්ණ සහය ලැබුණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ලබා දීම සිදු කෙරුණි.

**04.** ගොවිජන සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන

පර්යේෂණ කණ්ඩායම : එච්.එම්.ජේ.කේ හේරත් – ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය (සම්බන්ධීකරණ නිලධාරී)

මෙම පුහුණු වැඩසටහන තොරතුරු තාක්ෂණය සමඟ ඒකාබද්ධව ග්‍රාමීය සංවර්ධනය ඉහළ නැංවීම පිණිස නිර්මාණය කර තිබේ.පරිපාලන මෙහෙයුම්වල දී පුළුල් තාක්ෂණික දායකත්වයක් ලබා දීමට හා රටේ පොදු සංවර්ධනය ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

මෙම පුහුණු වැඩසටහනෙහි මූලික අරමුණ වන්නේ කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වැඩසටහනට සහභාගීවන්නන් තුළ වර්ධනය කිරීමයි.

2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන් සංඛ්‍යාව තුනක් වූ අතර නිලධාරීන් 88 දෙනෙකු පුහුණු කරනු ලැබිණි.

වැඩසටහන පිළිබඳ විස්තර

| අංකය | සහභාගී වූවන් | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | ගන්නොරුව කෘෂිකාර්මික විද්‍යාලයේ කථිකාචාර්යවරුන් | 01 | 18 |
| 02. | මාතලේ අපනයන කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ නිලධාරීන් | 01 | 32 |
| 03. | පුත්තලම දිස්ත්‍රික් සැලසුම් කාර්යාලයේ සැලසුම් නිලධාරීන් | 01 | 28 |
| | එකතුව | 03 | 88 |

ඉල්ලීම් සිදු කළ වෙනත් ආයතනවලට සැපයූ පුහුණු විශේෂඥයින්

| අංකය | නිලධාරියා | පැවැත්වූ දේශන | දේශන සංඛ්‍යාව | ආයතනය |
|---|---|---|---|---|
| 01. | එච්.එම්.ජේ.කේ හේරත් | ගොවිජන සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම | 02 | මාතලේ අපනයන කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව |
| 02. | එච්.එම්.ජේ.කේ හේරත් | - එම- | 03 | දිස්ත්‍රික් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව , මහනුවර |
| 03. | පී.සී.ජේ ද සිල්වා | කෘෂිකාර්මික වකුගඩු රෝගයේ ගැටලු සහ අභියෝග | 01 | ගොවි සංවිධානය, පදවිය, අනුරාධපුර |
| 04. | එස්.එම්.ඒ සමරකෝන් | සවිබලකරණය සහ සමාජ සජීවීකරණය | 01 | සී.අයි.සී සමාගම, කොළඹ |
| 05. | එච්.ජේ.සී ජයසූරිය | ව්‍යාප්ති නිලධාරියාගේ කාර්යභාරය | 01 | සී.අයි.සී සමාගම, කොළඹ |

සිදු කෙරෙමින් පවතින අධ්‍යයන

01. මඩකලපුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රතිලාභී කෘෂිකාර්මික කුටුම්භයන්හි ආදායම ඉහළ නැංවීම සඳහා ඇති විභවතා සොයා බැලීම

**පර්යේෂණ කණ්ඩායම** **පී.සී.ජේ. ද සිල්වා**
**එස්.එම්.ඒ සමරකෝන්** **සම්බන්ධීකරණ නිලධාරී**

මූල්‍ය ප්‍රභවය ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු

මඩකලපුව දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ඵලදායිත්වය දේශගුණික සාධක සහ අනෙකුත් කෘෂි ආර්ථික සාධක හේතුවෙන් පහළ මට්ටමක පවතියි. දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් බහුතරයකගේ ආදායම දරිද්‍රතා රේඛාවේ පහළින් රැඳී පැවතීමට මෙය හේතු වී ඇතැයි සැලකිය හැකිය. එසේම කෘෂිකාර්මික කුටුම්භයන්හි ආදායම් ප්‍රභවයන් අඩුවෙන් විවිධාංගීකරණය වී පැවතීම ද මේ සඳහා දායක වී ඇතැයි පෙනෙන්නට තිබේ. ආදායම් මාර්ග අඩුවෙන් විවිධාංගීකරණය වීම ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා කෘෂිකාර්මික ප්‍රදේශවල පවතින දිළිඳුකම කෙරෙහි ප්‍රධාන සාධකය ලෙසට සඳහන් කළ හැකිය. උදාහරණයක් ලෙස කොළඹ සහ ගම්පහ වැනි වඩාත් නාගරීකරණය වූ සහ කෘෂිකර්මාන්තය අවම දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතාව අඩු මට්ටමක පවතින විට අඩුවෙන් නාගරීකරණය වූ සහ කෘෂිකාර්මික දිස්ත්‍රික්කයන් වන මොණරාගල සහ මඩකලපුව වැනි දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතාව අවම මට්ටමක පවතියි. එසේම මීට ප්‍රතිවිරෝධී ලෙස එකම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ අතර ද මෙම තත්ත්වය දැකිය හැකිය. උදාහරණයක් ලෙස මඩකලපුව දිස්ත්‍රික්කයේ මාන්මුනායි බටහිර සහ කෝරලෙයි පට්ටු දකුණ වැනි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි පිළිවෙළින් **45.1%** සහ **37.7%** වැනි ඉතා ඉහළ දරිද්‍රතා අනුපාතයක් වාර්තා වන විට ඉතා නාගරීකරණය වූ කාත්තන්කුඩි වැනි ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයක ඒක පුද්ගල දරිද්‍රතා අගය **(Poverty Head Count Index) 2012/2013** ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත අනුව **5.26%**කි.

තවද, දශක තුනක් පැවති යුද්ධය හේතුවෙන් දිස්ත්‍රික්කය තුළ සමාජ ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධනය නිසැකවම අවහිර වී තිබේ. ජීවනෝපාය පිළිබඳ සැලකීමේ දී යුද්ධය විසින් නව ආදායම් මාර්ග ඇතිවීමට ඉඩ අහුරා ඇති වා පමණක් නොව එමඟින් සෘජුව හෝ වක්‍රව ජනතාව ඔවුන්ගේ පාරම්පරික ජීවනෝපායන්ගෙන් ඈත් කිරීම ද සිදු විය. මඩකලපුව දිස්ත්‍රික්කයේ පවතින ඉහළ දරිද්‍රතා මට්ටම සහ අඩු ආදායම් තත්ත්වය කෙරෙහි යුද්ධයේ ද බලපෑමක් පවතී.

කෘෂිකාර්මික ක්ෂේත්‍රය කෙරෙහි ද යුද්ධයෙන් තීරණාත්මක බලපෑමක් ඇති කර තිබේ. ගොවීන් වෙත නව දැනුම හා තාක්ෂණය සම්ප්‍රේෂණය කිරීම මුළුමනින්ම පාහේ අවහිර වී තිබේ. යුද්ධය පැවැති කාල පරිච්ඡේදය තුළ ගොවීන්ට මෙන් ම නිලධාරීන් යන දෙපිරිසටම කුසලතා සංවර්ධනයට හෝ පුහුණු සහ වෙනත් දැනුම ලබා ගැනීමේ මාර්ග හරහා නව දැනුම ලබා ගැනීම සඳහා වන ප්‍රවේශයට ඇති අවස්ථා කෙරෙහි එය අහිතකර ලෙස බලපා තිබේ. තවද දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ප්‍රජාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ බලධාරීන්ට අවශ්‍ය වන නව දැනුම සහ තොරතුරු ගවේෂණය කරන පර්යේෂණ අධ්‍යයනයන් මෙම දිස්ත්‍රික්කය තුළ වසර ගණනාවකින් සිදු කෙරී ඇති බවක් පෙනෙන්නට නැත.

මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉහළ දරිද්‍රතා මට්ටමක් ඇති කිරීමට හේතු වෙමින් කෘෂිකාර්මික කුටුම්භයන් හි ආදායම අඩු මට්ටමක පැවතීම කෙරෙහි ඉහත සියලු කරුණු පොදුවේ සෘජුව හෝ වක්‍රව බල පා තිබේ. දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් බහුතරයකගේ සමාජ ආර්ථික සුභ සිද්ධිය කෙරෙහි බලපාන කරුණක් වන බැවින් මඩකලපුව දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කුටුම්භයන්හි ආදායම් මට්ටම ඉහළ දැමීම පිණිස කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍යය. මන්ද යත්, කෘෂිකාර්මික කුටුම්භයන්හි ආදායම ඉහළ දැමීම යනු දිස්ත්‍රික්කයේ බහුතරයකගේ කුටුම්භ ආදායම ඉහළ දැමීම වන බැවිනි. එබැවින් දිස්ත්‍රික්කයේ පවතින දරිද්‍රතාව වැනි කේන්ද්‍රීය ගැටලුවකට විසඳුම් සෙවීම සෘජුව අරමුණු කර ගත් මෙවැනි ස්වභාවයේ පර්යේෂණ සිදු කිරීම ඉතා වැදගත් වනු ඇත.

ඉහත සඳහන් කළ පරිදි, මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් බහුතරයක් දිළිඳුකමින් පෙළෙන අතර බහුතරයක් තම ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තයේ නිරත වී සිටිති. දිස්ත්‍රික්කයේ දිළිඳුකම අවම කිරීම සඳහා කෘෂිකාර්මික කුටුම්භයන්හි ආදායම ඉහළ දැමීම ඉතා වැදගත් වේ. එබැවින් මෙම අධ්‍යයනයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කුටුම්භයන්හි ආදායම ඉහළ දැමීම සඳහා ඇති විභවතාවයන් මොනවාද යන්න සොයා බැලීම සිදු කරයි.

**මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රතිලාභී කෘෂිකාර්මික කුටුම්භයන්හි ආදායම ඉහළ නැංවීමේ විභවතා සොයා බැලීමයි.**

වෙනත් අරමුණු

- කුටුම්භ වියදම ඇස්තමේන්තුගත කිරීම
- කුටුම්භයන් විසින් වගා කරන ප්‍රධාන බෝගයන්හි නිෂ්පාදන වියදම ගණනය කිරීම
- ගොවීන් විසින් මුහුණ දෙන කෘෂිකර්මාන්තයට අදාළ ගැටලු සොයා බැලීම
- විකල්ප ආදායම් මාර්ග කෙරෙහි කුටුම්භයන්හි රුචිකත්වය සහ විභවතාවය සොයා බැලීම
- විකල්ප ආදායම් මාර්ග සඳහා ප්‍රදේශයේ පවතින අවස්ථා සොයා බැලීම

**වර්තමාන ප්‍රගතිය : දත්ත විශ්ලේෂණය සිදු කරමින් පවතී.**

## වෙනත් ක්‍රියාකාරකම්

### 01. ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්

ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා විසින් 2014 ජූලි 05 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පැවති අන්තර්ජාතික පර්යේෂණ සැසියක් සඳහා 'පෙර අස්වනු භාණ්ඩ අලෙවිය සඳහා පෙර ගිවිසුම් ක්‍රමය : ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු සඳහා පෙර ගිවිසුම් ක්‍රමය' යන මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එච් ශාන්ත මහතා ශ්‍රී ලංකාවේ කඳුකර කලාපයේ උස් බිම් බෝග වගා පද්ධතියේ වාර්ෂික පාංශු හානියේ අනුපාතය තක්සේරු කිරීම මැයින් ජපානයේ සුකුබා හි පැවති නිවර්තන කෘෂිකර්මය සහ සංවර්ධනය පිළිබඳ වාර්ෂික සමුළුවට 2015 මාර්තු 14-15 යන දෙදින පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

පර්යේෂණ නිල්ධාරී චින්තක ජයසූරිය මහතා විසින් 'ශ්‍රී ලංකාවේ එළවළු ගොවීන් අතර ඒකාබද්ධ පළිබෝධ පාලන භාවිතාවන් සහ ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම භාවිතා කිරීමට බලපාන සාධක' පිළිබඳව පර්යේෂණ පත්‍රිකාවක්2015 නොවැම්බර් 19 සහ 20 යන දිනවල සබරගමුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ අන්තර්ජාතික සම්මේලනයටඉදිරිපත් කරනු ලැබීය.

### 02. කමිටු උපදේශකත්වය

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ජී.ජී.ද.ඩබ්.එල් සමරසිංහ මිය ශ්‍රී ලංකා ජල සංසදයේ විධායක කමිටු සාමාජිකයෙකු ලෙස 2015 සිට කටයුතු කරමින් සිටියි.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ජී.ජී.ද.ඩබ්.එල් සමරසිංහ මිය පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබූ විභවතා සහිත ක්ෂේත්‍රයන් පිළිබඳ ජාතික වශයෙන් අරමුණු කර ගත් දායකත්වයන් පිළිබඳව උපදේශනාත්මක රැස්වීමට සහභාගී වූවාය.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කළ 2013 , 2014 වර්ෂ සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නව නිපැයුම් සඳහා වන ජනාධිපති සම්මාන පිරිනැමීම පිණිස ඇගයීම් සිදු කරන ජූරි කමිටුවේ සාමාජිකයෙකු ලෙස ඩබ්.එච්.ඒ ශාන්ත මහතා කටයුතු කර තිබේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කළ 2013 , 2014 වර්ෂ සඳහා ආහාර තාක්ෂණ ක්ෂේත්‍රයේ නව නිපැයුම් සඳහා වන ජනාධිපති සම්මාන පිරිනැමීම පිණිස ඇගයීම් සිදු කරන ජූරි කමිටුවේ සාමාජිකයෙකු ලෙස ඩබ්.එච්.ඒ ශාන්ත මහතා කටයුතු කර තිබේ.

එච්.ජේ.සී ජයසූරිය මහතා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කළ ශ්‍රී ලංකාව සඳහා නියං අවදානම් අවම කිරීමේ උපක්‍රම සහ සැලසුම් සංවර්ධනය කිරීමේ තාක්ෂණික මෙහෙයුම් කමිටුවට සහභාගී විය.

### 03. විශේෂ වාර්තා

පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා විසින් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීම සඳහා '2014 ජනවාරි කාලය තුළ සහල් මිල අසාමාන්‍ය ලෙස ඉහළ යාමට මූල හේතු යන ශීර්ෂයෙන් වාර්තාවක් සකස් කළේය.

පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම පිණිස 'සහල් වෙළඳපොළෙහි වර්තමාන තත්ත්වය' නමින් වාර්තාවක් 2014 දෙසැම්බර් මාසයේ ඉදිරිපත් කළේය.

## 04. පුහුණු වීම්

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එස්.ඇපාසිංහ මහතා කොත්මලේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ සහභාගීත්ව ගැමි ප්‍රවේශය වැඩසටහන සඳහා සම්පත් දායකයෙකු ලෙස 2015 සැප්තැම්බර් 21 සිට 23 දින දක්වා දායක විය.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එස්.ඇපාසිංහ මහතා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී 2015 නොවැම්බර් මස පැවති ඉඟුරු සහ කහ නිෂ්පාදනයේ වර්තමාන තත්ත්වය සහ ගැටලු පිළිබඳ ව වූ ප්‍රතිපත්ති සාකච්ඡාවකට දායක විය.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ජී.ජී.ද.ඩබ්.එල් සමරසිංහ මිය, පර්යේෂණ නිලධාරිනී එම්.ටී පද්මජානි සහ පර්යේෂණ නිලධාරී චින්තක ජයසූරිය මහතා යන පිරිස විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා කොළඹ විශ්වවිද්‍යාලය ඒකාබද්ධව පැවැත්වීමට යෝජිත කෘෂිකාර්මික ආර්ථික විද්‍යා උපාධි වැඩසටහන සඳහා පාඨමාලා මොඩියුල සකස් කිරීම සඳහා සහභාගී වූහ.

පර්යේෂණ නිලධාරී චින්තක ජයසූරිය මහතා නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ බිම් මට්ටමේ නිලධාරීන් වෙනුවෙන් පැවැත් වූ සමාජ සජීවිකරණය පිළිබඳ පුහුණු වැඩසටහනට සම්පත් දායකයෙකු ලෙස සහභාගී විය.
පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා විෂයය හදාරන තුන්වන වසර ශාස්ත්‍රවේදී සිසුන්ට සහස්‍ර සංවර්ධන ඉලක්ක පිළිබඳව දේශනයක් සිදු කරන ලදී.

පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා විසින් 'ශ්‍රී ලංකාවේ වී/සහල් වෙළඳපොළ සංවිධානය සහ මෙහෙයුම' පිළිබඳව දේශනයක් වයඹ පළාතේ කෘෂිකර්ම නිලධාරීන්, කෘෂිකාර්මික උපදේශකයින් සහ අනෙකුත් අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් වෙත 2014 ජුනි මාසයේ පවත්වනු ලැබීය. එම දේශනය අලෙවි ව්‍යාප්ති පුහුණු වැඩසටහන යටතේ පැවැත්විණි.

## සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය

මෙම ඒකකය කෘෂිකාර්මික දත්ත බැංකුවකින් සහ දත්ත සැකසුම් ඒකකයකින් සමන්විතය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අදාළ වන සමාජ විද්‍යා පර්යේෂණ සැලසුම් කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා අවශ්‍ය තොරතුරු සැපයීම පිණිස දත්ත බැංකුව ස්ථාපනය කර ඇත. දත්ත බැංකුව පිහිටුවීමේ මූලික අරමුණු වන්නේ,

1. දැනට පවතින කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ දත්ත ඒවා අවශ්‍යවන්නන්හට පහසුවෙන් ලබා ගත හැකි වනසේ එකම ස්ථානයක තැන්පත් කිරීම.
2. සියලුම තොරතුරු එකම ස්ථානයක තැන්පත් කිරීම තුළින් ඒවායෙහි අඩුපාඩු සහ නව දත්තයන්හි අවශ්‍යතාවය හඳුනාගෙන ඒවා යාවත්කාලීන කිරීම
3. පර්යේෂණ ව්‍යාපෘති මඟින් රැස් කරගන්නා දත්ත ඒවායේ මූලික අරමුණුවලට අමතරව සමාජ විද්‍යා පර්යේෂකයන් හට අවශ්‍ය වටිනා සම්පත් ලෙස භාවිතා කළ හැකිවීම තුළින් එම දත්තවල ගුණාත්මකභාවය ඉහළ නංවා වැඩි වටිනාකමකින් යුතු තොරතුරු සමුදායක් බවට පත් කිරීම.

විවිධ වූ මූලාශ්‍ර මඟින් තොරතුරු ලබා ගන්නා සමාජ විද්‍යා පර්යේෂන වටපිටාවක් තුළ දත්ත බැංකුව ස්ථාපනය කර ඇත. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අප විසින් දත්ත එකතු කරනු ලබන ප්‍රධාන මූලාශ්‍ර වේ.

දත්ත බැංකුවට අදාළ කාර්යයන් පහත පරිදි කොටස් 06කට වර්ගීකරණය කළ හැකිය.

1. දත්ත එකතු කිරීම
2. කේතකරණය
3. සත්‍යෙක්ෂණය
4. ගබඩා කිරීම
5. තොරතුරු නැවත ලබා ගැනීම
6. විශ්ලේෂණය

ඉහත දක්වා ඇති මූලාශ්‍රවලින් මෙන්ම, ඒවායෙහි වෙබ් අඩවි සහ මුද්‍රිත පතපොත ඇසුරින් දත්ත එකතු කිරීම කරනු ලැබේ. මීට අමතරව ආහාර ද්‍රව්‍යවල මිල ගණන් මෙම ආයතනයේ ඇති අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශයෙන් ගනු ලැබේ.

මෙම වසර තුළ දී පරිගණකගත කරන ලද තොරතුරු පද්ධතිය මනා ක්‍රියාකාරීත්වයක් සඳහා නවීකරණය කරන ලදී. ගොවි කටයුතු දත්තවල සාමාන්‍ය ඒකක පරිවර්තනය සහ සත්‍යාපනය කිරීම තෝරා ගත් භාණ්ඩ සඳහා සිදු කරන ලද අතර එමඟින් එම ඒකක සමාන පසුතලයක් මතට ගැනීමට හැකි වේ.
යාවත්කාලීන කළ තොරතුරුවල පැවැත්ම සහතික කිරීම සඳහා වර්ෂාවසානයේ ගොනු රක්ෂණය කිරීම ද සිදු කරන ලදී. වර්ෂය තුළ පහත සඳහන් දර්ශක යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

- 2013 වර්ෂයේ අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කළ බිම් ප්‍රමාණය සහ නිෂ්පාදනය
- වී වගාව පිළිබඳ දත්ත , වී වගා කළ බිම් ප්‍රමාණය සහ නිෂ්පාදනය, වගා කළ බිම් ප්‍රමාණය සහ අස්වනු නෙළූ ප්‍රමාණය
- වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන වියදම
- වගා කළ බිම් ප්‍රමාණය,නිෂ්පාදනය සහ සාමාන්‍ය වී අස්වැන්න සහ 2014 වර්ෂය සඳහා වාර්ෂික බෝග
- ආහාර බෝගවල නිෂ්පාදක මිල ගණන් ඇතුළත් කර සත්‍යාපනය කර ඇත.

දත්ත රැස් කිරීම සඳහා පරිශීලනය කළ පොත්පත්

- මහ බැංකු වාර්ෂික වාර්තාව - 2014
- මහ බැංකුවේ සමාජ හා ආර්ථික දත්ත - 2014
- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යානමය සාරාංශය- 2014
- වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම සඳහා වැය වූ මුදල (2012 යල)
- රේගු දෙපාර්තමේන්තුවේ බාහිර වෙළඳාම් පිළිබඳ සංඛ්‍යාලේඛන- 2013

කෘෂිකාර්මික දත්ත බැංකුව පවත්වා ගෙන යාමට අමතරව ආයතනය මඟින් කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘතීන්හි ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතුවලට අදාළ දත්ත විශ්ලේෂණ කටයුතු ද මෙම ඒකකයෙන් සිදු කරනු ලැබේ.

| ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතියේ නම |
|---|---|
| R-485 - | සුළු පරිමාණ ගොවීන්ගේ ගෘහාශ්‍රිත කුකුළු පාලනයේ වර්තමාන තත්ත්වය |
| R-490 - | කුඹුරු ඉඩම් දත්තවල ඇති විෂමතා නිර්ණය කිරීම- පහත රට තෙත් කලාපයේ නියමු ව්‍යාපෘතිය |
| R-491 - | දියර කිරි සහ කිරිපිටි මිල දී ගැනීම සඳහා වන පාරිභෝගික රුචිකත්වයන් සහ මිල දී ගැනීමේ චර්යාවන් |
| R-492 - | හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවාරයේ ලොකු ලූනු නිෂ්පාදන වැඩසටහනේ අවස්ථා සහ ගැටලු |

පරිගණක නඩත්තුව

පරිගණක නඩත්තු සහකාරවරු පරිගණක නඩත්තුව සහ ආයතනයේ විවිධ ස්ථානවල ස්ථාපනය කර ඇති පරිගණක නඩත්තු කිරීම සඳහා පූර්ණ වශයෙන් දායක වී සිටිති. ඔවුන් විසින් සියලුම පරිගණක දෘඩාංග සහ මෘදුකාංග ස්ථාපනය කිරීම් සහ පරිගණක මිල දී ගැනීම් සහ අලුත් වැඩියා කිරීම්වලට අදාළ කටයුතු ද සම්බන්ධ සිදු කරනු ලබයි. අවශ්‍ය අවස්ථාවන්හි පරිගණක මිල දී ගැනීම සඳහා තාක්ෂණික පිරිවිතර සකස් කිරීම සහ තාක්ෂණික ඇගයීම් කමිටුවලට අවශ්‍ය අවස්ථාවන්හි තීරණ ගැනීම සඳහා මහ පෙන්වීම ද සිදු කරනු ලබයි.

පහත සඳහන් අංශවලින් ලැබුණු ඉල්ලීම්වලටය අනුව පරිගණක ජාල ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කර තිබේ.

| අංශය | තත්ත්වය |
| --- | --- |
| අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර | අවසන් |
| පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශය | අවසන් |
| මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය | අර්ධ වශයෙන් අවසන් කර ඇත. |
| ප්‍රකාශන හා පුස්තකාල | යෝජිත ආයතනික වෙබ් අඩවිය |

ආයතනයේ වෙබ් අඩවිය අප ඒකකයට ලැබෙන අත්‍යාවශ්‍ය ගතික තොරතුරුවලින් කාලීනව යාවත්කාලීන කෙරේ. මෙම තොරතුරු යටතට අලෙවි ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර ඒකකයෙන්, පරිපාලන අංශයෙන් සහ වැඩසටහන් අංශයෙන් ලැබෙන නවතම ප්‍රවෘත්තිවලින් සමන්විත වේ. නිරන්තරයෙන් වෙබ් අඩවියට ඇතුළත් කරන තොරතුරු වන්නේ,

දෛනික මිල ගණන් - විවරණිකාව
සතිපතා මිල ගණන් - විවරණිකාව
මාසික මිල ගණන් - විවරණිකාව
ප්‍රකාශන සහ වෙනත් වැදගත් වැඩසටහන්

පරිගණක විද්‍යාගාරය

නැවත ස්ථාපනය කරන ලද පරිගණක විද්‍යාගාරය අප ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ලෙස පරිගණක පහසුකම් සැපයීම පිණිස පවත්වා ගෙන යනු ලැබේ.

# පුස්තකාලය

පුස්තකාලයෙහි මූලික පරමාර්ථය වනුයේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයෙහි සහ බාහිර ආයතන හා පුද්ගලයින්ගේ ප්‍රයෝජනය පිණිස කෘෂිකාර්මික අංශයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම සහ තොරතුරු අවශ්‍යතා සැපයීම වේ. වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ විමර්ශන අවශ්‍යතා වෙනුවෙන් ග්‍රන්ථ 483ක් ද, විමර්ශන කෘති 29ක් සහ වාර ප්‍රකාශන 56ක් ද නිකුත් කර තිබේ. වර්ෂය තුළ පුස්තකාලය පරිහරණය කළ පාඨක සංඛ්‍යාව 245කි.

පොත්,සඟරා සහ වාර ප්‍රකාශන අත්පත් කර ගැනීම

වර්ෂය තුළ ග්‍රන්ථ 165ක් පුස්තකාල එකතුවට අත්පත් කර ගෙන ඇත. ඉන් 42ක් සෘජු මිල දී ගැනීම් වන අතර ග්‍රන්ථ 123ක් ප්‍රකාශන හුවමාරු වැඩසටහන යටතේ ලැබුණු ඒවා වේ. දේශීය සහ විදේශීය ආයතනවලින් විශාල වාර සඟරා, පුවත් හසුන්, වාර්ෂික වාර්තා ප්‍රමාණයක් හුවමාරු හෝ පරිත්‍යාග වශයෙන් ලැබී තිබේ. ආයතනය විසින් වර්ෂය තුළ විදේශීය සඟරා නාම 08කට (කලාප 96ක් ඇතුළත්) සහ දේශීය සඟරා නාම 06කට දායකත්වය ලබා ගන්නා ලදී.

පුස්තකාල සේවා

පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ බාහිර පාඨක ඉල්ලීම් පරිදි තොරතුරු සහ ප්‍රලේඛන සේවාවන් වන සාහිත්‍ය ගවේෂණය, විමර්ශන සේවා, කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් සහ ඡායා පිටපත් සේවාවන් සපයන ලදී.

පුස්තකාලය තුළ නවීන ADSL පහසුකම ලබා ගැනීමත් සමඟ අන්තර්ජාල පාදක තොරතුරු පහසුකම් සඳහා වූ ප්‍රවේශය පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා තව දුරටත් පුළුල් කරන ලදී. පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර පාඨකයින් සඳහා විවිධ විෂයන් යටතේ පවත්වාගෙන යන පුවත්පත් ලිපි එකතුව ක්ෂණික විමර්ශනය සඳහා අඛණ්ඩ දර්ශකගත කොට ඇත.

<u>අන්තර් පුස්තකාල සහයෝගීතාවය (ILC)</u>

පුස්තකාලය කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පුස්තකාලයේ පවත්වා ගෙන යන කෘෂිකාර්මික පුස්තකාල තොරතුරු ජාලයේ (AGRINET) සාමාජිකයෙකු වන අතර අඛණ්ඩව එම දත්ත් ජාලය සඳහා තෝරා ගත් පටුන පිටු බෙදා හැරීමේ දත්ත පදනම සහ සම්බන්ධව කටයුතු කරයි.

AGRINET තොරතුරු ජාලය මඟින් සම්පාදනය කරන පහත සඳහන් දත්ත පදනම වෙත පුස්තකාල එකතුවෙන් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සපයන ලදී.

01. ජාතික කෘෂිකාර්මික ග්‍රන්ථ නාමාවලිය
02. සම්ප්‍රදායික දැනුම පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය (කෘෂිකර්මාන්තයට අදාළව)

2014 වර්ෂයේ ජාතික ඒකාබද්ධ සූචිය යාවත් කාලීන කිරීම සඳහා ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍ර පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත පුස්තකාල දත්ත සංචිතය වෙතින් සපයන ලදී.

ආයතන ප්‍රකාශන සංඛ්‍යාකකරණය

ජාතික විද්‍යා පදනම මගින් ආරම්භ කරන ලද ආයතන ප්‍රකාශන සංඛ්‍යාංකකරණය ව්‍යාපෘතිය මගින් 2013 දක්වා අප ආයතනයේ ප්‍රකාශන සංඛ්‍යාංකකරණය කර ඇති අතර (http://harti.nsf.ac.lk/) මඟින් ඒ සඳහා ප්‍රවේශ විය හැකිය.

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ආයතනික විද්‍යුත් ප්‍රකාශන එකතුවක් පවත්වාගෙන යාම හා මාර්ගගත ප්‍රවේශය මගින් ඉක්මනින් ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු ලබා ගැනීමේ පහසුකම් සැලසීමයි.

ප්‍රකාශන හුවමාරු වැඩසටහන

ආයතනික ප්‍රකාශන 200ක් හුවමාරු වශයෙන් පහත සඳහන් පුස්තකාල වෙත යවන ලදී.

1) කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
2) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික මධ්‍යස්ථානය
3) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
4) ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව (සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය)
5) දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)
6) පාර්ලිමේන්තු පුස්තකාලය
7) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
8) ජාතික විද්‍යා පදනම
9) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
10) යාපනය මහජන පුස්තකාලය
11) අන්තර්ජාතික ජල කළමනාකරණ ආයතනය
12) මධ්‍යම පරිසර අධිකාරිය
13) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
14) කොළඹ විශ්වවිද්‍යාලය
15) කැලණිය විශ්වවිද්‍යාලය
16) රුහුණු විශ්වවිද්‍යාලය
17) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
18) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
19) යාපනය විශ්වවිද්‍යාලය
20) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
21) රජරට විශ්වවිද්‍යාලය
22) සබරගමුව විශ්වවිද්‍යාලය
23) නැගෙනහිර විශ්වවිද්‍යාලය
24) මොරටුව විශ්වවිද්‍යාලය
25) වයඹ විශ්වවිද්‍යාලය
26) අනුරාධපුර භික්ෂු විශ්වවිද්‍යාලය
27) බෞද්ධ සහ පාලි විශ්වවිද්‍යාලය

ප්‍රකාශන 123ක් ඉහත පුස්තකාල වෙතින් ලැබී ඇත.

## ප්‍රකාශන ඒකකය

ආයතනයේ ප්‍රකාශන ඒකකය, අංශ ප්‍රධානී සංඛ්‍යාන හා දත්ත සැකසුම් / ප්‍රකාශන / පුස්තකාල යටතේ ක්‍රියාත්මක වේ. පර්යේෂණ වාර්තා, කාලීන වාර්තා, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත් , අත් පත්‍රිකා සහ අනෙකුත් පත්‍රිකා භාෂා ත්‍රිත්වයෙන් ම සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීම සිදු කෙරෙනුයේ මෙම අංශයෙනි.

මෙම වසර තුළ පර්යේෂණ වාර්තා 25ක් සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත් කර තිබේ. ඊට අදාළ සිංහල සහ ඉංග්‍රීසි පර්යේෂණ වාර්තා පිළිබඳ විස්තර පහත දැක්වේ.

1. කිතුල් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය සහ අනාගත විභවතා
2. "අපි වවමු රට නගමු" වැඩසටහන ඇගයීම
3. ශ්‍රී ලංකාවේ කුරුඳු පත්‍ර හා පැඟිරි පත්‍ර ආශ්‍රිත සගන්ධ තෙල් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය හා සංවර්ධන විභවතා
4. අතිරේක ආහාර බෝගයක් වශයෙන් දේශීය අල වර්ග නිෂ්පාදනයේ පවතින විභවතා සහ බාධක හඳුනා ගැනීම
5. එළවළු අපනයනය ආශ්‍රිත සැපයුම් දාම විශ්ලේෂණය
6. Export market for Organic Food: Present Status, Constraints and Future Scope
7. Vegetable Collection Centers in Badulla and Monaragala Districts: Impacts and Lessons
8. Food Consumption Patterns in Sri Lanka.
9. Evaluation of Divinaguma Agriculture Component Home Gardens
10. Impact and Lessons of Dairy Development intervention: Dry Zone Livelihood Support and Partnership Programme
11. Municipal Solid Waste Composting: Potentials and Constraints
12. An Overall Assessment of the Agricultural Marketing Systems in Northern Province of Sri Lanka
13. Fruit and Vegetable Export growth instability and diversification
14. Application of integrated pest management (IPM) in Vegetable Cultivation: Past Experiences and Suggestions for Promotion
15. Comparative Study on Consumer Preferences of Fruit Drinks and Carbonated Drinks in Sri Lankan Beverage Market
16. Socio Economic Factors Affecting the Productivity of Green Gram
17. Agricultural Forward Contract As Pre-Harvest Commodity Marketing : Problems and Prospects
18. Viability of Controlled Environmental Agriculture for Vegetable Farmers in Sri Lanka.
19. Socio Economic Condition of Dairy industry in Mahaweli H Area
20. Impact and Lessons of Uda Walawe Bank Irrigation upgrading and Extension Project for Water resources management
21. Value Chain of High Value Highly Perishable Vegetables
22. Reasons for Low Adoption of Selected OFC and Vegetable Varieties released by the Department of Agriculture
23. Socio Economic Impact of Chronic Kidney disease of unknown Etiology
24. Technical Efficiency of Paddy farming
25. Effects of Rural Road Development on Household Agricultural income and Farming Systems in Hambantota District

මීට අමතරව, අදාළ වර්ෂය තුළ පහත සඳහන් වාර ප්‍රකාශනයන් ද නිකුත් කරන ලදී.

1. Sri Lanka Journal of Agrarian Studies Vol. 17 No. 01, 02 and 03
2. ගොවි ජනතා, වෙළුම17, කලාප 1-2, ජන-ජුනි, 2015
   ගොවි ජනතා, වෙළුම 17, 3 වෙනි කලාපය, ජුලි-සැප්, 2015
   ගොවි ජනතා, වෙළුම 17, 4 වෙනි කලාපය, ඔක්තො-දෙසැ, 2015
3. 'පුවත් හසුන' 35 වෙළුම, අංක 02 සහ 36 වෙළුම අංක 01

2015 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තත්ත්වය

| | 31.12.2014 දිනට තත්ත්වය | වර්ෂය තුළ සේවය අත් හිටුවීම, සේවයෙන් ඉවත් වීම | පත්වීම් | 31.12.2015 දිනට තත්ත්වය |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 1 | 1 | 1 | 1 |
| අතිරේක අධ්‍යක්ෂ | 1 | - | - | 1 |
| අංශ ප්‍රධාන | 6 | 2 | 1 | 5 |
| පර්යේෂණ කාර්ය මණ්ඩලය | 26 | 4 | - | 22 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 6 | 1 | - | 5 |
| ජ්‍යෙෂ්ඨ පුස්තකාල කාර්ය මණ්ඩලය | 2 | - | - | 2 |
| දත්ත සංවර්ධන ඒකකය | - | - | - | 0 |
| පරිගණක ඒකකය | 2 | - | 1 | 3 |
| ප්‍රකාශන ඒකකය | 2 | - | 1 | 3 |
| සංඛ්‍යාන කාර්ය මණ්ඩලය | 24 | - | - | 24 |
| තාක්ෂණික කාර්ය මණ්ඩලය | - | - | - | 0 |
| ලිපිකාර, ලේකම් සහ සමාන්තර ශ්‍රේණි | 53 | 2 | - | 51 |
| මෙහෙයුම් සහ සමාන්තර ශ්‍රේණි | 49 | - | - | 49 |
| එකතුව | 172 | 10 | 4 | 166 |

2015 වර්ෂය තුළ ආයතනය විසින් කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා රුපියල් මිලියන 1.9ක් ආයෝජනය කර තිබේ. මාණ්ඩලික නිලධාරීන් සහ මාණ්ඩලික නොවන නිලධාරීන් 57දෙනෙකු දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ අතර මාණ්ඩලික නිලධාරීන් 10 දෙනෙකු විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූහ.

පහත සඳහන් පර්යේෂණ නිලධාරීන් පශ්චාත් උපාධි අධ්‍යයනයන්හි නිරත වී සිටිති.

| | |
|---|---|
| එම්.ජී.සී.එස් බණ්ඩාර මහතා | ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ පාරිසරික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය - 2014 ජනවාරි 06 සිට 2016 ජනවාරි 07 දක්වා |
| ඊ.ඒ.සී ප්‍රියංකර මහතා | අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ ආචාර්ය උපාධිය<br>විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාලය, හුවාෂොන්ග්, චීනය<br>2015 අගෝස්තු 31 සිට 2018 අගෝස්තු 30 දක්වා |
| එන්.පී.ජී සමන්ත මහතා | අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ ආචාර්ය උපාධිය<br>විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාලය, හුවාෂොන්ග්, චීනය<br>2015 අගෝස්තු 31 සිට 2018 අගෝස්තු 30 දක්වා |

විදේශ පුහුණු/ සම්මන්ත්‍රණ/වැඩමුළු/රැස්වීම් ආදිය

පර්යේෂණ නිලධාරිනි ජේ.ඒ.යූ.පී ජයසිංහ මෙනෙවිය 2015 ජනවාරි 06 දින සිට පෙබරවාරි 02 දින දක්වා ඉන්දියාවේ දී පැවති 'ග්‍රාමීය සංවර්ධනය සඳහා චිරස්ථායී කෘෂිකාර්මික උපක්‍රම' නම් වූ වැඩමුළුවට සහභාගී වූවාය.

සංඛ්‍යාන නිලධාරිනි එස්.සේනානායක මහත්මිය 2015 මාර්තු 09 සිට මාර්තු 18 දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද්හි පැවති 'ග්‍රාමීය සංවර්ධනය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ භාවිතාව' නමින් පැවති වැඩමුළුවට සහභාගී වූවාය.

අධ්‍යක්ෂ හපුතන්ත්‍රි ධර්මසේන මහතා පාකිස්ථානයේ ඉස්ලාමාබාද්හි 2015 මැයි 5 දින සිට මැයි 8 දින දක්වා පැවති 'ග්‍රාමීය ආදායම සහ දිළිඳුකම දුරලීම' පිළිබඳ වූ වැඩසටහනට සහභාගී විය.

අධි පර්යේෂක ආචාර්ය ටී.ඒ ධර්මරත්න මහතා පාකිස්ථානයේ ඉස්ලාමාබාද්හි 2015 මැයි 5 දින සිට මැයි 8 දින දක්වා පැවති 'ග්‍රාමීය ආදායම සහ දිළිඳුකම දුරලීම' පිළිබඳ වූ වැඩසටහනට සහභාගී විය.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා 2015 ජුනි 06 සිට ජුනි 30 දින දක්වා චීනයේ දී පැවති 'කෘෂිකාර්මික අපනයනවල ගුණාත්මකභාවය සහ ආරක්ෂාව කළමනාකරණය' පිළිබඳ වූ සමුළුවට සහභාගී විය.

අතිරේක අධ්‍යක්ෂ ජේ.කේ.එම්.ඩී චන්ද්‍රසිරි මහතා 2015 සැප්තැම්බර් 08 දින සිට 17 දක්වා කොරියාවේ පැවති 'කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනයේ ශක්‍යතා ගොඩනැගීම පිළිබඳ' වැඩසටහනට සහභාගී විය.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන එස්.එම්.ඒ සමරකෝන් එම්.ඩී සුසිලා ලූර්දු යන මහත්ම මහත්මීන් ඕස්ට්‍රේලියාවේ පැවති 'සාම්ප්‍රදායික සංස්කෘතිය/දැනුම, ආහාර සුරක්ෂිතතාව සහ ස්ථායීතාවය අවබෝධ කර ගැනීම සහ ප්‍රවර්ධනය' නමින් වූ අධි ශිෂ්‍යත්ව වැඩසටහනට සහභාගී වූහ. එය 2015 සැප්තැම්බර් මස 26 දින සිට ඔක්තොම්බර් 18 දින දක්වා පැවතිණි.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ආර්.පී වීරක්කොඩි මහත්මිය සහ පර්යේෂණ නිලධාරී අයි.පී.පී.එම් විජේසිංහ මහතා 'ග්‍රාමීය සංවර්ධනය සඳහා චිරස්ථායී කෘෂිකර්මාන්තය' නමින් වියන්ටියාන් හි පැවති වැඩසටහනකට සහභාගී වූහ. එය 2015 සැප්තැම්බර් 25 දින සිට ඔක්තොම්බර් 25 දින දක්වා පැවතිණ.

දේශීය පුහුණු වැඩසටහන්

එස්.පී.එස්.එස් භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පැවති පුහුණු වැඩසටහනට (පැය 45) පර්යේෂණ නිලධාරීහු සහභාගී වූහ. වැඩසටහන 2015 මාර්තු මාසයේ සිට දෙසැම්බර් දක්වා පැවතිණ.

පර්යේෂණ නිලධාරීන් වන ඉන්දිකා එදිරිසිංහ මහත්මිය සහ පී.සී.ජේ ද සිල්වා මහතා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ දී 2015 මාර්තු 27 දින පැවති 'විද්‍යාඥයින් සඳහා රාජකාරී ජීවිතය සමබරකාව : සාර්ථකත්වයට මඟ' නම් වූ වැඩමුළුවට සහභාගී වූහ.

සහකාර ලේඛකාධිකාරී (වැඩසටහන්) චන්ද්‍රිකා දහනායක මහත්මිය 2015 අප්‍රියෙල් 01 සහ 02 දෙදින තුළ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවති 'ආයතනික යහපාලනය වෙනුවෙන් ගැටුම් නිරාකරණය' නම් වූ වැඩසටහනට සහභාගී වූවාය.

පර්යේෂණ නිලධාරී එච්.ජේ.සී ජයසූරිය මහතා 2015 අප්‍රියෙල් 6 සිට 09 දක්වා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවති 'වෙනස්වන වෙනස්වන දේශගුණය සමඟ පරිසර පද්ධති ප්‍රත්‍යාස්ථිතිය' නම් වූ වැඩමුළුවට සහභාගී විය.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එන්.පී.ජී සමන්ත මහතා ජාතින විද්‍යා පදනමේ දී 2015 මැයි 29 දින පැවති ' ව්‍යාපාර ව්‍යාපෘති යෝජනා ලිවීම' පිළිබඳ වැඩසටහනට සහභාගී විය.

කළමනාකරණ සහකරුවන් වන එල්.ටී.එච්.ජයසිංහ මිය, එල්.පී ගුණරත්න මයා, ඩී.හේවාවිතාරණ මිය, ජේ.එම්.වී.පී පද්මිණී මිය, යූ.පී.සී රම්‍යලතා මිය සහ කේ.ජී.ඩී.කේ.එස් කරුණාරත්න මිය යන පිරිස 2015 ජූලි 6 සහ 7 යන දිනයන්හි ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවති 'ආයතනික සංවර්ධනය උදෙසා සේවක දායකත්වය වැඩි දියුණු කිරීම' නම් පුහුණු වැඩසටහනට සහභාගී වූහ.

සියලුම රියදුරු මහතුන් - 2015 ජුනි 13 දින හෙක්ටර් කොබ්බෑකඩුව පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවති ධාරිතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී වූහ.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආර්.එල්.එන් ජයතිස්ස , පර්යේෂණ නිලධාරිනි එම්.ටී පද්මජානි, පර්යේෂණ නිලධාරිනි පී.ඒ.ජේ චම්පිකා, සංස්කාරක කේ.එස්.එන් පෙරේරා යන මහත්ම මහත්මීන් 2015 ජූලි 09-10 දින හෙක්ටර් කොබ්බෑකඩුව පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවති 'බලපෑම් සහගත පර්යේෂණ ලිපි ලිවීම' නම් වූ වැඩසටහනට සහභාගී වූහ.

පර්යේෂණ නිලධාරිනි අයි.එදිරිසිංහ මෙනෙවිය 2015 ජූලි 15 සහ 16 දෙදින ජාතික විද්‍යා පදනමේ පැවති දකුණු ආසියාවේ සමාජ ආර්ථික සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ව වූ අන්තර්ජාතික සමුළුවට පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා සහභාගී වූවාය.

ගණකාධිකාරිනී අමිලා තෙන්නකෝන් මිය 2015 ජූලි 15-16 දෙදින ප්‍රාග් ආයතනයේ දී පැවති 'වියදම් සහ ගෙවීම් ක්‍රියා පටිපාටි' නම් වැඩමුළුවට සහභාගී වූවාය.

කළමනාකරණ සහකාර ගාල්ලගේ දිශාන් සාලිය ධර්මදාස මහතා 2015 ජූලි 16 සහ 17 දෙදින ඉදි කිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු කිරීමේ ආයතනයේ පැවති 'ප්‍රවාහන කළමනාකරණය' පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී විය.

කළමනාකරණ සහකාර කේ.එම්.ආර් සංජීවනී මෙනෙවිය සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලෙහි 2015 අගෝස්තු 4, 10 සහ 11 යන දිනවල පැවති 'ලේඛකත්ව භාවිතාවන්'පුහුණු වැඩමුළුවට සහභාගී වූවාය.

පුස්තකාලයාධිපතිනි එච්.එම්.ටී.ජී.එල් හේරත් මෙනෙවිය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී 2015 අගෝස්තු 06 සිට පැවති ' දකුණු ආසියාවේ ජාතික පුස්තකාල අතර සහයෝගීතාවය වර්ධනය කිරීම පිළිබඳ අන්තර්ජාතික සමුළුවට සහභාගී වූවාය.

ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනි ආර්.ඩී.ඩබ්.සී රාජපක්ෂ මිය 2015 සැප්තැම්බර් 09 දින කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ දී පැවති ' ආකල්ප සහ කුසලතා සංවර්ධනය' පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී වූවාය.

පර්යේෂණ නිලධාරී චින්තක ජයසූරිය මහතා අන්තර් ක්‍රියාකාරී සහභාගීත්ව සංවර්ධන ආයතනයේ (IPID) පැවති 'බලපෑම් ඇගයීම තුළින් සමාජ වැඩසටහන් ඇගයීම' නම් වූ වැඩසටහනට 2015 ජුනි 10 සිට 12 දක්වා සහභාගී විය.

පුස්තකාලයාධිපතිනි එච්.එම්.ටී.ජී.එල් හේරත් මෙනෙවිය සහ සහකාර පුස්තකාලයාධිපතිනි කේ.වයි.පී වීරරත්න මිය 2015 සැප්තැම්බර් 17 සහ 18 දිනවල ගලධාරී හෝටලයේ දී පැවති 'පුස්තකාල සහ තොරතුරු විඥාපනය' පිළිබඳ අන්තර්ජාතික සමුළුවට සහභාගී වූහ.

ගණකාධිකාරිනි අමිලා තෙන්නකෝන් මිය 2015 සැප්තැම්බර් 29 දින ප්‍රාග් ආයතනයේ පැවති ' 2015 වර්ෂය සඳහා මූල්‍ය වාර්තා සකස් කිරීම (අවසන් ගිණුම්)' පිළිබඳ වැඩමුළුවට සහභාගී වූවාය.

සහකාර ගණකාධිකාරිනී ජේ.පී නානායක්කාර මිය , අභ්‍යන්තර විගණන නිලධාරිනි එන්.සී ඒකනායක මිය 2015 සැප්තැම්බර් 28 සහ 29 දෙදින ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරවරුන්ගේ සංගමයේ දී පැවති 'රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය' පිළිබඳ වැඩමුළුවට සහභාගී වූහ.

ගණකාධිකාරිනි අමිලා තෙන්නකෝන් මිය, ගිණුම් නිලධාරී ඩබ්.ඩී.ජී පෙරේරා මිය 2015 සැප්තැම්බර් මස 21 සහ 22 දෙදින සීමාසහිත නිපුණතා පුහුණු අරමුදලෙහි පැවති 'අලාභ වාර්තා කිරීම, හානි පූර්ණය හා කපා හැරීම පිළිබඳ වැඩමුළුවට සහභාගී වූහ.

වැඩ බලන ගණකාධිකාරිනී ජේ.පී නානායක්කාර මිය , අභ්‍යන්තර විගණන නිලධාරිනි එන්.සී ඒකනායක මිය ශ්‍රී ලංකා  රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරවරුන්ගේ සංගමයේ දී පැවති 'රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති' නම් පුහුණු වැඩසටහනට 2015 නොවැම්බර් 13, 14, 20, 21,27,28, සහ 29 යන දිනයන්හි සහභාගී වූහ.

බී.එම්.ටී සමීර මහතා- කළමනාකරණ සහකාර, 2015 නොවැම්බර් මස 19 දින ප්‍රාග් ආයතනයේ දී පැවති " ප්‍රසම්පාදන සැලසුම්"  පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගී විය.

පොත් තබන්නා, එස්.ඒ.කේ.එම් ජයලත් මිය 2015 දෙසැම්බර් 02වන දින ප්‍රාග් ආයතනයේ පැවති 'අබලන් භාණ්ඩ' පිළිබඳ වැඩමුළුවකට සහභාගී වූවාය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2015 දෙසැම්බර්31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (රුපියල්)

| වත්කම් | සටහන් | 2015 | 2014<br>නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන අයිතමයන් | 2 | 14,710,732.69 | 7,793,755.93 |
| ලැබිය යුතු - ණය ගැතියෝ | 3 | 21,380,622.99 | 21,517,920.19 |
| ලැබිය යුතු - තැන්පතු | 4 | 774,423.44 | 773,795.97 |
| තොගය | 5 | 5,371,267.40 | 4,536,001.56 |
| පූර්ව ගෙවීම් | 6 | 375,506.23 | 173,642.65 |
| වෙනත් ජංගම වත්කම් | 7 | 171,427.80 | 155,920.00 |
| | | **42,783,980.55** | **34,951,036.30** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| අනෙකුත් මූල්‍යමය වත්කම් | 8 | 6,242,329.61 | 5,497,130.79 |
| යටිතල පහසුකම්,පිරියත හා උපකරණ | 9 | 62,676,795.22 | 65,628,113.77 |
| ඉඩම් හා ගොඩනැගිලි | 10 | 32,569,179.58 | 27,846,572.28 |
| | | **101,488,304.41** | **98,971,816.84** |
| **මුළු වත්කම්** | | **144,272,284.96** | **133,922,853.14** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු | 11 | **14,235,551.08** | **9,454,972.84** |
| | | **14,235,551.08** | **9,454,972.84** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ | 12 | 36,372,580.00 | 36,088,145.00 |
| | | **36,372,580.00** | **36,088,145.00** |
| **මුළු වගකීම්** | | **50,608,131.08** | **45,543,117.84** |
| **ශුද්ධ වත්කම්** | | **93,664,153.88** | **88,379,735.30** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | |
| රජයේ ප්‍රදාන – ප්‍රාග්ධනය | 13 | 182,143,835.19 | 160,092,835.19 |
| අමාත්‍යාංශයේ දායකත්වය ලද ප්‍රාග්ධනය | | 1,874,268.00 | 2,342,835.00 |
| සංචිත | 14 | 33,855,313.31 | 42,015,085.68 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 35,003,646.00 | 35,003,646.00 |
| දිරි දීමනා සහ පුහුණු අරමුදල | 15 | 426,659.06 | 533,323.82 |
| සමුච්චිත අතිරික්තය/(හිඟය) | 16 | (159,639,567.68) | (151,607,990.39) |
| | | | |
| **මුළු ශුද්ධ වත්කම්/වගකීම්** | | **93,664,153.88** | **88,379,735.30** |

මෙම මූල්‍ය ප්‍රකාශයන් මුදල් පනතට, 1971 අංක 38 දරන රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වන සේ සකස් කර ඇත.

.......................

**ජේ.පී නානායක්කාර**

සහකාර ගණකාධිකාරිනි

2016 මාර්තු 30

මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරමි.

........................................................................... ..................................................

හපුතන්ත්‍රි ධර්මසේන — බී.විජේරත්න

අධ්‍යක්ෂ — සභාපති

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2015 දෙසැම්බර් 31න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන වාර්තාව (රුපියල්)

| අයභාරය | සටහන් | 2015 | 2014<br>නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල් | | 152,543,107.00 | 124,782,000.00 |
| පර්යේෂණ හා පුහුණුවීම් ක්‍රියාකාරකම් සඳහා බාහිර පාර්ශවයන්ගෙන් ලද අරමුදල් | | 1,201,860.60 | 3,547,757.21 |
| අනෙකුත් ආදායම් | 17 | 30,748,898.10 | 31,346,417.36 |
| **මුළු අයභාරය** | | **184,493,865.70** | **159,676,174.57** |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 18 | (138,658,607.87) | (102,418,163.60) |
| පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් | | (11,620,405.47) | (15,791,268.14) |
| පර්යේෂණ හා පුහුණුවීම් ක්‍රියාකාරකම් සඳහා බාහිර පාර්ශවයන්ට කළ ගෙවීම් | | (1,201,860.60) | (3,547,757.21) |
| ක්ෂයවීම් * | 9, 10 | (19,095,645.72) | (16,382,550.70) |
| අනෙකුත් වියදම් | 19 | (29,688,488.43) | (31,870,481.60) |
| බොල් ණය වෙන් කිරීම් (ඌන/අධි) | | 5,720.72 | 50,583.49 |
| බැංකු ගාස්තු | | (74,910.00) | (80,900.00) |
| **මුළු වියදම** | | **(200,334,197.37)** | **(170,040,537.76)** |
| **සලකා බලන කාලය තුළ හිඟය** | | **(15,840,331.67)** | **(10,364,363.19)** |

* Rs.1,047,601.60 amount transferred from project capital fund GL P-01.

……………………………… ……………………….. ……………………

සභාපති අධ්‍යක්ෂ ගණකාධිකාරිනී

### හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
### 2015 දෙසැම්බර් 31න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| **2014** | | සටහන් | **2015 (රුපියල්)** | |
|---|---|---|---|---|
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| (10,364,363.19) | වර්ෂය තුළ ශුද්ධ හිඟය | | | (15,840,331.67) |
| | **ගැලපීම්** | | | |
| 16,382,550.70 | ක්ෂය වීම් | | 19,095,645.72 | |
| (175,143.97) | ක්ෂය ගැලපුම් | | - | |
| 4,180,890.00 | පාරිතෝෂික වෙන් කිරීම් | | 3,595,007.50 | |
| 553,029.12 | ආයෝජන ආදායම | | 435,112.22 | |
| (29,318.46) | පෙර වසරේ ගැලපුම් | | - | |
| - | වාහන අපහරණයෙන් ලද ලාභය | | (2,209,960.00) | 20,915,805.44 |
| **10,547,644.20** | **කාරක ප්‍රාග්ධන ගැළපීමට පෙර මෙහෙයුම් ලාභය** | | | **5,075,473.77** |
| | | | | |
| | **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| 1,214,003.89 | ලැබිය යුතු | | 137,297.20 | |
| 367,676.35 | තොගය | | (835,265.84) | |
| 30,515.61 | පූර්ව ගෙවීම් | | (201,863.58) | |
| (142,358.68) | අනෙකුත් ජංගම වත්කම් | | (15,507.80) | |
| (931,041.75) | ගෙවිය යුතු | | 4,780,578.24 | |
| (321,514.60) | රාජ්‍ය උකස් බැංකුව- නිවාස ණය | | - | 3,865,238.22 |
| **10,764,925.02** | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලදී භාවිතා කළ මුදල්** | | | **8,940,711.99** |
| | | | | |
| **(4,347,617.50)** | **පාරිතෝෂික ගෙවීම්** | | | (3,310,572.50) |
| | | | | |
| **6,417,307.52** | **මෙහෙයුම්වල දී භාවිතා කළ ශුද්ධ මුදල්** | | | **5,630,139.49** |
| | | | | |
| | **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| (908.19) | ලැබිය යුතු දෑ | | (627.47) | |
| (532,734.44) | අනෙකුත් මූල්‍ය වත්කම් | | (745,198.82) | |
| (5,495,191.67) | යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | | (4,106,504.56) | |
| (2,327,406.88) | ඉඩම් සහ ගොඩනැගිලි | | (5,880,831.51) | |
| (553,029.12) | ආයෝජන ආදායම | | (435,112.22) | |
| | | | | |
| **(8,909,270.30)** | **ආයෝජන ක්‍රියාකාරකම්වල දී භාවිතා කළ ශුද්ධ මුදල්** | | | **(11,168,274.58)** |
| | | | | |
| | **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | | |
| 6,475,330.00 | රජයේ ප්‍රතිපාදන - ලැබුණු ප්‍රාග්ධනය | | 9,271,000.00 | |
| 1,438,008.00 | ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල ( ව්‍යාපෘති අංක R 470) | | - | |
| - | වාහන අපහරණය | | 3,062,760.00 | |
| - | දිරි දීමනා අරමුදලේ ආයතනික කොටස (ව්‍යාපෘති අංක R 489) | | 121,351.85 | |
| **7,913,338.00** | **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | | **12,455,111.85** |
| | | | | |
| 5,421,375.22 | **මුදල් හා මුදල් සමාන අයිතමවල ශුද්ධ වැඩිවීම** | | | 6,916,976.76 |
| 2,372,380.71 | **මුදල් හා මුදල් සමාන අයිතම වසර ආරම්භයේ** | I | | 7,793,755.93 |
| **7,793,755.93** | **මුදල් හා මුදල් සමාන අයිතම වසාර අවසානයේ** | II | | **14,710,732.69** |
| | | | | |
| | **සටහන්:** | | | |
| | **මුදල් හා මුදල් සමාන අයිතම** | | **1** | **11** |
| | | | **01.01.2015** | **31.12.2015** |
| 7,783,755.93 | බැංකුවෙහි ඉතිරි ශේෂය | | 7,783,755.93 | 14,700,732.69 |
| 10,000.00 | අතැති මුදල් | | 10,000.00 | 10,000.00 |
| **7,793,755.93** | එකතුව | | **7,793,755.93** | **14,710,732.69** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම් / වගකීම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

රුපියල්

| | රජයේ ප්‍රදාන ප්‍රාග්ධනය | අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන දායකත්වය | සංචිත | ප්‍රත්‍යාගණනය සංචිත | දිරි දීමනා සහ පුහුණු අරමුදල | සමුච්චිත අතිරික්තය/(හිඟය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 160,092,835.19 | 2,342,835.00 | 42,015,085.68 | 35,003,646.00 | 533,323.82 | (151,607,990.39) | 88,379,735.30 |
| ලැබුණු අරමුදල් සහ භාණ්ඩාගාරයෙන් පරිත්‍යාග කළ වාහන | 22,051,000.00 | | | | | | 22,051,000.00 |
| මිල දී ගත් පරිගණක සහ පරිත්‍යාග කළ වාහනවල ලියා හළ අගය ගැලපීම (COD & ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ව්‍යාපෘති) | | | (1,047,601.60) | | | | (1,047,601.60) |
| දිරි දීමනා අරමුදලේ ආයතනික කොටස (ව්‍යාපෘති අංක R 489) | | | 121,351.85 | | | | 121,351.85 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන සංචිත සහ අරමුදල් ගිණුම් ශේෂයේ ලියා හල අගය ගැලපීම | | (468,567.00) | (6,814,022.62) | | (106,664.76) | 7,389,254.38 | - |
| මිල දී ගත් සහ ලැබුණු පරිගණක වල ලියා හළ අගය ගැලපීම (R 318 සහ R 319 ව්‍යාපෘති) | | | (419,500.00) | | | 419,500.00 | - |
| ආදායම සහ වියදම | | | | | | (15,840,331.67) | (15,840,331.67) |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | **182,143,835.19** | **1,874,268.00** | **33,855,313.31** | **35,003,646.00** | **426,659.06** | **(159,639,567.68)** | **93,664,153.88** |

## මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
## 2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

1 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු

පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා පිළිවෙත්වලට අනුකූලව හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අදාළව ඓතිහාසික පිරිවැය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඇත.

1.2 වත්කම් තක්සේරු

(i) දේපළ ,පිරියත හා උපකරණ

a) ශේෂ පත්‍රයෙහි දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර දක්වා ඇත. පහත සඳහන් ක්ෂය අනුපාතයන් යටතේ සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කර තිබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2 1/2% per annum |
| උපකරණ/ගෘහ භාණ්ඩ | 10% per annum |
| පරිගණක | 20% per annum |
| සුහ සාධක උපකරණ | 10% per annum |
| පොත් | 10% per annum |
| වාහන | 20% per annum |

මිල දී ගත් වර්ෂයේ දී සමස්ත වර්ෂයටම ක්ෂය කරනු ලැබේ.

b) 2014 වර්ෂයේ දී ආයතනය සතුව තිබූ සියලු වාහන තක්සේරු කරනු ලැබූ අතර ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානය විසින් (FAO) 2012 වර්ෂයේ දී පරිත්‍යාග කරනු ලැබූ අංක 65-1280 දරන වාහනය තක්සේරු වටිනාකම මත 2014 වර්ෂයේ දී ගිණුම්වල ඇතුළත් කරන ලදී.

c) විගණකවරුන්ගේ උපදෙස් පරිදි යතුරු පැදි අංක 141-5655 සඳහා ක්ෂය වටිනාකමක් ලබා දී නැති අතර තීරණයකට එළඹෙන තෙක් රුපියල් 15,000ක තක්සේරු මුදලක් නියම කර තිබේ.

(ii) උපලබ්ධි වේ යැයි අපේක්ෂිත අගයන් වන ණය ගැතියන්ගේ වටිනාකම සඳහන් කර ඇත. බොල් සහ අඩමාණ ණය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කොට ඇත.වාර්තා කරන දිනය වන විට ශුද්ධ ණයවලින් 4%ක් අඩමාණ ණය වෙනුවෙන් වූ ප්‍රතිපාදන සඳහා වෙන් කොට ඇත.

(iii) තොගය
පාරිභෝගික තොග පිරිවැයට අගය කොට ඇත. අනෙකුත් තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි යන අගයයන්නෙන් අඩු අගය මත අගයකර ඇත. තොගයේ පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදය ලෙස ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමය (FIFO) භාවිතා කරයි.

1.3 පාරිතෝෂිතය
1983 අංක 12 දරන පාරිතෝෂක පනතට අනුව , පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම් සිදු කොට ඇත.

2015 වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව පදනම් කරගෙන සකස් කර ඇත.

1.4 ප්‍රවාහන සහ මුද්‍රණ වියදම්

ආයතනයේ සියලුම අංශ සහ පර්යේෂණ හා පුහුණු කිරීම් අංශ සඳහා වන ප්‍රවාහන සහ මුද්‍රණ වියදම් ගිණුම්ගත කළ යුතුව ඇත. එබැවින් එම වියදම් අනුමත අනුපාතයකට ගණනය කොට එම වියදම එකී අදාළ වියදම් අතර ප්‍රතිශතයකට ගළපා ඇත.

1.5 ප්‍රාග්ධන ලැබීම් සංචිත සහ අරමුදල් ක්ෂය වීම්

a. ආයතනය ආරම්භයේ සිට 2005 වසර දක්වා පවතින ප්‍රාග්ධන ලැබීම් සංචිත සහ අරමුදල් ගිණුම්වල ශේෂය සමුච්චිත හිඟ ගිණුමට වසර 5ක් තුළ සමාන ප්‍රමාණවලින් ලියා හළ ආකාරය පහත දැක්වේ.

| | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| ඉතිරි කිරීම්වලින් ප්‍රාග්ධන දායකත්වය. | 220,474.56 | 220,474.56 | 220,474.56 | 220,474.56 |
| ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල | 2,951,541.22 | 2,951,541.22 | 2,951,541.22 | 2,951,541.22 |
| ප්‍රාග්ධන සංචිත | 313,456.88 | 313,456.88 | 313,456.88 | 313,456.88 |
| ව්‍යාපෘති පොදු සංචිත | 3,260,395.49 | 3,260,395.49 | 3,260,395.49 | 3,260,395.49 |
| ප්‍රාග්ධන දායකත්වය | 468,567.00 | 468,567.00 | 468,567.00 | 468,567.00 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් | | | | |
| පුහුණු අරමුදල | 79,252.38 | 79,252.38 | 79,252.38 | 79,252.38 |
| දිරිදීමනා අරමුදල | 27,412.38 | 27,412.38 | 27,412.38 | 27,412.38 |
| දිරිදීමනා අරමුදලට ආයතනයේ කොටස 40% | 100367.17 | 100367.17 | 100367.17 | 100367.17 |
| | 7,421,467.08 | 7,421,467.08 | 7,421,467.08 | 7,421,467.08 |

b. 2007 වසරේ R-318 ව්‍යායපෘතියෙන් මිල දී ගත් පරිගණක දෙකක් සහ 2008 වසරේ R-359 ව්‍යාපෘතියෙන් ලැබුණු පරිගණක 03ක් ක්ෂය අනුපාත යටතේ 2015 වර්ෂය සඳහා සමුච්චිත හිඟ ගිණුමට මුළුමනින්ම ලියා හරිනු ලැබි ආකාරය පහත

| | |
|---|---|
| R-318 ව්‍යාපෘතිය (2007 වර්ෂය) | 128,500.00 |
| R-359 ව්‍යාපෘතිය (2008 වර්ෂය) | 291,000.00 |
| | 419,500.00 |

c. 2014 වසරේ COD අරමුදලින් මිල දී ගත් පරිගණක සහ ලෝක ආහාර සංවිධානයෙන් ලැබී 2014 වර්ෂයේ ගිණුම් ගත කළ අංක 65-1280 වාහනය 2014 සහ 2015 වර්ෂ සඳහා ක්ෂය අනුපාතය යටතේ සමානව ලියා හළ ආකාරය පහත දැක්වේ.

| | Year 2014 (Rs) | Year 2015 (Rs) |
|---|---|---|
| COD ව්‍යාපෘතියෙන් මිල දී ගත් පරිගණක | 287,601.60 | 287,601.60 |
| ලෝක ආහාර සංවිධානයෙන් පරිත්‍යාග කළ වාහනය | 760,000.00 | 760,000.00 |
| | 1,047,601.60 | 1,047,601.60 |

1.6 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධනය පහත ගැළපීම් සිදු කිරීමෙන් පසු ගණනය කොට ඇත.

a) බොල් හා අඩමාණ ණය සහ වෙන් කිරීම් සිදු කිරීම සහ ආයතනයේ එදිනෙදා මෙහෙයුම් වෙනුවෙන් වන අනාගත අසම්භාව්‍යයන් වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර තිබේ.ආයතනයේ දේපොළ , පිරියත සහ උපකරණ එලදායී ලෙස නඩත්තු කෙරෙයි.

b) වසර තුළ සිදු කරන ලද සියලු වියදම් සැලකිල්ලට ගෙන ඇත.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රුපියල්

**2 මුදල් හා මුදල් සමාන අයිතම**

| | 2015 | 2014 |
|---|---|---|
| අතැති මුදල් | 10,000.00 | 10,000.00 |
| බැංකුවේ ඉතිරි ශේෂය- A/c No 2323292 | 1,638,481.62 | 735,015.44 |
| බැංකුවේ ඉතිරි ශේෂය - A/c No 2323293 | 481,148.21 | 1,929,973.28 |
| බැංකුවේ ඉතිරි ශේෂය - A/c No 2323315 | 81,226.60 | 538,787.59 |
| බැංකුවේ ඉතිරි ශේෂය - A/c No 2323317 | 12,499,876.26 | 4,579,979.62 |
| | **14,710,732.69** | **7,793,755.93** |

**3 ලැබිය යුතු**

| | | |
|---|---|---|
| **සේවක ණය ගැතියෝ** | | |
| නිවාස ණය | 1,966,261.85 | 2,401,069.05 |
| ඒකාබද්ධ ණය | 17,919,014.28 | 17,274,495.96 |
| විශේෂ අත්තිකාරම් | 695.47 | 4,945.47 |
| උත්සව අත්තිකාරම් | 22,429.05 | 154,929.05 |
| ලැබිය යුතු ශ්‍රවණාගාර ආදායම | 356,565.00 | 411,412.50 |
| ලැබිය යුතු නේවාසිකාගාර ආදායම | 513,304.75 | 107,301.00 |
| සේවයෙන් ඉවත් වූවන්ගෙන් අයවිය යුතු | 6,723.32 | 6,723.32 |
| ශිෂ්‍යත්ව ණයගැතියෝ | 19,593,320.10 | 20,005,859.97 |
| | **40,378,313.82** | **40,366,736.32** |
| **අනෙකුත් ණය ගැතියෝ** | | |
| ලැබිය යුතු ආයෝජන ආදායම් | 159,743.05 | 184,667.18 |
| සේවා සංරක්ෂණ අභ්‍යාස ආයතනය | 6,806.38 | 6,806.38 |
| කේ.එන්.යූ ගුණසේකර | 12,100.00 | 12,100.00 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 85,527.16 | 85,527.16 |
| සේවයෙන් ඉවත් වූ සේවකයින්ගෙන් අයකර ගත යුතු දෑ | 606,795.87 | 558,866.21 |
| සරසවි පොත් හල | 4,272.25 | 4,272.25 |
| මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු දෑ | - | 54,592.24 |
| ණයගැතියෝ - විවිධ | 161,831.68 | 123,332.65 |
| R-481 යාපනය කලපුවෙන් සපයන පරිසර පද්ධති සේවාවන්හි වටිනාකම සහ අවට ගම්වාසීන්ගේ ජීවනෝපායන්ට කලපුවෙන් සපයන දායකත්වය | 111,921.59 | 1,023,459.78 |
| ආහාර සුරක්ෂිතතාවය සහ වෙළඳපොළ විශ්ලේෂණයට අදාළ පාදක සමීක්ෂණය | 337,490.58 | - |
| | **1,486,488.56** | **2,053,623.85** |
| | | |
| | **41,864,802.38** | **42,420,360.17** |
| **අඩු කළා:** | | |
| බෝල් සහ අවිනිශ්චිත ණය ගැතියන් වෙනුවෙන් වෙන් කිරීම් | (890,859.29) | (896,580.01) |
| ශිෂ්‍යත්ව ණයගැතියෝ සඳහා වෙන් කිරීම් | (19,593,320.10) | (20,005,859.97) |
| | **21,380,622.99** | **21,517,920.19** |

**4 ලැබිය යුතු දෑ**

| | | |
|---|---|---|
| **තැන්පත්** | | |
| ස්ථාවර - ආපන ශාලා හිමිකරු | 70,000.00 | 70,000.00 |
| ස්ථාවර - මුදල් අයකැමි | 11,353.44 | 10,725.97 |
| අනියම්- ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්) | 3,125.00 | 3,125.00 |
| අනියම් - තැපැල් ස්ථානාධිපති ජෙනරාල් | 24,945.00 | 24,945.00 |
| අනියම් - කොළඹ ගෑස් සහ ජල සමාගම | 4,750.00 | 4,750.00 |
| අනියම් - ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 500.00 | 500.00 |
| අනියම් - සෙල්ටෙල් ලංකා සමාගම | 3,500.00 | 3,500.00 |
| අනියම් - ලංකා විදුලි බල මණ්ඩලය | 406,250.00 | 406,250.00 |
| අනියම් - එම් ජී සැම්සන්ස් සහ පුත්‍රයෝ | 250,000.00 | 250,000.00 |
| | **774,423.44** | **773,795.97** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රුපියල්

**5 තොගය**

| | 2015 | 2014 |
|---|---|---|
| ප්‍රකාශන සහ ජර්නල | 2,757,389.00 | 2,393,087.00 |
| පාරිභෝගික භාණ්ඩ | 1,755,811.40 | 1,647,184.06 |
| අලෙවි මධ්‍යස්ථානය | 858,067.00 | 495,730.50 |
| | **5,371,267.40** | **4,536,001.56** |

**6 පූර්ව ගෙවීම්**

| | | |
|---|---|---|
| රථවාහන රක්ෂණ | 375,506.23 | 149,826.71 |
| ගොඩනැගිල් රක්ෂණ | - | 23,815.94 |
| | **375,506.23** | **173,642.65** |

**7 අනෙකුත් ජංගම වත්කම්**

| | | |
|---|---|---|
| මිල දී ගැනීම් අත්තිකාරම් | 171,427.00 | 100,920.00 |
| අත්තිකාරම් | 0.80 | 55,000.00 |
| | **171,427.80** | **155,920.00** |

**8 අනෙකුත් මූල්‍ය වත්කම්**

| | | |
|---|---|---|
| ඇමතුම් තැන්පතු | 1,500.00 | 1,500.00 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථිර තැන්පතු | 5,613,145.18 | 5,336,889.16 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථිර තැන්පතු-නිවාස ණය යෝජනා ක්‍රමය | 627,684.43 | 158,741.63 |
| | **6,242,329.61** | **5,497,130.79** |

9 යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ

වත්කම් ක්ෂය කිරීම පිළිබඳ උප ලේඛනය - 2015 දෙසැම්බර් 31

රුපියල්

| විස්තරය | 01.01.2015 දිනට පිරිවැය | 2015 වර්ෂය තුළ තුළ එකතු කිරීම් / බැහැර කිරීම් | 31.12.2015 දිනට මුළු පිරිවැය | 01.01.2015 දිනට සමුච්චිත ක්ෂය | 2015 වර්ෂය සඳහා ක්ෂය | 31.12.2015 දිනට සමුච්චිත ක්ෂය | 31.12.2015 දිනට ලිඛිත ශුද්ධ අගය |
|---|---|---|---|---|---|---|---|
| උපකරණ/ලී බඩු | 44,209,526.50 | 1,320,487.17 | 45,530,013.67 | 31,885,129.81 | 2,383,423.05 | 34,268,552.86 | 11,261,460.81 |
| පරිගණක ස්ථාපනය | 25,901,532.58 | 1,726,780.00 | 27,628,312.58 | 21,367,731.85 | 1,875,531.00 | 23,243,262.85 | 4,385,049.73 |
| මෝටර් වාහන | 58,332,665.00 | 13,277,900.00 | 70,544,565.00 | 11,763,862.00 | 14,081,580.00 | 25,632,242.00 | 44,912,323.00 |
| | | (1,066,000.00) | | (213,200.00) | | | |
| පොත් | 12,273,207.46 | 561,337.39 | 12,834,544.85 | 10,072,095.11 | 644,489.06 | 10,716,584.17 | 2,117,960.68 |
| සුභ සාධන උපකරණ | 3,734.55 | - | 3,734.55 | 3,733.55 | - | 3,733.55 | 1.00 |
| එකතුව | **140,720,666.09** | **15,820,504.56** | **156,541,170.65** | **74,879,352.32** | **18,985,023.11** | **93,864,375.43** | **62,676,795.22** |

10 ඉඩම් හා ගොඩනැගිලි

**වත්කම් ක්ෂය කිරීම පිළිබඳ උප ලේඛනය - 2015 දෙසැම්බර් 31**

| විස්තරය | 01.01.2015 දිනට පිරිවැය | 2015 වර්ෂය තුළ තුළ එකතු කිරීම් / බැහැර කිරීම් | 31.12.2015 දිනට මුළු පිරිවැය | 01.01.2015 දිනට සමුච්චිත ක්ෂය | 2015 වර්ෂය සඳහා ක්ෂය | 31.12.2015 දිනට සමුච්චිත ක්ෂය | 31.12.2015 දිනට ලිඛිත ශුද්ධ අගය |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 1,716,667.00 | - | 1,716,667.00 | - | - | - | 1,716,667.00 |
| ගොඩනැගිලි | 40,448,136.75 | 5,880,831.51 | 46,328,968.26 | 14,318,231.47 | 1,158,224.21 | 15,476,455.68 | 30,852,512.58 |
| | **42,164,803.75** | **5,880,831.51** | **48,045,635.26** | **14,318,231.47** | **1,158,224.21** | **15,476,455.68** | **32,569,179.58** |

වසර 30ක මෙහෙයුම් කල් බදු යටතේ පැල්වෙහෙර නිල නිවාසය 2011.12.12 දින අත් පත් කර ගන්නා ලදී.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රුපියල්

| | **ගෙවිය යුතු** | **2015** | **2014** |
|---|---|---|---|
| **11** | සමුච්චිත වියදම් | 9,525,273.73 | 7,335,757.19 |
| | ආපසු ගෙවන ටෙන්ඩර් ඇප තැන්පත් | 136,462.20 | 124,462.20 |
| | ආපසු ගෙවන ආපන ශාලා තැන්පතු -උපතිස්ස පරණමාන | 50,000.00 | 50,000.00 |
| | වැටුප් අත්තිකාරම් | 10,232.91 | 10,232.91 |
| | නොගෙවූ වියදම් | 192,344.11 | 179,728.18 |
| | සේවයෙන් ඉවත් වූ අයට ගෙවිය යුතු දෑ | 218,090.29 | 177,907.92 |
| | සේවක සහ ආපනශාලා තැන්පතුව | 13,084.50 | 13,084.50 |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 16,000.00 | 11,975.00 |
| | රඳවා තබා ගැනීම් | 258,253.18 | 85,087.41 |
| | ණය හිමියෝ | 2,082,081.16 | 833,300.00 |
| | මොබිටෙල් පෞද්ගලික සමාගම | - | 56,013.96 |
| | ලැබුණු අත්තිකාරම් - නේවාසිකාගාරය | 108,921.25 | - |
| | ලැබුණු අත්තිකාරම් - ශ්‍රවණාගාරය | 86,250.00 | - |
| | සුභ සාධක සංගමය | 3,197.00 | 4,321.00 |
| | ගෙවිය යුතු පාරිතෝෂික | 126,912.50 | - |
| | ගෙවිය යුතු බදු | 15,300.00 | - |
| | අමාත්‍යාංශයට ගෙවිය යුතු | 94,358.05 | - |
| | උපතිස්ස පරණමාන | 61,788.37 | - |
| | **ව්‍යාපෘති ණය හිමියෝ** | | |
| | R-470 ශ්‍රී ලංකාවේ අවම වියදම් ආහාර වේල- අධ්‍යයනය | 423,823.94 | 573,102.57 |
| | කඩිනම් ආහාර සුරක්ෂිතතාවය සහ අවශ්‍යතා ඇගයුම | 7,774.28 | - |
| | R - 505 ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත් වන ආන්තික කෘෂිකාර්මික ප්‍රජාවට කාලගුණික විපර්යාස හේතුවෙන් සිදුවන බලපෑමට පිළියම් | 805,403.61 | - |
| | | **14,235,551.08** | **9,454,972.84** |

| | **සේවක ප්‍රතිලාභ** | | |
|---|---|---|---|
| **12** | ජනවාරි 01 දිනට ශේෂය | 36,088,145.00 | 36,254,872.50 |
| | වර්ෂය තුළ ගෙවීම් | 3,310,572.50 | 4,347,617.50 |
| | වර්ෂය සඳහා ප්‍රතිපාදන | 3,595,007.50 | 4,180,890.00 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **36,372,580.00** | **36,088,145.00** |

| | **රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධන** | | |
|---|---|---|---|
| 13 | ජනවාරි 01 දිනට ශේෂය | 160,092,835.19 | 153,617,505.19 |
| | වර්ෂය තුළ ප්‍රාග්ධන දායකත්වය | 22,051,000.00 | 6,475,330.00 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය, | **182,143,835.19** | **160,092,835.19** |

| | **සංචිත** | | |
|---|---|---|---|
| 14 | ඉතිරි කිරීම් තුළින් ලද දායකත්වය | 881,898.23 | 1,102,372.79 |
| | ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල | 14,820,118.87 | 19,206,548.99 |
| | ප්‍රාග්ධන සංචිත | 2,928,827.52 | 3,242,284.40 |
| | ව්‍යාපෘති පොදු අරමුදල | 13,041,581.98 | 16,301,977.47 |
| | දිරි දීමනා අරමුදල - ආයතන කොටස | 2,182,886.71 | 2,161,902.03 |
| | | **33,855,313.31** | **42,015,085.68** |

| | **දිරි දීමනා හා පුහුණු අරමුදල** | | |
|---|---|---|---|
| 15 | දිරි දීමනා අරමුදල | 109,649.53 | 137,061.91 |
| | පුහුණු අරමුදල - ව්‍යාපෘති | 317,009.53 | 396,261.91 |
| | | **426,659.06** | **533,323.82** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රුපියල්

| | **සමුච්චිත හිඟය** | **2015** | **2014** |
|---|---|---|---|
| 16 | ජනවාරි 01 දිනට ශේෂය | 151,607,990.39 | 141,214,308.74 |
| | පෙර වසරවල් සඳහා ක්ෂය නිවැරදි කිරීම් | - | (175,143.97) |
| | පෙර වසරේ ගැලපුම්- - ඇමතුම් තැන්පතු සහ ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොළී | - | 26,857.43 |
| | පෙර වසරේ ගැලපුම් - ලැබිය යුතු නේවාසිකාගාර හා ශ්‍රවණාගාර ආදායම | - | 177,605.00 |
| | ප්‍රාග්ධන ප්‍රදාන සංචිත සහ අරමුදල් ගිණුම් ශේෂයේ ලියාහල අගයට ගැලපුම් | (7,808,754.38) | - |
| | දෙසැම්බර් 31 දිනට ආදායම මත වියදම | 15,840,331.67 | 10,364,363.19 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **159,639,567.68** | **151,607,990.39** |

| | **අනෙකුත් ආදායම්** | | |
|---|---|---|---|
| **17** | නේවාසිකාගාර ගාස්තු | 13,563,914.60 | 12,410,375.33 |
| | ශ්‍රවණාගාර ගාස්තු | 12,499,408.00 | 12,948,035.75 |
| | මොබිටෙල් පාරිභෝගික සේවයෙන් ලද ආදායම් | 94,512.99 | 70,532.15 |
| | ප්‍රකාශන විකිණීමෙන් ලද ආදායම් | 150,092.00 | 133,330.50 |
| | ආයෝජන පොළී | 435,112.22 | 553,029.12 |
| | සේවක ණය පොළී | 735,587.95 | 739,034.40 |
| | ව්‍යාපෘතිවලින් ලද පුනරාවර්තන දායකත්වය | 140,530.43 | 3,510,935.03 |
| | ශිෂ්‍යත්ව ණය ගැතියන් | 412,539.87 | 320,000.00 |
| | නිල නිවාස ගාස්තු සහ කාමර කුලියට දීම් | 21,260.25 | - |
| | පැල්වෙහෙර නවාතැන් ගාස්තු | 150,300.00 | 62,600.00 |
| | පරිගණක ආදායම් | 4,026.00 | 254.00 |
| | ටෙන්ඩර් ගාස්තු | 10,000.00 | 9,750.00 |
| | උපදේශන ආදායම | - | 328,000.00 |
| | පරිගණක වියදම හා සේවක කාලය | - | 94,628.93 |
| | වෙනත් ආදායම් | 321,653.79 | 165,912.15 |
| | වාහන විකිණීමෙන් ලද ලාභය | 2,209,960.00 | - |
| | | **30,748,898.10** | **31,346,417.36** |

| | **වැටුප් වේතන සහ සේවක ප්‍රතිලාභ** | | |
|---|---|---|---|
| **18** | වැටුප් -ස්ථිර සේවකයින් | 43,960,156.52 | 44,290,101.04 |
| | වැටුප් - බාහිර විමර්ශකයින් | 6,161,103.03 | 6,407,127.05 |
| | ජීවන වියදම් දීමනාව, විශේෂ දීමනාව සහ අනෙකුත් | 51,298,540.32 | 32,686,338.66 |
| | සේවක අර්ථසාධක අරමුදල | 10,171,934.82 | 10,134,549.69 |
| | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 2,034,386.98 | 2,026,883.45 |
| | සේවක අර්ථසාධක අරමුදල හා සේ.නි.භා.අ හිඟ | 14,376,238.87 | - |
| | අතිකාල | 2,750,879.83 | 2,692,273.71 |
| | පාරිතෝෂික | 6,854,467.50 | 4,180,890.00 |
| | පාරිතෝෂික අධිභාරය | 1,050,900.00 | - |
| | | **138,658,607.87** | **102,418,163.60** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රුපියල්

| | අනෙකුත් වියදම් | 2015 | 2014 |
|---|---|---|---|
| 19 | දේශීය යැපීම් සහ දේශීය ප්‍රවාහන | 1,740,496.63 | 1,526,975.25 |
| | විදේශ සංචාර දීමනා | 208,098.00 | 327,619.60 |
| | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 1,004,002.10 | 1,502,335.37 |
| | ඉන්ධන සහ ළිහිසි තෙල් | 1,469,975.45 | 2,161,253.33 |
| | නිල ඇඳුම් | 373,546.82 | 295,242.68 |
| | වාහන නඩත්තු කිරීම් | 1,183,707.89 | 1,054,975.85 |
| | ගොඩනැගිලි නඩත්තු කිරීම් | 752,944.49 | 1,132,705.25 |
| | පිරියත උපකරණ හා උපකරණ නඩත්තු | 1,439,427.92 | 1,973,887.88 |
| | දුරකථන ගාස්තු | 1,656,485.41 | 1,468,786.30 |
| | විදුලිය | 5,516,558.28 | 5,679,232.06 |
| | ජල බිල්පත් | 1,023,867.11 | 834,980.43 |
| | පළාත් පාලන ආයතනවලට ගෙවන බදු | 315,601.20 | 315,601.20 |
| | තැපැල් ගාස්තු | 410,500.00 | 401,070.00 |
| | ප්‍රවාහන | 567,507.50 | 428,770.00 |
| | වගකීම් පැහැර හරින්නන්ට එරෙහි නීති ක්‍රියා මාර්ග | 8,000.00 | 12,000.00 |
| | වාහන සඳහා තාක්ෂණික උපදෙස් වෙනුවෙන් ගෙවීම් | 82,500.00 | 120,000.00 |
| | ඉදි කිරීම් සඳහා තාක්ෂණික උපදෙස් වෙනුවෙන් ගෙවීම් | 165,000.00 | 37,500.00 |
| | පුවත්පත් | 256,670.00 | 271,060.00 |
| | බලපත්‍ර හා රක්ෂණ | 1,034,597.27 | 889,379.10 |
| | ආරක්ෂක සේවා ගාස්තු | 2,097,530.00 | 2,133,107.20 |
| | පිරිසිදු කිරීමේ සේවා ගාස්තු | 697,722.68 | 705,650.00 |
| | රෙදි ඇපුල්ලුම් සේවා සඳහා ගාස්තු | 702,205.00 | 445,515.00 |
| | විගණන ගාස්තු | 270,000.00 | 330,000.00 |
| | වෛද්‍ය ගාස්තු | 662,832.62 | 557,040.48 |
| | ආපනශාලා ගාස්තු | 56,393.00 | 141,340.00 |
| | විවිධ වියදම්- වෙනත් | 649,676.55 | 357,389.76 |
| | නීති ගාස්තු | 122,750.00 | 34,970.00 |
| | සුභ සාධන | 324,827.00 | 336,670.00 |
| | වෙළඳ දැන්වීම් | 359,889.75 | 1,365,759.99 |
| | සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 21,000.00 | 22,000.00 |
| | පාලක මණ්ඩලය | 180,400.00 | 582,500.00 |
| | මුද්‍රණ කටයුතු සහ ප්‍රකාශන | 1,116,159.91 | 1,294,956.31 |
| | විනෝදාස්වාද | 4,705.00 | 5,841.00 |
| | තොරතුරු ව්‍යාප්තිය | 982,050.00 | 1,140,305.00 |
| | විකිණුම් වියදම - ප්‍රකාශන | 146,712.00 | 133,330.50 |
| | රුදවුම් බද්ද | 37,570.08 | 48,124.89 |
| | විගණන හා කළමනාකරණ කමිටු | 100,400.00 | 63,600.00 |
| | සේවක සංවර්ධනය | 1,946,178.77 | 1,739,007.17 |
| | | **29,688,488.43** | **31,870,481.60** |

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඑල්/ඩී/එච්ආර්ටීඅයි/ 1/15/04    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2016 ජූලි 30 දින

සභාපති,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 05 දරන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතන පනතේ 24 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2016 මැයි 26 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34  +94-11-2887223  oaggov@sltnet.lk  www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජීවන වියදම් දීමනාව හා නිවාඩු දින වැටුප් අදාලකර ගනිමින් 2006 ජනවාරි සිට 2011 දෙසැම්බර් දක්වා සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී සේවකයින්ගෙන් අයකර ගතයුතු සියයට 10 ක ප්‍රමාණය වූ රු. 5,134,370 ක් අදාල සේවකයින්ගෙන් අයකරගෙන නොතිබූ අතර එය ආයතනයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) වර්ෂය තුළ මුදල් ගලා ඒම සහ ගලායාම පිළිබිඹුවන පරිදි ක්‍රියාකාරකම් හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණු අතර ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත දුර්වලතා නිරීක්ෂණය විය.

i. සමාලෝචිත වර්ෂය සඳහා මුදලින් ලද ආයෝජන ආදායම් රු. 258,365 ක් වූ අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.435,112 ක මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි.

ii. වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස්කිරීමේදී වර්ෂයේ ඌණතාවයට ගලපනු ලබන ගිණුම් සටහන් යටතේ ආයෝජන ආදායම් රු.435,112 ක් අඩුකළ යුතුවුවද එය එකතු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සිට ක්‍රියාකාරි තත්ත්වයේ පවතින ජීව වායු ඒකකය ඉදි කිරීම වෙනුවෙන් 2011 සහ 2013 වර්ෂ වල ගෙවන ලද රු. 1,020,200 මුදල හා රු. 225,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු අපද්‍රව්‍ය බහාලුමක වියදම ප්‍රාග්ධනිත කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස සලකා තිබුණි. ප්‍රාග්ධන ස්වරූපයේ වියදමක් වු මෙම වත්කම තව දුරටත් භාවිතා කරමින් පැවතුණි.

### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සමාලෝචිත වර්ෂය අවසානයට පාරිභෝගික භාණ්ඩ ශේෂය රු. 1,755,811 ක් වුවත් ඒ සඳහා ඉදිරිපත්කළ උපලේඛනය අනුව රු. 1,681,024 ක් වුයෙන් රු. 74,787ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පවතින ණයගැති හා ණයහිමි ශේෂ වල එකතුව පිළිවෙලින් රු. 20,005,156 ක් හා රු. 947,652 ක් වු අතර එම ශේෂ නිරවුල් කිරීමට ඵලදායි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,840,332 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,364,363 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,475,969 ක පිරිහීමක් විය. රජයේ ප්‍රදාන රු. 27,761,167 කින් වැඩිවීම, වැටුප් හා වේතන රු. 36,240,444 කින් වැඩිවීමත්, ක්ෂයවීම් රු. 2,713,095 කින් වැඩිවීමත් පුහුණු වියදම් රු.5,829,137 කින් අඩුවීම මූල්‍ය තත්ත්වයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී මූල්‍ය ප්‍රතිඵලයේ ඌණතාවියක් පැවතියද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම්වල ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.79,477,329 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු. 141,913,921 ක් දක්වා සියයට 79 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

i ගොවිජන පර්යේෂණයන් පෝෂණය කිරීම, සහය දැක්වීම,දිරිදීම සහ සාමූහිකත්වය ගොඩනැංවීම.

ii. රජයේ දෙපාර්තමේන්තු ,පළාත් පාලන ආයතන,රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ආයතන මගින් ලබා ගන්නා කෘෂිකාර්මික පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.

iii. කෘෂිකර්ම සංවර්ධනයට බලපාන ආයතනික කරුණු පිළිබඳ විමර්ශනය කිරීම සහ පර්යේෂණය කිරීම.

iv. කෘෂිකාර්මික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ඉඩම් භාවිතය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ අධ්‍යයනයන් කිරීම.

v. කෘෂිකාර්මික සහ ග්‍රාම සංවර්ධනය සම්බන්ධ සමාජ ආර්ථික පර්යේෂණ පැවැත්වීම.

vi. ශ්‍රී ලංකාවේ හෝ විදේශීය ආයතනයන්ගේ සහයෝගයෙන් හෝ ආයතනය මගින් ම පමණක් කෘෂිකාර්මික පර්යේෂණයන්ට සම්බන්ධ පුහුණු ක්‍රියාකාරකම් සහ වැඩසටහන් දියත් කිරීම මෙන්ම ඩිප්ලෝමා, උපාධි, ත්‍යාග සහ විශිෂ්ට සම්මාන ප්‍රදානය කිරීම.

vii. දේශිය, කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ,අධ්‍යයන වැඩ සටහන්,වැඩමුළු පැවැත්වීම සඳහා අනුග්‍රහය දැක්වීම.

viii. ආසියානු රටවල සහයෝගීතාවය මත කලාපීය අවශ්‍යතාවන් සපුරාලීමට ගොවි කටයුතු ව්‍යුහය තුළ පවතින ගැටලුවලට සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම සහ ගොවිකටයුතු වලට අදාළ ගැටලු සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමේ සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

ix. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විශේෂ අවධානය සහ පොදුවේ සෙසු ආසියානු රටවල කෘෂිකාර්මික සංවර්ධනයට සහ නවීකරණය සම්බන්ධ ගැටලු පර්යේෂණයට යොදා ගැනීම.

(අ) 1972 වර්ෂයේ සිට ආයතනය ක්‍රියාත්මකව පැවතියද පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

i. කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ,අධ්‍යයන වැඩ සටහන්,වැඩමුළු පැවැත්වීම සඳහා අනුග්‍රහය දැක්වීම.

ii. ආසියානු රටවල සහයෝගීතාවය මත කලාපීය අවශ්‍යතාවන් සපුරාලීමට ගොවිකටයුතු ව්‍යුහය තුළ පවතින ගැටලුවලට සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම සහ ගොවිකටයුතු වලට අදාළ ගැටලු සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමේ සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

iii. සෙසු ආසියානු රටවල කෘෂිකාර්මික සංවර්ධනයට සහ නවීකරණය සම්බන්ධ ගැටලු පර්යේෂණයට යොදා ගැනීම.

(ආ) ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර 2010,2012,2013 හා 2014 වර්ෂවල රු.11,571,000 ක් වැය කර තිබූ පර්යේෂණ ව්‍යාපෘති 21 ක වාර්තා 2016 අප්‍රේල් 26 දින වනවිටත් ප්‍රසිද්ධ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ගොවිජන ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණවල අවසන් වාර්තාව ප්‍රමාද වීම මත පර්යේෂණ වලින් ලැබෙන ප්‍රතිඵල අදාල ක්ෂේත්‍රයට ලබා දීමට නොහැකි බැවින් පර්යේෂණ වලින් බලාපොරොත්තු වන අරමුණ ඉටු නොවන බව ද නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පර්යේෂණ ව්‍යාපෘති 14 ක් නිම කිරීම සඳහා සැලසුම් කර තිබුණද 2016 අප්‍රේල් 26 දින වන විට එයින් පර්යේෂණ ව්‍යාපෘති 12 ක් නිම කර නොතිබුණි. එම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.7,672,000 ක් වූ අතර රු. 7,297,000 ක් වියදම් වී තිබුණි.

(ඈ) ආයතනයේ මූලික කාර්යයන් වන පර්යේෂණ සහ පුහුණු කිරීම්,පර්යේෂණ හා පුහුණු කිරීමේ කමිටුවේ නිර්දේශ ,යෝජනා සහ ඇගයීම් මත ක්‍රියාත්මක විය යුතු වුවද 2014 වර්ෂයේ කමිටු රැස්වීම් එකක් ද 2015 වර්ෂයේ කමිටු රැස්වීම් 02 ක් ද පමණක් පැවැත්වීමෙන් පර්යේෂණ හා පුහුණු කමිටුවේ නියෝජනයන් දායක කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඉ) ආයතනයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුල සැලසුම් කර තිබූ පුහුණු වැඩ සටහන් 80 ක් අතුරින් වැඩ සටහන් 43 ක් පමණක් පවත්වා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂක නිල නිවාසයේ බාහිර පාර්ශවයන් පදිංචිව සිටින අතර සමාලෝචිත වර්ෂය තුල දුරකථන හා ජල ගාස්තු වශයෙන් ආයතනය විසින් රු.73,543 ක් වැයකර තිබුණි.

(ආ) මූල්‍ය විෂමාචාරයන් හේතුවෙන් සහකාර ලේඛකාධිකාරි (පරිපාලන) ගේ වැඩ තහනම් කර තිබියදී ඔහු නැවත සේවයේ පිහිටුවා ඇති අතර ඒ සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශනය අවලංගු කර අළුතින් මූලික විමර්ශනයක් පවත්වන ලෙස පාලක මණ්ඩලය විසින් නියෝග කර තිබුණි. මූල්‍ය වංචාවකට චෝදනා ලද නිලධාරින් විනය පරීක්ෂණයකින් තොරව නැවත සේවයේ පිහිටුවීම ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 31 වගන්තියට පටහැනි වන අතර පරීක්ෂණ කටයුතු බාධාවකින් තොරව ඉටුකිරීමට නොහැකි තත්ත්වයක් ද එයින් උද්ගත වන බව නිරීක්ෂණය විය.

(ඇ) බැංකු ජංගම ගිණුමක රු. 12,499,876 ක මුදලක් සමාලෝචිත වර්ෂය පුරාම ආයෝජනය නොකර රඳවාගෙන තිබීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) ආයතනය සතු වාහනයක් 2013 වර්ෂයේ අළුත්වැඩියා කටයුතු සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට යවා ඇති අතර ඒ සඳහා රු. 116,628 ක් ගෙවා තිබුණද 2016 අප්‍රේල් 26 දින වනවිටත් වාහනය අළුත්වැඩියාකර ආයතනයට ගෙන්වාගෙන නොතිබුණි.

(ඉ) ආයතනය සතු නේවාසිකාගාරයේ කාමර ගාස්තු අය කිරීමකින් තොරව බාහිර පුද්ගලයන්ට ලබාදී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල ආයතනයට රු. 1,287,655 ක ආදායමක් අහිමි වී තිබුණි.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ලේඛකාධිකාරී තනතුර 2011 ජනවාරි 03 දින සිට විගණන දිනය වූ 2016 අප්‍රේල් 22 දක්වා වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) ආයතනයට ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරියෙකු හා පර්යේෂණ නිලධාරීන් පස්දෙනෙකු බඳවා ගැනීම සඳහා 2014 ජුලි 20 දින රු. 247,296 ක් වැයකර පුවත්පත් දැන්වීමක් පළ කර තිබූ අතර සංඛ්‍යාන නිලධාරී තනතුර සඳහා 2014 ඔක්තෝබර් 29 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අයදුම්කරුවෙකු තෝරා ගෙන තිබුණද 2016 අප්‍රේල් 20 දින වන විටත් මෙම බඳවා ගැනීම සිදුකර නොතිබුණි. පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට 2016 අප්‍රේල් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

වර්ෂය අවසානයට තථ්‍ය තොරතුරු පදනම් කරගෙන 2015 දෙසැම්බර් 05 දින අයවැය ලේඛනය සංශෝධනය කර තිබීමෙන් අයවැය ලේඛනය ආයතනයේ කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීම මඟ හැරී තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර පිළියෙල කර තිබුණු සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ලීබඩු හා කාර්යාලීය උපකරණ හා පරිගණක මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රතිපාදන හා තත්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

(ආ) වටිනාකම රු.1,726,780 ක් වූ පරිගණක 16 ක් මිලදි ගැනීමේදී සහ රු. 2,154,441 ක ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී ලංසු විවෘත කිරීමේ කමිටු පත්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.1,726,780 ක් පරිගණක මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයේ නිෂ්පාදනයන් දේශීය වශයෙන් එකලස් කිරීම හා සැපයුම්කරු ඉදිරිපත්කර තිබූ භාණ්ඩ සන්නම් නාමය සම්බන්ධයෙන් හා පසුගිය වර්ෂ 6 විකුණුම් පලපුරුද්ද සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් නොකිරීමේ හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රතික්ෂේප කල ආයතනයකින්

මිලදී ගැනිම සිදුකර තිබුණි. මෙම පරිගණකවල දෝෂයන් ඇති බව හා සේවා කොන්දේසි වලට අනුව නියමිතකාලය තුල සේවා කටයුතු සිදුනොකරන බවද පරිගණක ලබාදී තිබු අංශ විසින් පැමිණිලි ඉදිරිපත් කර තිබුණි.

(ඉ) තාක්ෂණික ඇගයීම් කමිටුව ,ප්‍රසම්පාදන කමිටුව සහ ලංසු විවෘත කිරීම සඳහා එකම නිලධාරියෙකු සම්බන්ධවී තිබුණි.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෝක ආහාර ව්‍යාපෘතියට අයත් වාහනයක් 2011 වර්ෂයේ ආයතනයට ලබා දී තිබුණු අතර වාහනයේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ විශ්වවිද්‍යාලයන්හි පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරූ ගිවිසුම් කඩකළ ශිෂ්‍යත්වලාභීන් 10 දෙනෙකුට එරෙහිව නඩු පවරා තිබුණු අතර එයින් ශිෂ්‍යත්වලාභීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 8,539,799 ක මුදලක් අයකර ගැනීමට අවිනිශ්චිත තත්ත්වයක පැවතිය බව කළමනාකරණය විසින් මා වෙත දැනුම් දී තිබුණි.

## 5.4 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.51 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් 05 දින දීය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ කෙටියෙන් |
|---|---|
| (අ) මූල්‍ය පරිපාලනය | ණය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධ වූ පාලනය | සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක නොකිරීම හා වාර්තා ප්‍රකාශයට පත්කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| (ඇ) වත්කම් පරිපාලනය | අරමුදල් ඵලදායි ලෙස අරමුණු ඉටුකිරීම සඳහා යොදා නොගැනීම හා වාහන කළමනාකරණයේ දුර්වලතා පැවතීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | දිගුකාලීන වැඩ බැලීමේ පත්වීම් සඳහා ස්ථිර නිලධාරීන් පත්නොකිරීම, පත්වීම් සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂණවල නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම, චෝදනා ලද සේවකයින් මූලික විනය පරීක්ෂණයකින් තොරව නැවත සේවයේ පිහිටුවීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

Fin/Aud/Qry/16 AGL/D/HARTI/1/15/04 2016.10.04

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිලිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

2016.07.30 දිනැතිව යොමුකරන ලද උක්ත වාර්තාවට අදාල කරුණු පැහැදිලි කිරීම් මේ සමග ඉදිරිපත්කරමි.

2. මූල්‍ය ප්‍රකාශන

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අප ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමේදී 10% ක් සේවකයාගේ වැටුපෙන් අඩුකරන අතර 15% ක් ආයතනය විසින් දායක වේ. ඒ අනුව සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10-(1) වගන්තිය අනුව සේවකයා තම මුළු ඉපයීම් වලින් 10% දායක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතුය.

එම පනතේ 10-(2) වගන්තිය අනුව සේව්‍යයා විසින් සේවකයාගේ මුළු ඉපයීම් වලින් 15% සමාන මුදලක් සේවක අර්ථසාධක අරමුදලට ඊට පසුව එළඹෙන මස තුල හෝ ඊට පෙර ගෙවිය යුතුය.

සේව්‍යයා විසින් සේවකයාට වැටුප් ගෙවන අවස්ථාවේ සේවකයාගේ දායක මුදල අඩුකර වැටුප් ගෙවීම සිදුකල යුතුය.

සේව්‍යයා විසින් සේවක දායක මුදල් සහ සේව්‍ය දායක මුදල් එකතුව මුළු දායක මුදල සේවක අර්ථසාධක අරමුදලට අදාල ආකෘති පත්‍රය පුරවා ගෙවිය යුතුය.

සේව්‍යයා මේ අයුරින් නියමිත වැටුප් ගෙවීම් අවස්ථාවේදී දායක මුදල් අඩුකරගෙන නොමැතිනම් ඒ සඳහා පසුව සේවකයාගේ වැටුපෙන් අඩුකල හැකි බවට පනතේ සඳහන් කර නොමැත.

එහෙත් සේව්‍යයා මුළු දායක මුදල එකවර ගෙවිය යුතු බැවින් සේව්‍ය සේවක දායක මුළු මුදල සේව්‍යයාට දැරීමට සිදුවනු ඇත. එබැවින් ආයතනය විසින් සේවක අර්ථ සාධක අරමුදලට සම්පූර්ණ දායක මුදල බැරකර ඇත. තවද 2013 මැයි මස සිට නිවැරදිව සේවකයාගෙන්

අඩුකිරීම සිදුකර දායක මුදල් බැරකිරීම සිදුකෙරේ. කම්කරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශකගෙන් මේ පිළිබඳව පැහැදිලි කිරීමක් ලබාදෙන ලෙස ලිඛිතව ඉල්ලීමක් යොමුකර ඇති නමුත් මෙතෙක් ඊට පිළිතුරු ලැබී නොමැත. මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් අදාල පාර්ශවය වෙත යොමු කර ඇත.

(ආ) (i) එකඟ වෙමි.

ඉදිරියේදී මුදලින් ලද ආයෝජන ආදායම පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කිරීමට සටහන් කර ගතිමි.

(ii) එකඟ වෙමි.

ඉදිරි වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට සටහන් කර ගතිමි.

(ඇ)

- ජීව වායු ඒකකය මුලිකව ස්ථාපිත කරනු ලැබුවේ නියමු ව්‍යාපෘතියක් ලෙසය. මෙම ඒකකය ස්ථාපනයේ ප්‍රධාන අරමුණ වූයේ මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය භාවිතයෙන් ජීව වායුව නිෂ්පාදනය කිරීමත් එමගින් මුළුතැන්ගෙයි මෙන්ම නිවසේ / ආයතනයේ බලශක්ති අවශ්‍යතාවයෙන් යම් ප්‍රමාණයක් හෝ සපයා ගැනීමට ඇති හැකියාව සොයා බැලීමත්ය.

  මෙය පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස (R-404) හඳුන්වා දී තිබූ අතර අදාල කාල වකවානුව තුල මෙම ජීව වායු ඒකකය පර්යේෂණ හා අධ්‍යයන මට්ටමේ මෙන්ම වැඩිදියුණු කිරීම් වලට ලක් කරමින් පැවතීම හේතු කොට ගෙන ප්‍රාග්ධනික නොකරන ලදී.

  නමුත් දැනට එය ක්‍රියාකාරී මට්ටමේ පවතින බැවින් විගණනය පෙන්වා ඇති කරුණුවලට අවධානය යොමුකර 2016 ගිණුම් සකස්කිරීමේදී ජීව වායු ඒකකය ප්‍රාග්ධනික කිරීමට අවශ්‍ය ගිණුම් සටහන් තැබීමට කටයුතු කරනු ලැබේ.

- 2015/06/16 දිනැති සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය මගින් නිකුත් කර ඇති ලිපිය අනුව ආයතනයේ මුළුතැන්ගෙය අසල ඇති කුණු කාමරය දින 21 ක් තුළ ඉවත් කරන ලෙස දන්වා ඇත. එයට විසඳුමක් වශයෙන් 2015/7/22 දින රු.249,750.00 ක් වැයකර මෙම අපද්‍රව්‍ය බහාලුම මිලදී ගන්නා ලදි. මෙය වියදමක් වශයෙන් ගිණුම් ගත කර ඇතත් 2016 වර්ෂයේදී ප්‍රාග්ධනික වියදමක් ලෙස නිවැරදි කරමි.

### 2.2.2. පැහැදිලි නොකල වෙනස්කම්

**පාරිභෝගික භාණ්ඩ**

මෙම වෙනසට ප්‍රධාන හේතුව වන්නේ හිටපු ගබඩා භාරකරු එන්.එස්. වික්‍රමාරච්චි මහතා ගබඩාවේ සේවය කරන කාලය තුළ ගබඩා භාණ්ඩවල ඌනතාවයි. එම ඌනතාවය ඔහුගේ අවසන් ගිණුම් වාර්තාවේ ඇතුලත් කර ඔහුගෙන් අයකර ගැනීම සිදුකර ඇත.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට ලැබිය යුතු ණයගැති ශේෂ අතරින් ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගේ ශේෂය රු.19,593,320.10 ක් වන අතර ආයතනය විසින් එම මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. තවද සේවය හැර ගිය හා සේවයෙන් ඉවත්ව ගිය සේවකයන්ගෙන් අයකර ගත යුතු මුදල රු.286,532.75 ක් වන අතර එම මුදල් අයකරගැනීම සඳහා ලිපි යොමු කර ඇත. සරසවි පොත් ආයතනයෙන් ලබාගත යුතු මුදල් ලබාගැනීම සඳහා ද ලිපියක්

යොමු කර ඇත. ඒ අනුව තවදුරටත් සොයාබැලිය යුතු වර්ෂ 05 කට වඩා වැඩි ඉතිරි ණයගැති ශේෂය රු. 121,085.91 වන අතර ඉදිරියේදී ඒ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගනිමි.

වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පවතින ණයහිමි ශේෂ අතරින් උපචිත වියදම් රු.646,965.00 ක් පවතින අතර එය ගෙවිය යුතු විගණන ගාස්තු වේ. එම මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. තවද ආයතනයේ හිටපු පර්යේෂණ නිලධාරි ටී. රවිචන්ද්‍රන් මහතාට ගෙවිය යුතු රු.150,015.00 ක් පවතින අතර එම මහතා ශිෂ්‍යත්වලාභී ණයගැතියකු වන වී. සත්ගුණරාජා මෙනවියට ඇපවී ඇති බැවින් එම ශේෂය ගිණුම්වල පැවතිය යුතුවේ. එසේම ආපනශාලා භාරකරු වන උපතිස්ස පරණමාන මහතාගේ ආපනශාලාව පවත්වාගෙනයාමේ කටයුතු වෙනුවෙන් තබන ලද තැන්පතුව වන රු.50,000.00 ද ගිණුම්වල පැවතිය යුතුය. ඒ අනුව තව දුරටත් නිරවුල් කලයුතු වර්ෂ 05 කට වඩා වැඩි ඉතිරි ණයහිමි ශේෂය රු.100,671.91 වන අතර ඉදිරියේදී ඒ සම්බන්ධ අවශ්‍ය කටයුතු කරමි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉකුත් වර්ෂය හා සාපේක්ෂව සැසඳීමේදී සේවක වැටුප් වේතන හා අනෙකුත් සේවක වියදම් (Wages, salaries and employee benefits) වැඩි අගයක් ගැනීම සහ වාර්ෂික ක්ෂය වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි ඌනතාවය වැඩිවීමට හේතුවී ඇත.

## *4.* මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්ය සාධනය

(අ) කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ, අධ්‍යයන වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම සඳහා අප ආයතනය මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම ආයතනය ඇරඹූ අවධියේ සිටම ආයතනය විසින් සංවිධානය කර ඇති පහත සඳහන් වැඩමුළු, සම්මන්ත්‍රණ පුහුණු වැඩසටහන් හා අධ්‍යයන චාරිකා දෙස බැලීමේදී පැහැදිළිවේ.

(i) ආයතනය විසින් සංවිධානය කර ඇති කලාපීය වැඩමුළු, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් හා අධ්‍යයන චාරිකා

1. නෙදර්ලන්තයේ වාගනින්ගන්හි කෘෂිකර්ම මධ්‍යස්ථානය මගින් සම්බන්ධීකරණය කල කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි සංවර්ධනය හා නැඹුරු වූ පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර පාඨමාලාව යටතේ 1984 වසරේ සිට වසර 4 ක් ආයතනය විසින් ක්ෂේත්‍ර අත්දැකීම් ලබාදෙනු ලබන පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකර ඇති අතර ඒ යටතේ ජාත්‍යන්තර පුහුණුලාභීන්ට අවශ්‍ය පුහුණුව ලබා දී ඇත.

2. ආයතනය ජාතික කළමනාකාරිත්ව ආයතනය (NIBM) හා එක්ව ආසියානු ඵලදායීතා සංවිධානයේ (APO) සහාය ඇතිව 1986 ඔක් 6-31 කාලය තුලදී "ග්‍රාමීය ව්‍යාපෘති සංවර්ධනය" හා සම්බන්ධව ජාත්‍යන්තර පුහුණු පාඨමාලාවක් ආයතනය තුල සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලැබින.

3. 1999 දී මියන්මාර් රජයේ නිලධාරීන් සඳහා කෘෂි අලෙවිකරණය හා ආහාර තොරතුරු පිළිබඳව පාඨමාලාවක් මෙන්ම අධ්‍යයන චාරිකාවක් සකසා ක්‍රියාත්මක කර ඇත.

4. 2000 වසරේ දී ආයතනය 'බංගලාදේශයේ පිහිටි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ආසියා හා ශාන්තිකර කලාපීය මධ්‍යස්ථානය (සර්ඩැප්) හා එක්ව ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කරණයේදී භාවිතා කලහැකි සහභාගීත්ව ක්‍රමෝපායන් (RRA/PRA and PCM) සම්බන්ධයෙන් ආයතනය තුල ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කරනු ලැබින.

5. ආයතනය විසින් ඉන්දියාවේ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනය (NIRD) හා සර්ඩැප් (CIRDAP) ආයතනය හා එකතුව 2006 වසරේ නොවැ 14-23 දක්වා "ග්‍රාමීය සංවර්ධනය සඳහා තොරතුරු හා සංනිවේදනය භාවිතා කිරීම" සම්බන්ධව අන්තර් ජාතික පුහුණු වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළේය.

6. 2011 වසරේ දී ආයතනය විසින් ඉන්දියාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ජාතික ආයතනයේ (NIRD) විශේෂඥයින් සඳහා ග්‍රාමීය ජල සැපයුම් ක්‍රම පිළිබඳව අධ්‍යයන චාරිකාවක් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදී.

7. 2014 වසරේ දී ආයතනය විසින් සර්ඩැප් ආයතනයේ අනුග්‍රහය ඇතිව "එළවළු හා පළතුරු ආශ්‍රිත කෘෂි නිෂ්පාදන අලෙවිකරණයේදී පශු අස්වනු හානි අවම කර ගැනීමේ භාවිත ක්‍රම" මැයෙන් ජාත්‍යන්තර පුහුණු වැඩමුළුවක් සංවිධානය කර ක්‍රියාත්මක කෙරින.

8. 2015 වසරේ දී ආයතනය විසින් බංගලාදේශයේ ග්‍රාමීය සංවර්ධන ආයතනයෙන් කල ඉල්ලීමකට අනුව ඉන්දියානු ග්‍රාම සංවර්ධන විශේෂඥයින් පිරිසකට ලංකාවේ සාර්ථක ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව අත්දැකීම් ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලදී.

(ii)/(iii) ආසියානු රටවල සහයෝගය මත කලාපීය අවශ්‍යතාවන් සපුරාලීමට ගොවිකටයුතු ව්‍යුහය තුළ පවතින ගැටලු වලට සම්බන්ධ පර්යේෂණ හැඳින්වීම හා ආසියානු රටවල කෘෂිකාර්මික සංවර්ධනයට සහ නවීකරණයට සම්බන්ධ ගැටළු මතද පර්යේෂණ සිදු කර ඇත.

මෙහි පහත දක්වා ඇත්තේ එසේ අන්තර් ජාතික වශයෙන් සර්ඩැප් ආයතනය හා එක්වත් වෙනත් ආයතන සමඟත් එකතුව සිදුකල අධ්‍යයනයන්ය

1. ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ ආසියානු සමීක්ෂණය - 1973

2. ආසියාවේ ග්‍රාම සංවර්ධනයෙහි ලා ග්‍රාමීය සංවිධාන සතු කාර්යභාරය - 1976

3. ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා පරිපාලනය පිළිබඳ සර්ඩැප් ආයතනයේ අනුග්‍රහයෙන් පැවැත්වූ කලාපීය අධ්‍යයනයෙහි දේශීය අධ්‍යයනය - 1977

4. හවායි පෙර අපර මධ්‍යස්ථානයේ (East – West Centre) සම්පත් ක්‍රම ආයතනය විසින් සංවිධානය කර සම්බන්ධීකරණය කල ලංකාව, ඉන්දියාව, පකිස්ථානය ආදි රටවල් වල පොහොර අලෙවිය හා බෙදා හැරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කල කලාපීය අධ්‍යයනය - 1980

5. සර්ඩැප් ආයතනය විසින් ප්‍රජා තොරතුරු සැපයීම සහ සැලසුම් සම්පාදනය මඟින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනයෙහි ලා ප්‍රජා සහභාගීත්වය ඇති කිරීම පිළිබඳ සියලු සර්ඩැප් රටවල (14) අදියර

දෙකකින් ක්‍රියාත්මක කල කාර්ය බද්ධ පර්යේෂණයට ආයතනය සහභාගී වීම (1984 සහ 1990 දී අදියර දෙක සඳහා)

6. 1985 දී සර්ඩැප් ආයතනය සියලු සාමාජික රටවල ක්‍රියාත්මක කල සුළු පරිමාණ ගොවිතැන් ක්‍රමයන්හි ඵලදායීතා සහ රැකියා කෙරෙහි බලපෑම් පිළිබඳ අධ්‍යයනයට සම්බන්ධ වීම

7. 1989 දී සර්ඩැප් ආයතනය සියලු සාමාජික රටවල ක්‍රියාත්මක කල ආසියාවේ සුළු ගොවීන් උදෙසා වන කෘෂිකාර්මික සේවාවන්ගේ සංවිධානාත්මක හා කළමනාකරණ කටයුතු පිළිබඳ අධ්‍යයනයට සහභාගී වීම

8. 1990 දී සර්ඩැප් ආයතනය ක්‍රියාත්මක කල කුඩා පරිමාණ වාරිමාර්ග ග්‍රාමීය දිළිඳු ජනතාව කෙරෙහි බලපාන අයුරු හා ඒවා ක්‍රියාත්මක කිරීමට දකුණු ආසියාවේ ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳ පසු විපරම් කාර්යබද්ධ පර්යේෂණය

9. 1992 සිට සර්ඩැප් ආයතනය විසින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා ආදර්ශ ගම්මාන (MVRD) නමින් සියලු සාමාජික රටවල ක්‍රියාත්මක කල අධ්‍යයනය සඳහා ආයතනය සම්බන්ධ විය

10. 1994 දී හා 1998 වසර වල සර්ඩැප් ආයතනය සියලු සාමාජික රටවල අදියර දෙකකින් ක්‍රියාත්මක කල සුළු ගොවීන් උදෙසා කෘෂිකාර්මික සේවා සැපයුම් පද්ධති ශක්තිමත් කිරීම පිළිබඳ අධ්‍යයන වලට සහභාගී වීම

11. ලෝක ආහාර සංවිධානය විසින් 2008 වසරේදී ආසියානු රටවල් ගණනාවක් ඇසුරින් සිදු කල දුප්පතුන් හා හිතකර වන්නා වූ ප්‍රතිපත්තිමය කතිකාවත (Pro-poor policy formulation dialogue) නම් වූ අධ්‍යයනය ශ්‍රී ලංකාව වෙනුවෙන් දායක වුයේ ආයතනයයි.

ගොවිකටයුතු වලට අදාල ගැටලු සම්බන්ධ තොරතුරු රැස් කිරීමේ සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් ද ආයතනය 1980 දශකයේ මුල් භාගයේ පටන්ම ක්‍රියාත්මක වෙමින් පවතී. ආයතනය තුල දත්ත රැස්කිරීමේ සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් Statistics and Data Processing නමින් USAID ආයතනයේ ද සහයෝගය ඇතිව පිහිටුවා ඇත්තේ ඒ ආකාරයට දේශියව මෙන්ම ජාත්‍යන්තරව ද දත්ත ඉල්ලුම්කරුවන්ට දත්ත ලබාදීම සඳහාය.

ඊට අමතරව බංගලාදේශයේ පිහිටි සර්ඩැප් නම් වූ ආයතනය අප රට ඇතුළු ආසියානු රටවල් 15 ක ග්‍රාමීය සංවර්ධනයේ තත්වය විදහාපාමින් සකසන "CIRDAP Rural Development Report" යන වාර්තාවට ශ්‍රී ලංකාවේ දුප්පත්කම හා ග්‍රාමීය සංවර්ධනය හා අදාල තොරතුරු සපයනු ලබන්නේ අප ආයතනය විසිනි. සෑම වර්ෂ දෙකකට වරක් එම තොරතුරු යාවත්කාලීන කරන අතර විශේෂ මාතෘකාවක් යටතේ වාර්තාවක් ද සකසවා ගනී.

ශ්‍රී ලංකාව තුල අප ආයතනයට අදාල ක්ෂේත්‍රයන්හි යම් යම් පර්යේෂණ සිදු කරවා ගැන්මට අවශ්‍ය විදේශ ආයතන, අප ආයතනය මධ්‍යස්ථානයක් සේ සලකා ඒ සඳහා ආයතනයේ සහාය ලබා ගෙන ඇත. පහත අධ්‍යයන එවැනි ඒවාය.

1. නෙදර්ලන්තයේ වාගනින්ගන්හි කෘෂිකාර්මික විශ්වවිද්‍යාලය 1979 දී ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයෙහි සැලසුම්කරණය පිළිබඳව කල අධ්‍යයනයට ආයතනය මුල් කරගෙන ඇත.

2. 1979 දී එක්සත් රාජධානියේ රෙඩින් විශ්වවිද්‍යාලය විසින් වියලි කලාපයේ ගොවිපල බලය, ජල භාවිතය හා තීරණ ගැනීමෙහි ලා උප මානයන් පිළිබඳ අධ්‍යයනය සඳහා ආයතනය සම්බන්ධ කරගෙන ඇත.

මීට අමතරව පුස්ථකාල ක්ෂේත්‍රයේ තොරතුරු ලබා ගැනීම සඳහා ආයතනය මධ්‍යස්ථානයක් සේ සලකා ක්‍රියාකාරී වී ඇති බව පහත උදාහණයන්ගෙන් පැහැදිලි වෙයි.

1. අන්තර් ජාතික පුස්තකාල සේවා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස ආසියානු හා පැසිෆික් කලාපීය සමාජ විද්‍යාත්මක තොරතුරු ජාලය යටතේ ආයතනයේ පුස්තකාලය ශ්‍රී ලංකාවේ පුස්තකාල නියෝජනය කරන මධ්‍යස්ථානය ලෙස 1970-80 ගනන් වලදී සැලකිල්ලට භාජනය වී ඇත.

2. 1987 දී යුනෙස්කෝ ආයතනය විසින් ඇරඹූ ආසියානු හා පැසිෆික් කලාපයේ විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු හා අත්දැකීම් හුවමාරු කිරීම පිළිබඳ කලාපීය ජාලය ආශ්‍රිත මධ්‍යස්ථානයක් ලෙස ආයතනය කටයුතු කෙරිනි.

(ආ) 2010 – 2014 අතර කාලය තුලදී සිදුකර ප්‍රකාශයට පත්වීමට නියමිතව තිබූ පර්යේෂණ අතරින් 12 ක් මේ වනවිට ප්‍රකාශයට පත්ව ඇති අතර ඉතිරියෙන් ද සැලකිය යුතු ප්‍රමාණයක් පර්යේෂකයින් විසින් කලයුතු කටයුතු නිමවා ප්‍රකාශන අංශයට බාර දී ඇත. එහෙත් එම අංශයේ ඇතිවී ඇති ප්‍රකාශන නිලධාරීන් ඇතුලු අනෙක් නිලධාරී පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පවත්නා ප්‍රමාදය ඒවා ඉක්මනින් එලිදැක්වීම ප්‍රමාද වීමට බලපා ඇත.

2010 – 2014 කාලය තුල ක්‍රියාත්මක කල ප්‍රකාශ වීමට නියමිතව තිබූ අධ්‍යයන වල ප්‍රගතිය

| වර්තමාන ප්‍රගතිය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 1. ප්‍රකාශයට පත් | 12 | 41 |
| 2. ප්‍රකාශයට සුදානම්ව පවතින (සෝදුපත් කියවන) | 8 | 28 |
| 3. භාෂා සංස්කරණය | 2 | 7 |
| 4. බාහිර විමර්ශන අදහස් ඇතුලත් කිරීම | 4 | 14 |
| 5. බාහිර විමර්ශනය සඳහා යවනු ලැබූ | 2 | 7 |
| 6. තවදුරටත් වැඩි දියුණු කරන | 1 | 3 |
| එකතුව | 29 | 100 |

ප්‍රකාශයට පත්වීමට නියමිත ඉහත දැක්වූ ඇතැම් අධ්‍යයන සොයාගැනීම් හා සම්බන්ධව ප්‍රතිපත්ති සංක්ෂිප්තයන් සකසා යැවීම මත ඒවායේ සොයා ගැනීම් කෙරෙහි ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය දිනා ගැනීමට සමත්ව තිබේ. ඒ මත ඇතැම් තීරණ ගැනීම සඳහා ද ඒවා උපකාරී වී ඇත. උදා: නකලස් රක්ෂිතයේ එනසාල් වගාව හා සම්බන්ධයෙන් සකසා ඇති අධ්‍යයනයෙහි සොයා ගැනීම් මත එම වගා කරන්නන් සම්බන්ධයෙන් වැදගත් තීරණයක් ගෙන ඇත.

(ඇ) ජංගම ගිණුම් අංක 2323317 හි ආයතනයේ පැරණි වාහන විකිනීමෙන් ලද මුදල් හා ආයතන ඉපයීම් ඇතුලත් වේ. එම මුදල් යොදවාගෙන නව වාහනයක් මිලදී ගැනීම සඳහා ආයතනය බලාපොරොත්තු වූ අතර ඒ පිළිබඳව අනුමැතිය ඉල්ලා 2015 සැප්තැම්බර් මස ආමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත ලිපියක් යවා ඇත. මේ සඳහා 2015 වර්ෂයේ අනුමැතිය නොලැබූ බැවින් මිලදී නොගන්නා ලදී. කෙසේනමුදු 2016 වර්ෂයේ නැවත මෙම ගිණුමේ ඇති මුදල් යොදවාගෙන වාහනයක් මිලදී ගැනීමට අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබෙනතෙක් ජංගම ගිණුමේ ඇති මුදල් තාවකාලිකව ලංකා බැංකුවේ දින 7හි කාලීන තැන්පතුවක (7 day call deposits) ආයෝජනය කර ඇත.

(ඈ) ජර්මානු කාර්මික විද්‍යාලයට යවා ඇති 32-5590 අංක දරන වාහනයේ අළුත්වැඩියා කටයුතු නිමකර ඇත. වාහන තාක්ෂණ නිලධාරි මගින් ඒ පිළිබඳ පරීක්ෂාවක් ද සිදු කර ඇත. ජර්මානු කාර්මික විද්‍යාලය මගින් මෙම වාහනය සඳහා ඉදිරිපත් කර තිබූ බිල වෙනුවෙන් මුදල් ගෙවීම් කර ඇත. නමුත් ආයතනයේ වෙනත් වාහනයක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ජර්මානු කාර්මික විද්‍යාලයට ගෙවීම් කිරීමට ඇත. එම ගෙවීම සිදුකර 32-5590 දරණ වාහනය ආයතනය වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(ඉ) මෙම මුදල ගෙවන ලෙස අමාත්‍ය ආරක්ෂක අංශයට දැනුම් දුන් අතර ඔවුන්ගේ උපදෙස් පරිදි අනුරාධපුර පොලිස් කොට්ඨාශයට යොමු කර ඇත. ඒ අයගේ ප්‍රතිචාර අනුව ඉදිරිකටයුතු කරනු ලැබේ.

4.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) මේ සඳහා කීප වතාවක් පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවූ නමුත් බඳවා ගැනීමේ පරිපාටියට අනුව සුදුස්සෙකු තෝරා පත් කර ගැනීමට නොහැකි විය. මේ වන විට අදාල තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

(ආ) ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරි

මෙම තනතුර අභ්‍යන්තර සුදුසු අයෙකුගෙන් පිරවීම සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය උපදෙස් සඳහා යොමුකර ඇත.

පර්යේෂණ නිලධාරි

ඉල්ලුම් පත් කැඳවා ලිඛිත පරීක්ෂණයක් පවත්වා ඇති අතර ඉන් සමත් අය සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීමට කටයුතු කෙරේ.

5. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

5.1 අයවැය ලේඛනමය පාලනය
ඇස්තමේන්තු හා තත්‍ය අගයන් අතර විචලනයන් අවධානයට යොමුකර පාලනය කිරීමට කටයුතු කරනු ලැබේ.

5.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

(අ) ප්‍රසම්පාදන සැලැස්ම මාසිකව යාවත්කාලීන කරනු ලබන අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.

(ඇ) 2015 වර්ෂයේ පර්යේෂණ සැලැස්ම ගරු කෘෂිකර්ම ඇමතිතුමාගේ අදහස් දැක්වීම මත සංශෝධනය කිරීමට සිදුවූ නිසා එයට අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුනේ 2015 .05.12 දින දීය. ඒ අනුව එම පර්යේෂණ වල ක්ෂේත්‍ර කටයුතු අවසන් කිරීමට සිදුවූයේ වසර අවසානයේ බැවින් වාර්තා සැකසීම ආදි කටයුතු නිම කිරීම සඳහා තවත් කල් අවශ්‍ය විය. 2015 වසරේ අධ්‍යයන ප්‍රමාද වීමට වර්ෂය මුලදී ආයතනයේ සිටි පර්යේෂකයින් දෙදෙනකු ඉවත්ව යාමත් වර්ෂය මැදදී තවත් දෙදෙනෙක් උසස් අධ්‍යාපනය සඳහා යාමත් බලපානු ලැබින. 2016 වර්ෂයට නියමිත පර්යේෂණ ද ආරම්භ කිරීමට සිදු වීම නිසා 2015 වසරේ පර්යේෂණ වල වාර්තා සැකසීමෙහි තව දුරටත් ප්‍රමාදයක් ඇතිවිය. 2015 වර්ෂයේ පර්යේෂණ වල ප්‍රගතිය පහත දක්වා ඇත.

| වර්තමාන තත්වය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 7. ප්‍රකාශයට පත් කල | 1 | 7 |
| 8. අවසන් කල හා වාර්තා අමාත්‍යාංශයට යැවූ | 2 | 13 |
| 9. බාහිර විමර්ශයනයට යැවූ | 1 | 7 |
| 10. පළමු කෙටුම්පත් අවසන් කල | 6 | 40 |
| 11. පළමු කෙටුම්පත සකසනු ලබන | 5 | 33 |
| එකතුව | 15 | 100 |

(ඈ) පර්යේෂණ හා පුහුණු කමිටුව වර්ෂයකට දෙවරක් වැනි සුළු වාර ගණනක් රැස් කලද එම කමිටුවේ අදහස් හා උපදෙස් ආයතනයේ පර්යේෂණ සඳහා නොකඩවා ලබා ගැනේ. සියලුම පර්යේෂණ වාර්තා විමර්ශනය කරනු ලබන්නේ එම කමිටු සාමාජිකයින් වන අතර වෙනත් විශේෂඥයන්ට දෙනු ලබන්නේ ඔවුන් අතර ඒ සඳහා සුදුසු අය නොමැති විට ඔවුන්ගේද නිර්දේශ ලබා ගැනීමෙනි.

පර්යේෂණ වල නියැදි තෝරා ගැනීම් හා වෙනත් උපදෙස් අවශ්‍ය වන අවස්ථාවන්හිදී ඒ අය නිරන්තරයෙන් මුනගැසේ. වර්ෂය මුල හා මැදදී පර්යේෂණ යෝජනා පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා හා ඒවා වැඩි දියුණු කිරීම සඳහා ඒ අයගේ උපදෙස් ලබා ගැනේ. ඒ අය වඩාත් කාර්ය බහුල පුද්ගලයින් නිසා නිතර රැස්කර ගැනීමට ද අපහසුය.

(ඉ) 2015 වර්ෂයේ දී සැලසුම් කල පුහුණු වැඩසටහන් මුළු ප්‍රමාණයම අවසන් කිරීමට නොහැකි වූයේ ක්‍රියාකාරි සැලැස්ම අනුමත වීම ප්‍රමාද වීමත් ඒ හේතුවෙන් වර්ෂයේ ඉදිරි කාලය තුල හැම පර්යේෂකයකුම තම ව්‍යාපෘති කෙරෙහි මූලික අවධානය යොමු කිරීම හේතුවෙන් ඔවුන් සම්බන්ධ කර ගනු ලබන පුහුණු වැඩසහන් සඳහා ඔවුන්ගේ සහාය නොලැබී යාමත් නිසාය. මේ හේතුවෙන් පුහුණු අංශයේ නිලධාරීන්ට පමණක් පුහුණු කටයුතු කරගෙන යාමට සිදු විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) අධ්‍යක්ෂ නිවාසයේ පදිංචිව සිටින නිලධාරී මහතාගෙන් මෙම වර්ෂයේ සිට දුරකථන ගාස්තු අය කිරීමට කටයුතු කර ඇත. නියෝජ්‍ය විගණකාධිපතිතුමා දැනුම් දුන් පරිදි නිල නිවාසය හිස් කර දෙන ලෙස අමාත්‍යාංශයට දැනුම් දීමට කටයුතු කර ඇත.

(ආ) 351 වෙනි පාලක මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

(ආ) මිලදී ගැනීමේදී දෙපාර්තමේන්තු ගත මුදලට වඩා අඩු මිලකට මිලදී ගැනීමට හැකිවීමත් මිලදී ගනු ලබන අවස්ථාවේදී අවශ්‍යතා සංශෝධනය වීමත් එම විචලනයට හේතු විය.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 ඡේදයට අනුව කටයුතු කරමින් මේ වන විට ලංසු විවෘත කිරීමේ කමිටුවට නිලධාරීන් තිදෙනෙකු පත්කිරීමට කටයුතු කර ඇත.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 ඡේදයට අනුව සේවා සපයන්නාගේ වසර 6ක පලපුරුද්ද තිබිය යුතුය යන කොන්දේසිය ලංසු කරුවෙකුගේ ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමට තරම් වන ප්‍රධාන බැහැරවීමක් ලෙස හඳුන්වා දී නොමැක. මෙම බැහැරවීමට අදාල කිසිදු විද්‍යාත්මක පදනමක් ද දක්වා නොමැත. එබැවින් අවම මිලට පරිසනක මිලදී ගැනීමට සුදුසු බව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබේ. එසේම මෙම සමාගමෙන් පරිසනක මිලදී ගෙන තිබූ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන්ද විමසා බලා දෝෂයක් වාර්තා නොවූ බැවින් මෙම මිලදී ගැනීම සිදුකරන ලදී.

මෙම පරිසනක සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී සේවා සැපයීමට අදාල ආයතනය වෙත දන්වා ඇති අතර ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු එම ආයතනය විසින් සිදුකර ඇත. තවද මෙම පරිසනක භාවිතයේදී මේ වනතෙක් කිසිදු දෝසයක් වාර්තා වී නොමැත.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 ඡේදයට අනුව ගණකාධිකාරී ඉල්ලා අස්වී ඇති අවස්ථාවක දී විකල්ප සාමාජිකයෙකු ලෙස සහකාර ගණකාධිකාරී ප්‍රසම්පාදන කටයුතුවලට සම්බන්ධ විය හැක. ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී වෙනත් නිළධාරියෙකු පත් කිරීමට කටයුතු කර ඇත.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

(අ) අපගේ ඉල්ලීම පරිදි රජය විසින් රු.325,000.00 දක්වා රේගු බදු අඩුකර ඇති අතර අපගේ ඉල්ලීම පරිදි ලෝක ආහාර සංවිධානය විසින් අදාල බදු මුදල් ගෙවා වාහනය අප වෙත පැවරීමට කටයුතු කරමින් සිටියදී රජය විසින් මෙම මුදල දසගුණයකින් වැඩිකර ඇත. එම මුදල ලෝක ආහාර සංවිධානය ගෙවීමට සිය දේශීය නියෝජිතයාට ඉදිරිපත් කර ඇත. එසේ නොවුව හොත් මෙම මුදල අප ආයතනය විසින් ගෙවා වාහනය පවරාගැනීමට කටයුතු කෙරේ.

(ආ) විදේශ විශ්වවිද්‍යාලයන්හි පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරූ ගිවිසුම කඩ කළ ශිෂ්‍යත්වලාභීන් 10 දෙනෙකුට එරෙහිව (1998 – 2008) වසරයන්හි නීතිමය කටයුතු ආරම්භ කර ඇත. මෙම ගිවිසුම කඩ කල ශිෂ්‍යත්වලාභීන් 10 දෙනාගේ ලැබීම් හා නීතිමය තත්ත්වය පහත පරිදි විග්‍රහ කළ හැකිය.

- ශිෂ්‍යත්වලාභීන් 04 දෙනෙකුගේ නඩු තීන්දු ආයතනයේ වාසියට තීන්දු වී ඇති අතර ඉන් එක් අයෙක් නීතිය ඉදිරියේ සම්මුතියකට එළඹ මේ වන විට ආයතනයට මුදල් ගෙවීම සිදු කරයි.ඉතිරි අය අභියාචනාධිකරණයේ පෙත්සම් ගොනු කොට ඇත.
- ශිෂ්‍යත්වලාභීන් 06 දෙනෙකුගේ වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීමෙන් අධිකරණයේ නඩු බහා ඇත.

මේ වන විට මෙම ශිෂ්‍යත්වලාභීන් 06 දෙනා සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

- ඇපකරුවන්ගෙන් අය විය යුතු මුදල් අය කර ගැනීම.
- ආගමන විගමන දෙපාර්තමේන්තුවට දැනුම් දීම.

- ලියාපදිංචිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් තොරතුරු ලබා ගැනීම.
- ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයට දැනුම් දීම. (වැඩි පිරිසක් එහි පදිංචි බවට තොරතුරු ලැබීම නිසා )
- රහස් පොලිසියට දැනුම් දීම.

මෙම තත්ත්වය මත වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි ශිෂ්‍යත්වලාභීන් 06 දෙනාගෙන් දැනට ඇපකරුවන්ගෙන් එකතු වන මුදල අඩු කලවිට රු.8,539,799.00 ක මුදලක් අය කර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ පවතී.

**5.4 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2015 වර්ෂයේ ගිණුම් සකස් කර විගණන කළමනාකරණ කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඔබ වෙත ඉදිරිපත් කිරීමේදී දින 35 ක ප්‍රමාදයක් සිදුවිය. ඉදිරියේදි නියමිත කාල වකවානු තුල ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

## 6. පද්ධති හා පාලනයන්

**(අ) මූල්‍ය පරිපාලනය**

මූල්‍ය පාලනය සම්බන්ධයෙන් නිසි පාලන ක්‍රම හඳුන්වා දී ඇති අතර ඒ අනුව කටයුතු කෙරේ.

**(ආ) පර්යේෂණ ව්‍යාපෘති**

පර්යේෂණ ව්‍යාපෘතීන් සැලසුම් කල ආකාරයටම ක්‍රියාත්මක කිරීමට හා ප්‍රමාදයකින් තොරව වාර්තා ප්‍රකාශයට පත් කිරීමට පාලන ක්‍රම ක්‍රියාත්මක වේ.

**(ඇ) වත්කම් පරිපාලනය**

වත්කම් මිලදී ගැනීම, නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පාලන ක්‍රම ක්‍රියාත්මක වේ.

**(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කෙරේ.

අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

පිටපත් - 01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
- 02. ලේකම්, මුදල් අමාත්‍යාංශය